1964 ස්වර්ණ ජයන්තිය 2014

# වසර 50 ක අභිමානය

1964 සිට

අපගේ අතීතයට

ගරු කරමු

අනාගතයට

පිවිසෙමු

**කෘෂිකර්ම අමාත්‍යාංශය**
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත මාවත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකාව.

දුරකථන අංකය: 011-2869553
ෆැක්ස් අංකය: 011-2868910
ඊමේල්: ituagrimin@gmail.com
වෙබ්: www.agrimin.lk

# සීමාසහිත
# ලංකා පොහොර සමාගම
# වාර්ෂික වාර්තාව
# 2014

**සීමාසහිත ලංකා පොහොර සමාගම**
ලක් පොහොර ස්වර්ණ ජයන්ති මාවත,
හුණුපිටිය, වත්තල,
ශ්‍රී ලංකාව.

දුරකථන අංකය : 011-2930298/99
ෆැක්ස් අංකය : 011-2947763
ඊමේල් : lakpohora@sltnet.lk
වෙබ් : www.lakpohora.lk

වාර්ෂික වාර්තා අනුකූලතා සම්මානය - 2013

ජාතික ඵලදායිතා සම්මානය - 2012/13




ජාතික ව්‍යාපාර විශිෂ්ඨතා සම්මානය - 2013

ජාතික තත්ත්ව කුසලතා සම්මානය - 2013

# පටුන


| | |
|---|---|
| සමාගම සමස්තයක් වශයෙන් | 06 |
| ආයතනික තොරතුරු | 07 |
| දැක්ම හා මෙහෙවර | 08 |
| මූල්‍ය අවධාරනයන් | 11 |
| 1964 - 2014 දක්වා සංවර්ධනය වැදගත් අවස්ථා | 12 |
| ස්වර්ණ ජයන්ති වර්ෂය | 14 |
| පසුගිය දස වසර තුළ මූල්‍ය අවධාරනයන් | 16 |
| සභාපතිවරයාගේ පණිවුඩය | 18 |
| සාමාන්‍යාධිකාරිවරයාගේ ප්‍රකාශනය | 20 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 22 |
| කළමනාකරණ කණ්ඩායම | 28 |
| කළමනාකරණ විමසුම හා විශ්ලේෂණය | 30 |
| ලක් පොහොර පවුල | 36 |
| අපගේ ප්‍රජාව | 41 |
| ආයතනික පාලනය | 46 |
| අපගේ භූගෝලීය ආවරණය | 51 |
| අවදානම් කළමනාකරණය | 52 |
| විගණන හා අවදානම් කළමනාකරණ කමිටු වාර්තා | 54 |
| මූල්‍ය ප්‍රකාශන | 57 |
| අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශනය | 59 |
| සභාපතිවරයාගේ හා මූල්‍ය කළමනාකරුගේ වගකීම් පිළිබඳ ප්‍රකාශනය | 60 |
| ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව | 61 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 62 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 63 |
| ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය | 64 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 65 |
| මූල්‍ය ප්‍රකාශන වලට සටහන් | 66 |
| පෙරකලාසි පත්‍රය | 90 |



## කුඹුරු සඳහා සෘජු පොහොර

යූරියා, පොටෑෂ් මියුරියේට්, ට්‍රිපල් සුපර් පොස්පේට්, ඇමෝනියා සල්පේට්, කීසරයිට්, සින්ක් සල්පේට්, යනාදි සෘජු පොහොර අප විසින් ඉදිරිපත් කරනු ලැබේ.



# සමාගම
# සමස්ථයක් වශයෙන්




රාජ්‍ය සංස්ථා හා රජය සතු වෙළඳ ව්‍යාපාර රාජ්‍ය සමාගම් බවට පරිවර්තනය කිරීමට අනුකූල වන පරිදි හා 1987 අංක 23 දරන පනතට අනුකූලව 1992 සැප්තැම්බර් 15 සිට බලපැවැත්වෙන පරිදි සීමාසහිත ලංකා පොහොර සමාගම නමින් මෙම සංස්ථාව යළි ස්ථාපිත කරන ලදී.

රජයේ සම්පූර්ණ අයිතිය සතු සමාගමක් වන සීමාසහිත ලංකා පොහොර සමාගම කෘෂිකර්ම අමාත්‍යාංශයේ විෂය පථය යටතට අයත් වේ. 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ 1964 වර්ෂයේදී ජර්මන් සමූහාණ්ඩුවේ මුල්‍ය හා තාක්ෂණික දායකත්වය සමඟ මෙම සමාගම ස්ථාපනය කරන ලදි.

රසායනික පොහොර ආනයනය කිරීම, ගුණාත්මක පොහොර මිශ්‍රණ නිෂ්පාදනය කිරීම, දිවයින පුරා ඇති ප්‍රාදේශීය ගබඩා ජාලය, බෙදාහරින්නන් හා බෙදාහැරීම් ජාලය මඟින් අලෙවි කිරීම හා බෙදාහැරීම හා එමගින් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රජාවගේ පොහොර අවශ්‍යතාවයන් ඉටු කිරීම සඳහා සීමාසහිත ලංකා පොහොර සමාගම කටයුතු කරයි.

රාජ්‍ය සංස්ථා හා රජය සතු වෙළඳ ව්‍යාපාර රාජ්‍ය සමාගම් බවට පරිවර්තනය කිරීමට අනුකූල වන පරිදි හා 1987 අංක 23 දරන පනතට අනුකූලව 1992 සැප්තැම්බර් 15 සිට බලපැවැත්වෙන පරිදි සීමාසහිත ලංකා පොහොර සමාගම නමින් මෙම සංස්ථාව යළි ස්ථාපිත කරන ලදි.

වර්තමානයේ එය 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇත.

2008 වර්ෂයේදී තමන්කඩුව කෘෂි පොහොර සමාගම මෙම සමාගම සමඟ ඒකාබද්ධ කරන ලද අතර එය සීමාසහිත ලංකා පොහොර සමාගමේ පොළොන්නරුව ගබඩා සංකීර්ණය ලෙස ක්‍රියාත්මක වේ.

# ආයතනික තොරතුරු

**සමාගමේ නාමය**
සීමාසහිත ලංකා පොහොර සමාගම

**නෛතික ස්වභාවය**
ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද හා භාණ්ඩාගාර ලේකම්ගේ සම්පූර්ණ අයිතිය සතු සීමිත වගකීම් සමාගමකි.

**සමාගමේ ලියාපදිංචි අංකය**
පීබී 499

**ලියාපදිංචි කරන ලද කාර්යාලය හා ලිපිනය**
ලක් පොහොර ස්වර්ණ ජයන්ති මාවත,
හුණුපිටිය, වත්තල, ශ්‍රී ලංකාව.
දුරකථන : 0112947764
ෆැක්ස් : 0112947763
ඊ මේල් : chairman@lakphora.lk
වෙබ් : www.lakphora.lk

## අධ්‍යක්ෂ මණ්ඩලය

**බුද්ධික මඩිහහේවා මහතා**
සභාපති
2008.02.18 - 2014.03.31

**සුදර්ශ ගනේගොඩ මහතා**
ක්‍රියාකාරී අධ්‍යක්ෂ
2010.05.12 - 2014.03.31

**ප්‍රේමසිරි අබේනායක මහතා**
ක්‍රියාකාරී අධ්‍යක්ෂ
2010.06.07 - 2014-03-31

**එච්.එම්. අජිත්චන්ද්‍ර මහතා**
(අතිරේක අධ්‍යක්ෂ ජනරාල්)
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ 2011.05.20 - 2014.03.31

**එන්.පී.රත්නායක මහතා**
අධ්‍යක්ෂ (සැලසුම්)
කෘෂිකර්ම අමාත්‍යාංශය
අධ්‍යක්ෂ 2013.04.10 - 2013.10.27

**ඒ.එල්.ඒ. අශෝක සිරිවර්ධන මහතා**
අතිරේක ලේකම් (පරිපාලන)
කෘෂිකර්ම අමාත්‍යාංශය
අධ්‍යක්ෂ 2013.10.28 - 2014.03.31

**නෙවිල් අබේරත්න මහතා**
(නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස්)
අධ්‍යක්ෂ 2010.06.07 - 2014.03.31

**ධම්මික දහනායක යාපා මහතා**
(නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස්)
අධ්‍යක්ෂ (2013.05.03 - 2014.03.31 )

**එස්.පී.මොරවක මහතා**
(නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස්)
සමාගමේ ලේකම්
2005.04.29 - 2014.03.31

## කළමනාකරණ කණ්ඩායම

| | |
|---|---|
| **ප්‍රදීප් යසරත්න මහතා** | සාමාන්‍යාධිකාරී |
| **බී.ඩී.එල්. කුමාරසිරි මහතා** | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| **ප්‍රියන්ත සමරවීර මහතා** | කළමනාකරු (මුදල්) |
| **එච්.එම්.ටී.පී. හේරත් මහත්මිය** | කළමනාකරු (පරිපාලන හා මානව සම්පත්) |
| **පී.එස්.කේ. ජයකොඩි මහතා** | කළමනාකරු (ප්‍රසම්පාදන හා ආනයන) |
| **ආර්.පී. සුරංගනී බෝධිපාල මහත්මිය** | කළමනාකරු (විකුණුම් හා අලෙවි) |
| **ආර්.ඒ.පී. පෙරේරා මහතා** | කළමනාකරු (බෙදාහැරීම්) |
| **ඩී.එම්.එන්.ඒ. දිසානායක මහතා** | කළමනාකරු (තාක්ෂණ) |



# දැක්ම

ශ්‍රී ලාංකික පොහොර වෙළඳපල නියමුවා ලෙස කෘෂි ක්ෂේත්‍රය හා ඒ ආශ්‍රිත නව නිපැයුම් සේවා හා යෙදවුම් සපයන විවිධාංගීකරණය වු නව ලොවට ගැලපෙන ප්‍රමුඛතම ආයතනය වීම.




# මෙහෙවර

රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව ලක් පොහොර පවුලේ උපරිම දායකත්වයෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම හා ගොවිජන සේවා ක්ෂේත්‍රයේ නිෂ්පාදන, ආදායම හා ලාභදායිත්වය වැඩි කිරීම සඳහා බහුවිධ වෙළඳපොළ ඉල්ලුමට සරිලන පොහොර නිෂ්පාදනය හා අලෙවිය තුළින් සමාගමේ ලාභදායී තිරසාර පැවැත්ම තහවුරු කිරීම.



## වෙනත් භෝග සඳහා

එළවළු, පළතුරු, අර්තාපල්, මිරිස්, කව්පි, රට කජු, මුං ඇට, සහ උක් වගාව ආදිය සඳහා විශේෂ මිශ්‍ර පොහොර අපි සපයන්නෙමු.



# මූල්‍ය අවධාරනයන්




| ආදායම් අවධාරනයන් හා අනුපාත | | 2014 | 2013 | වෙනස |
|---|---|---|---|---|
| | | Rs. | Rs. | % |
| ආදායම | රු. | 2,563,549,727 | 2,450,132,816 | 5% |
| බදු වලට පෙර ලාභය | රු. | 241,328,764 | 199,894,318 | 21% |
| ආදායම් බදු වියදම් | රු. | 62,869,313 | 73,037,738 | -14% |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම | රු. | 178,459,452 | 126,856,581 | 41% |
| ලාභාංශ | රු. | 52,930,556 | 38,056,974 | 39% |
| කොටසක ඉපැයුම | රු. | 3.55 | 2.52 | 41% |
| වත්කම් මත ප්‍රතිලාභ (ROA) | % | 0.49% | 0.48% | 2.2% |
| හිමිකම් මත ප්‍රතිලාභ (ROE) | % | 4.6% | 3.4% | 36% |
| **මූල්‍යම තත්ත්ව අවධානයන් හා අනුපාත** | | | | |
| මූල්‍ය වත්කම් | රු. | 36,266,731,183 | 26,451,828,626 | 37% |
| මුළු හිමිකම් | රු. | 3,838,543,092 | 3,736,071,170 | 3% |
| නිකුත් කළ කොටස් සංඛ්‍යාව | සංඛ්‍යාව | *50,245,608* | *50,245,608* | - |
| කොටසකට ශුද්ධ වත්කම් | රු. | 76.38 | 74.36 | 3% |

# සංවර්ධනයේ වැදගත් අවස්ථා

## 1964 සිට 2014








**1964**

පොහොර ආනයනය, නිෂ්පාදනය හා බෙදාහැරීම සඳහා රාජ්‍ය සංස්ථාවක් ලෙස පිහිටුවන ලදි.

**1966**

පැයකට මෙට්රික් ටොන් 35 ක් වු සැකසුම් පිරියත සහිතව හුණුපිටිය මධ්‍යම ගබඩාවේ මෙහෙයුම් ආරම්භ කරන ලදි.



**1969**

තේ, රබර්, පොල් ඇතුළු වෙනත් භෝග සඳහා පොහොර හඳුන්වා දෙන ලදි.

**1970**

"ලංකා පොහොර" සන්නම් නාමය හඳුන්වා දෙන ලදි.




**1978**

වැලිගම, පොළොන්නරුව හා අනුරාධපුරයේ ප්‍රාදේශීය ගබඩා ස්ථාපනය කරන ලදි.

**1980**

විශේෂ ප්‍රවර්ධන හා වෙළඳපොළ කටයුතු ආරම්භ කරන ලදි.



**1992**



සීමිත වගකීම් සමාගමකට පරිවර්තනය කර ස්වාධීන මෙහෙයුම් ආරම්භ කරන ලදි.

**1994**

සහනාධාර මිලට පොහොර සැපයීමේ ජාතික වැඩ සටහනට දායක වන ලදි.



**2005**




මහින්ද චින්තන ප්‍රතිපත්තිය යටතේ දිවයින පුරා සිටින වී ගොවීන් සඳහා ද සහනාධාර පොහොර බෙදා දෙන ලදි.

**2008**

නව පරිච්ඡේදයක් ආරම්භ කරන ලදි.




**2010**
**2011**



- ගෙවතු වගා සඳහා ග්‍රෑම් 500 පොහොර පැකට් (මිනි පැක්) හඳුන්වා දෙන ලදි.
- මහා භාණ්ඩාගාරය විසින් ''සී'' ශ්‍රේණියේ සිට "බී" ශ්‍රේණිය දක්වා ශ්‍රේණිගත කරන ලදි.
- බදු පසු ලාභය රු.මිලියන 73 ක් උපයන ලදි.
- අනුකූලතාව සඳහා ISO 9001 : 2008 සහතිකය ප්‍රදානය කරන ලදි.
- විශාල පරිමාණයේ නිෂ්පාදන වර්ගීකරණය යටතේ ජාතික ඵලදායීතා සම්මානය දිනා ගන්නා ලදි.

**2012**
**2013**

- සමාගමේ රසායනාගාරය සඳහා ISO/ IEC/ 17025 : 2005 සහතිකය
- අනුකූලතා තක්සේරුව පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් ප්‍රතීතන සහතිකය
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් 2012/2013 වාර්ෂික වාර්තාව සඳහා අනුකූලතා සම්මානය ප්‍රදානය කිරීම.
- විශාල පරිමාණයේ නිෂ්පාදන සඳහා කුසලතා සම්මානය - ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය විසින් ප්‍රදානය කරන ලද රාජ්‍ය අංශයේ වර්ගීකරණය යටතේ ජාතික ව්‍යාපාර විශිෂ්ටතා සම්මානය 2013
- විශාල පරිමාණයේ නිෂ්පාදන වර්ගීකරණය යටතේ කුසලතා සම්මානය ජාතික තත්ත්ව සම්මානය 2013

# ස්වර්ණ ජයන්ති වර්ෂය






අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ අනුග්‍රහය යටතේ සමාගමේ ස්වර්ණ ජයන්තිය සනිටුහන් කිරීම සඳහා මුද්දරයක් සහ මුල් දින කවරයක් නිකුත් කිරීම



ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා, කෘෂිකර්ම අමාත්‍ය ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා සහ කෘෂිකර්ම නියෝජ්‍ය අමාත්‍ය ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමාගේ සහභාගීත්වයෙන් සමාගමේ අංග සම්පූර්ණ මධ්‍යගත නව රසායනාගාරය විවෘත කරන ලදි.







සමාගම විසින් මගීන්ගේ පහසුව සඳහා කාර්යාල පරිශ්‍රය ඉදිරිපස බස් නැවතුම් පොළක් සාදවන ලද අතර ඉදිරිපස මාර්ගය ලක් පොහොර ස්වර්ණ ජයන්ති මාවත ලෙස නම් කරන ලදි.





හොඳම ප්‍රාදේශීය පොහොර ගබඩා 5 තෝරා ගැනීමේ වැඩ සටහන






"ලක් පොහොර තරුව" තෝරා ගැනීමේ වැඩ සටහන

# පසුගිය දස වසර තුළ මූල්‍ය අවධාරනයන්

| | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ශ්‍රී.ල.ගි.පු | ශ්‍රී.ල.ගි.පු | ශ්‍රී.ල.ගි.පු | ශ්‍රී.ල.ගි.පු | ශ්‍රී.ල.ගි.පු | ශ්‍රී.ල.ගි.පු | ශ්‍රී.ල.මු.වා.පු | ශ්‍රී.ල.මු.වා.පු | ශ්‍රී.ල.මු.වා.පු | ශ්‍රී.ල.මු.වා.පු |
| | | | | (මාස 7ක් සඳහා) | (මාස 8ක් සඳහා) | | | | | |
| **විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය** | | | | | | | | | | |
| ආදායම | 2,008,121,747 | 1,738,890,120 | 1,597,921,714 | 900,461,713 | 1,370,080,315 | 1,904,299,851 | 2,246,402,738 | 2,496,268,383 | 2,450,132,816 | 2,563,549,727 |
| දළ ලාභය | 225,039,530 | 123,581,353 | 236,228,785 | 204,414,682 | 221,286,371 | 322,826,103 | 414,124,001 | 310,189,751 | 621,684,097 | 575,467,461 |
| වෙනත් ආදායම් | 110,500,407 | 166,406,012 | 146,931,059 | 76,899,044 | 130,892,642 | 132,287,779 | 157,164,017 | 197,912,757 | 108,809,998 | 93,172,755 |
| බදු පෙර ලාභය | 46,977,085 | 20,738,590 | 3,599,741 | 26,957,610 | 35,088,271 | 42,411,705 | 73,979,009 | 159,544,495 | 199,894,319 | 241,328,764 |
| බදු | (28,131,616) | (10,762,878) | (13,771,790) | (19,766,392) | (25,092,763) | (35,000,000) | (43,666,668) | (52,315,944) | (73,037,738) | (62,869,313) |
| බදු පසු ලාභය | 18,845,469 | 9,975,712 | (10,172,049) | 7,191,217 | 9,995,508 | 7,411,705 | 30,312,341 | 107,228,551 | 126,856,581 | 178,459,452 |
| **මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය** | | | | | | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 444,456,080 | 444,456,080 | 444,456,080 | 444,456,080 | 502,456,080 | 502,456,080 | 502,456,080 | 502,456,080 | 502,456,080 | 502,456,080 |
| ප්‍රත්‍යාගණන සංචිත | 76,939,154 | 1,616,307,519 | 1,616,307,519 | 1,616,307,519 | 1,616,307,519 | 1,986,087,280 | 1,986,087,280 | 1,836,179,780 | 1,835,723,580 | 1,835,723,580 |
| ආදායම් සංචිත | 184,394,619 | 194,370,332 | 184,198,282 | 191,389,499 | 201,385,007 | 208,796,713 | 224,109,054 | 1,285,578,730 | 1,397,891,510 | 1,500,363,432 |
| මුළු හිමිකම් | 705,789,853 | 2,255,133,931 | 2,244,961,881 | 2,252,153,098 | 2,320,148,607 | 2,697,340,072 | 2,712,652,414 | 3,624,214,590 | 3,736,071,170 | 3,838,543,092 |
| දේපල, පිරියත හා උපකරණ | 98,704,757 | 1,638,495,136 | 1,647,477,060 | 1,642,814,214 | 1,686,442,553 | 1,902,075,430 | 1,895,412,152 | 1,908,557,760 | 1,882,887,059 | 1,879,174,306 |
| නොනිමි ප්‍රාග්ධන වැඩ | 17,895,434 | 17,895,434 | 17,895,434 | 17,895,434 | 20,024,735 | 15,934,103 | 542,901 | - | - | - |
| විලම්බිත බදු වියදම | - | - | - | - | - | - | - | 4,862,949 | 73,037,738 | 5,561,375 |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය | 94,059,906 | 113,633,853 | 132,782,037 | 146,109,366 | 172,614,796 | 332,205,456 | 434,767,955 | 471,025,753 | 338,620,163 | 369,088,140 |
| අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - | - | - | - | - | 669,017 | 344,717 |
| විලම්බිත බදු වත්කම් | - | - | - | - | - | - | 76,814,523 | 71,951,574 | - | - |
| ශුද්ධ ජංගම වත්කම් | 600,326,344 | 600,912,136 | 582,772,763 | 592,829,041 | 610,949,150 | 12,476,640,540 | 6,975,143,544 | 1,706,541,296 | 1,915,693,141 | 2,025,842,182 |
| විලම්බිත බදු බැරකම් | - | - | - | - | - | - | - | - | 1,086,164 | 6,647,539 |
| කෙටි/ දිගුකාලීන ණය | - | - | - | - | - | 11,837,929,928 | 5,369,929,928 | - | - | 20,646,483,768 |
| **මුදල් ප්‍රවාහ ප්‍රකාශනය** | | | | | | | | | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | (1,409,015,721) | (4,487,339,145) | (5,537,840,553) | (9,812,750,171) | (23,925,719) | (12,169,047,254) | (16,012,155,140) | 12,695,227,509 | (9,517,159,808) | (5,094,105,859) |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | 1,584,272,550 | 4,509,295,472 | 5,347,791,109 | 9,796,712,574 | (85,865,511) | 12,216,587,459 | (36,565,665) | (8,458,411) | 83,232,936 | (498,105,232) |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | (6,287,476) | (30,008,448) | (40,493,187) | (19,176,247) | 46,739,763 | (159,725,222) | 16,168,483,382 | (13,079,312,780) | 9,575,483,282 | 5,654,013,585 |
| **වෙනත් තොරතුරු** | | | | | | | | | | |
| කොටසක ඉපැයුම (රු.) | 1.06 | 0.22 | (0.23) | 0.16 | 0.22 | 0.17 | 0.60 | 2.13 | 2.52 | 3.55 |
| කොටසකට ලාභාංශය (රු.) | - | - | - | - | 0.06 | 0.06 | 0.18 | 0.18 | 0.76 | 1.05 |
| කොටසකට ශුද්ධ වත්කම් (රු.) | 16 | 51 | 51 | 51 | 46 | 54 | 54 | 72 | 74 | 76 |
| ජංගම අනුපාතය (වාර ගණන) | 1.30 | 1.17 | 1.10 | 1.07 | 1.04 | 2.09 | 1.29 | 1.08 | 1.08 | 1.06 |



## පොල් සඳහා

වයි.පී.එම්.(ඊ.ආර්.පී.) (ඩබ්ලිව්) වයි.පී.එම්. (ටී.එස්.පී.)(ඩී), ඒ.පී.එම්. (ඊ.ආර්.පී.)(ඩබ්ලිව්), ඒ.පී.එම්. (ටී.එස්.පී.) (ඩී) රා මැදීම (ඩබ්ලිව්), රා මැදීම (ඩී) යනාදී විශේෂ පොහොර අප සපයන්නෙමු.







# සභාපතිවරයාගේ පණිවුඩය

2013/14 වර්ෂය සීමාසහිත ලංකා පොහොර සමාගමේ සිහිවටන වර්ෂයයි. පසුගිය වර්ෂ 5 ක කාලයක් තුළ ඵලදායී ව්‍යාපාර ආදර්ශයක් මඟින් ලාභදායී සමාගමක් බවට ලංකා පොහොර සමාගම පත්වීමේ ස්ථිර සාර මහත් විප්ලවය අපි දුටුවෙමු. වසර 50 ක සිට ජාතියේ කෘෂිකාර්මික ප්‍රජාවට අවශ්‍යතා සපයන අතරම මෙම වර්ධනයේ ස්ථායී මාර්ග ගොඩනගමින් ජාතික පොහොර සමාගම එහි ස්වර්ණ ජයන්තිය පවත්වයි. 2013/14 වර්ෂය මෙහෙයුම් ප්‍රගතිය මෙන්ම මූල්‍යමය ප්‍රගතිය අතින්ද ඉතා ඉහළම වර්ෂය බවට පත්වී ඇත.

ඉපැරණි කාලයේ සිටම ශ්‍රී ලාංකික ජනතාව කෘෂිකාර්මික ජනතාවක් ලෙස ප්‍රකටය. 1948 නිදහස ලැබීමේ දින සිට අද දක්වා බලයට පත් සාර්ථක රජයන් මඟින් ශ්‍රී ලංකාව කෘෂිකාර්මික ආර්ථිකයක් සහිත රටක් ලෙස සංවර්ධනය කිරීමට පියවර ගෙන ඇත. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අභිලාෂය සහිතව රටේ කෘෂිකාර්මික ප්‍රජාව සඳහා එකම පොහොර ආනයනකරු, නිෂ්පාදක, අලෙවිකරු හා බෙදාහරින්නා වශයෙන් 1964 වර්ෂයේදී ලංකා පොහොර සංස්ථාව ස්ථාපනය කරන ලදී. එතැන් පටන් ලංකා පොහොර සංස්ථාව ජාතියේ කෘෂිකාර්මික ප්‍රජාව සඳහාම විය.
පසුගිය වර්ෂ 50 තුළ සමාගමේ ප්‍රධානත්වය දැරූ දුර දක්නා නායකයන්ගේ මඟ පෙන්වීම, ශක්තිමත් කළමනාකරණ කණ්ඩායම හා පක්ෂපාතී සේවා නියුක්තිකයන් මත ජාතික සංවර්ධනයේ ප්‍රධාන ස්තම්භයක් ලෙස පවත්වා ගෙනයාමට අපහට පහසුකම් සැලසුනි.

2007/08 වර්ෂයේදී ලංකා පොහොර සමාගමේ ලාභදායී නොවූ තත්ත්වයෙහි ප්‍රතිඵලයක් ලෙස අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් 2008 පෙබරවාරි 18 දින සීමාසහිත ලංකා පොහොර සමාගමේ සභාපතිවරයා වශයෙන් මා පත්කිරීමෙන් පසු අග්‍ර ස්ථානයක් කරා ගමන් කිරීමට හැකි වූ උපාය මාර්ගික සැලසුම්කරණය හා විශාල වෙනස්කම් ක්‍රියාත්මක කිරීම සහ කැපවුණු කණ්ඩායම් කටයුතු මඟින් විශාල ජයග්‍රහණයන් රාශියක් අත්කර ගැනීමට හැකි විය.

2008/2009 වර්ෂය තුළදී සීමාසහිත ලංකා පොහොර සමාගමේ ශුද්ධ වත්කම් රු.මිලියන 2,320 ක් වූ අතර එය 2013/2014 වර්ෂය තුළදී රු.මිලියන 3,839 දක්වා වැඩිවිය.

දීර්ඝ කාලීන උපායමාර්ගයන් පිළිබඳ ශික්ෂණය භාවිතය මඟින් 2008/2009 වර්ෂයේදී රු.මිලියන 35 ක් වූ සමාගමේ බදු පෙර ලාභය 2013/14 වර්ෂයේදී රු.මිලියන 241 දක්වා ඉහළ නංවා ඇති අතර එය ආයතන ඉතිහාසයේ ඉහළම ලාභය විය. මෙයට පෙර ඉහළම බදු පෙර ලාභය වූ රු.මිලියන 199 ක් වාර්තා කරන ලද්දේ 2012/2013 වර්ෂයේදීය.

අද රු.බිලියන 36 ක් වූ මුළු වත්කම් සහිත ශක්තිමත් ශේෂ පත්‍රයක් ලංකා පොහොර සමාගම සතුව පවතී. අපගේ එකම කොටස් හිමිකරු වන මහා භාණ්ඩාගාරය සඳහා අප විසින් නිර්මිත සුවිශේෂී අගය පිළිබඳ මම අභිමානී වෙමි.

**අද රු.බිලියන 36 ක් වූ වත්කම් සහිත ශක්තිමත් ශේෂ පත්‍රයක් ලංකා පොහොර සමාගම සතුව පවතී. අපගේ එකම කොටස් හිමිකරු වන මහා භාණ්ඩාගාරය සඳහා අප විසින් නිර්මිත සුවිශේෂී අගය පිළිබඳ මම අභිමානී වෙමි. 2008 වර්ෂයේ සිට අප ප්‍රගමන ලාභාංශ ප්‍රතිපත්තියකට කැපවුණු අතර මෙම වර්ෂයේදී රු.මිලියන 53 ක අවසාන ලාභාංශයක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා කරන ලදි. ඒ අනුව රු.මිලියන 38 ක් 2012/13 වර්ෂයේදී ලාභාංශ ලෙස ගෙවා ඇත.**

2008 වර්ෂයේ සිට අප ප්‍රගමන ලාභාංශ ප්‍රතිපත්තියකට කැපවුණු අතර මෙම වර්ෂයේදී රු.මිලියන 53 ක අවසාන ලාභාංශයක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා කරන ලදි. ඒ අනුව රු.මිලියන 38 ක් 2012/13 වර්ෂයේදී ලාභාංශ ලෙස ගෙවා ඇත.

එසේම, 2013/2014 වර්ෂය තුළදී රජයට බදු වශයෙන් රු.මිලියන 63 ක් ගෙවන ලදි. ලංකා පොහොර සමාගමට එහි මෙහෙයුම් සඳහා මේ තාක් කිසිදු මූල්‍ය සහායක් රජයේ ඒකාබද්ධ අරමුදලින් ලබාගෙන නොමැත. කළමනාකරණයේ මූලික අවධාරණය, නොසෙල්වෙන ඉහළ තැනක් හා සත්‍ය තත්ත්ව වර්ධනයක් සපුරා ගැනීම සඳහා ලක් පොහොර ධාරිතාවයේ විශ්වාසය මත ගොඩනැගීම විය. කාර්ය සාධනයේ ගුණාත්මක තත්ත්වයෙහි විශිෂ්ට වෙනස්කමක් සහිතව ව්‍යාපාරයේ සියළු අංශ ඇගයීම් කර වෙනස් කරන ලදි.

2011 - 2015 දක්වා සංයුක්ත සැලැස්ම විධිමත්ව සකස් කරන ලද අතර 2013 - 2015 ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කර පසුවිපරම් කාර්යයන් සිදුකරන ලදි.

රටේ මුල් බැසගත් සමහර සමාජයීය හා පාරිසරික අභියෝගයන් සඳහා විසඳුම් සංවර්ධනය කිරීමට හා සමාජයට පුළුල් ප්‍රතිලාභ ලබාදීම සඳහා අපගේ ව්‍යාපාර උපාය මාර්ග වේගවත් කිරීම සඳහා වූ ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීමට අපට හැකිවන බව මම විශ්වාස කරමි.

අප විසින් ලබාගත් ISO 9001 : 2008 ජාත්‍යන්තර ප්‍රමිත සහතිකය, ISO/ IEC 17025 : 2005 - ලංකා පොහොර සමාගමේ රසායනාගාරයේ රසායනික පරීක්ෂණ සඳහා ප්‍රතීතනය, ශ්‍රී ලංකා ජාතික තත්ත්ව විශිෂ්ටතා සම්මානය, ජාතික ව්‍යාපාර විශිෂ්ටතා කුසලතා සම්මානය, ජාතික ඵලදායිතා සම්මානය, වාර්ෂික වාර්තා අනුකූලතා සම්මානය මෙම කාලපරිච්ඡේදයේ ලංකා පොහොර සමාගමේ සාර්ථක කතාන්තරයට සහායවන බෙහෝ සාක්ෂි සපයයි.

ලක් පොහොර පවුලේ සියළු සාමාජිකයන් නිපුණ, අභිප්‍රේරණ හා සංවිධානයේ උරුමය පිළිබඳ අභිමානී හා එහි අනාගතය පිළිබඳ අපේක්ෂා සහිත වේ. සමාගමේ දක්ෂතා ගොඩනැගීම සඳහා වන පිරිවැය කැපකරමින් සමාගමේ අනාගත වර්ධනයට බාධාවන පරිදි විශාල පිරිවැය ව්‍යුහයක් අප විසින් පවත්වා නොගන්නා ලදි. මෑත වර්ෂ තුළදී තරුණ සේවකයන් පුහුණු කිරීම හා අපගේ පළපුරුදු සේවකයන්ගේ කුසලතා යළිත් වර්ධනය කිරීමට සමාගම ආයෝජනයන් කරන ලදි. අපගේ මෙම ආයතනයට ඉතා ලැදි සේවකයන් සඳහා දීර්ඝ කාලීන ප්‍රතිලාභයක් ලෙස මෙම වගකීම අඛණ්ඩව ඉදිරියට ගෙන යනු ලැබේ.

අපගේ ව්‍යාපාරයේ හදවත ලෙස ලක් පොහොර පවුල නිරන්තරයෙන් කටයුතු කරයි. අපගේ අතීත, වර්තමාන හා අනාගත සාර්ථකත්වය සම්පූර්ණයෙන්ම ඔවුන් වෙත රඳා පවතී. ලක් පොහොර පවුලේ කැපවීම වෙනුවෙන් ඔවුන් වෙත මාගේ ස්තූතිය පිරිනැමේ.

පසු ගිය වර්ෂ පහ තුළදී අපගේ ව්‍යාපාරයේ සියළු අංශයන් තුළ තිරසාර වර්ධනය සඳහා හා සංවර්ධනය කරන ලද ඵලදායී ව්‍යාපාර ආදර්ශයක් මත ගොඩනැගීම දැක ගන්නට ලැබුණි. ඊළඟ වර්ෂ 50 සඳහා අභියෝගයන්ට අපගේ සූදානම්වීම සඳහා නිවැරදි කාර්ය රාමුවක් වර්ෂ 5 ක මෙම ඵලදායී ව්‍යාපාර ආදර්ශයෙන් සපයන බව අපි විශ්වාස කරමු.

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට, කෘෂිකර්ම අමාත්‍යතුමාට හා රේඛීය අමාත්‍යාංශවල හිටපු අමාත්‍යවරුන්ට, ජනාධිපති ලේකම්තුමාට, භාණ්ඩාගාර ලේකම්තුමාට හා අපගේ සාර්ථකත්වයට උපරිම සහයෝගය ලබාදුන් සියළුම රජයේ නිලධාරීන්ට මාගේ හෘදයාංගම කෘතඥතාවය ප්‍රකාශ කරමි. 2013/2014 වර්ෂය සාර්ථක වර්ෂයක් බවට පත් කළ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට හා කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයන්ට මාගේ කෘතඥතා පූර්වක ස්තූතිය පළ කරමි.

අපගේ ආයතනය කෙරෙහි උනන්දුවක් දක්වන සියලු පාර්ශ්වයන් වෙත තිරසාර ප්‍රතිලාභ අඛණ්ඩව ලබාදෙන බවට අපගේ විශ්වාසය පවතී

**බුද්ධික මඩිහගේවා**
සභාපති



# සාමාන්‍යාධිකාරීවරයාගේ ප්‍රකාශනය

කෘෂිකාර්මික ව්‍යාපාරය ඒකාබද්ධ කිරීම සඳහා වූ යෝජනාව පිළිබඳ 2014 වර්ෂය සඳහා මෙහෙයවීම ලංකා පොහොර සමාගම විසින් ඉදිරිපත් කරන ලද අතර අපගේම උපාය මාර්ග යන් ස්ථාපනය කිරීමෙන් තීරණාත්මක ක්‍රියාවලියකට අපි පිවිස ඇත්තෙමු. මේ සම්බන්ධයෙන් ආයතනයේ දිගු කාලීන උපාය මාර්ග සමඟ ගැලපීම තහවුරු වන පරිදි ඉදිරිපත් කරන ලද වර්ධන අවස්ථාවන් අප විසින් ඇගයීම් කෙරේ.

වර්තමානයේ "මහින්ද චින්තන ප්‍රතිපත්තියට" අනුකූල වන පරිදි සහනාධාර මිලකට පොහොර සැපයීම සඳහා ජාතික වැඩ සටහන සම්බන්ධයෙන් ප්‍රධාන ආයතනය වන්නේ ලංකා පොහොර සමාගමයි. පුද්ගලික අංශයේ සමාගම් සමඟ තරග වදිමින් වෙළඳපොලේ විශාල අයිතියක් ලංකා පොහොර සමාගම සතු කර ගෙන ඇත.

ලෝකයේ වෙනත් රටවල් විසින් මුහුණ දෙන විවිධ ගැටළු හා අභියෝග කේන්ද්‍ර කර ගනිමින් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ සීඝ්‍ර සංවර්ධනය මෑතකදී සිදුකරන ලද හිතකර ආර්ථික වර්ධනයන්ට සාපේක්ෂව ශ්‍රී ලංකාව ප්‍රධාන කාර්යභාර්යක් සිදුකරයි. රටේ සාමකාමී වාතාවරණය ඇති කරලීමෙන් පසු හැකි සෑම ඉඩම් ප්‍රමාණයක්ම වගා කරන ලදි. වසර 30 ක කාලයක් පැවති බිහිසුණු යුද්ධය අවසානවීමත් සමඟ උතුරු සහ නැගෙනහිර පළාත්වල කෘෂිකාර්මික කටයුතු වල වේගවත් පුනරුදයක් ඇති විය. එහි ප්‍රතිඵලයක් ලෙස කෘෂිකාර්මික අංශය තුළ ඉහළ මෙහෙයුම් ශක්තියක් ඇති විය. මෙම මෙහෙයුම් ශක්තිය සඳහා අවශ්‍ය බලය වුයේ පොහොර වන අතර සහනාධාර මිලකට පොහොර නිකුත් කිරීම සඳහා ගන්නා ලද රජයේ තීරණය කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා ගන්නා ලද සැලකිය යුතු පියවරක් විය. මෙම වැදගත් අවස්ථාවේදී සමස්ත කෘෂි ප්‍රජාවගේ සමෘද්ධිය ඉහළ දැමීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීම සඳහා රජයේ පරිශ්‍රමය උදෙසා දායක වීමටද ලංකා පොහොර සමාගමට හැකි විය.

## බෙදාහැරීම් ජාලය

2009 වර්ෂයෙන් පසු උතුරු සහ නැගෙනහිර පළාත්වල නව ප්‍රාදේශීය ගබඩා ස්ථාපිත කරන ලද අතර සාමයෙන් පසුව ඉහත පළාත්වල හසුකරගත් වෙළඳපොළට සැපයීමේ අරමුණු සහිතව තොග නිලධාරීන් හා අලෙවි විධායකයින් පත් කරන ලදි. ලංකා පොහොර සමාගම විසින් ගොවිජන සේවා මධ්‍යස්ථාන 376 කට සැපයීමට ක්‍රමයෙන් එහි ගබඩා ධාරිතාවය වැඩිකරන ලද අතර කුඹුරු ගොවීන්ට සැපයීමට හා වෙනත් භෝග පොහොර පිළිබඳ වෙළඳ පොළ අවශ්‍යතා වලට සැපයීමට දිවයිනපුරා බලයලත් බෙදාහරින්නන් දහසකට වැඩි ප්‍රමාණයක් පත් කරන ලදි. දීප ව්‍යාප්ත බෙදාහැරීම් ජාලය ප්‍රාදේශීය පොහොර ගබඩා 52 කින් සමන්විත වේ. නව වෙළඳපොළට පිවිසීමට, නව ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීමට පවත්නා ගනුදෙනුකරුවන් සමඟ සම්බන්ධතාවන් ව්‍යාප්ත කර ගැනීමේ අවස්ථා සැපයීම හඳුනාගෙන හා නවෝත්පාදන නිෂ්පාදන ඉදිරිපත් කෙරේ.

## අලෙවිකරණය

වෙළඳපොළහි විශාල අයිතියක් අත්කර ගැනීම සඳහා අවශ්‍ය කුසලතා පිරි උපාය මාර්ගික මෙහෙයුම් දියත් කිරීමට ලංකා පොහොර සමාග මට හැකි වු අතර එහි ප්‍රතිඵලයක් ලෙස වෙළඳපොලෙහි විකුණුම් පරිමාව පිළිබඳ ආයතනයේ අයිතිය වේගයෙන් ව්‍යාප්ත කරන ලදි. මෙම තරඟකාරී වාසිදායකත්වය අනුව විකුණුම් සපුරා ගැනීම හේතුවෙන් ආයතනයේ ආදායම හා ලාභය වැඩිවිය.

''ලක් පොහොර'' ශක්තිමත් වෙළඳ නාමය යටතේ එහි නිෂ්පාදන විකිණීම මඟින් ලංකා පොහොර සමාගම කාලයක් ලබාගත් සාර්ථක ප්‍රතිරූපය හා ප්‍රසිද්ධිය තරඟකරුවන් අතර විශිෂ්ටත්වයට පත්ව තිබේ. එබැවින් දීප ව්‍යාප්ත වගාකරුවන්ගේ සිත් තුළ ලංකා පොහොර සමාගම හොඳම පොහොර සපයන්නා ලෙස පිළිගැනීමට පත්ව ඇත. වෙළඳනාමයේ පිළිබිඹුව මඟින් දේශීය වෙළඳපොළේ ලංකා පොහොර සමාග මේ නිෂ්පාදන ශක්තිමත් කරන අතර, විශේෂයෙන් නාගරික ප්‍රදේශවල ගෙවතු වගා සඳහා ''කුඩා පොහොර පැකට්'' විකිණීමේ නව වෙළඳපොළ උපායමාර්ගයක් අරඹා ඇත.

ගනුදෙනකරු සන්තෘප්තිමත් කරන සමීක්ෂණ මාලාවක් සිදුකරන ලදි. ඉකුත් කාල පරිච්ජේදයෙන් ලබාගත් සන්සන්දනාත්මක වෙළඳපොළ දත්ත අධ්‍යයනය කර හඳුනාගන්නා අතර තරගකරුවන්ගේ හැසිරීම් රටාව අඛණ්ඩව නිරීක්ෂණය කරනු ලැබේ. වෙළඳපොළ අයිතිය පිළිබඳ ප්‍රධාන සංරචකය අත්කර ගැනීමට අත්‍යවශ්‍ය උපායමාර්ගික මෙහෙයුම් ක්‍රියාවලිය දියත් කිරීමට ලංකා පොහොර සමාග මට හැකි විය.



වර්තමානයේ ''මහින්ද චින්තන ප්‍රතිපත්තියට'' අනුකූල වන පරිදි සහනාධාර මිලකට පොහොර සැපයීම සඳහා ජාතික වැඩ සටහන සම්බන්ධයෙන් ප්‍රධාන ආයතනය වන්නේ ලංකා පොහොර සමාගමයි. පුද්ගලික අංශයේ සමාගම් සමඟ තරඟ වදිමින් වෙළඳපොලේ විශාල අයිතියක් ලංකා පොහොර සමාගම සතු කර ගෙන ඇත.

**මානව සම්පත් සංවර්ධනය**

මෙම වර්ෂයේ අපගේ කාර්ය සාධනයේ මූලික වැඩ කොටස වූ මානව කේන්ද්‍රගත ඵලදායිතාවයේ අඛණ්ඩ වැඩිවීමත් සමඟ ලංකා පොහොර සමාගම ධාරිතා වර්ධනය කේන්ද්‍ර කර ඇත.

ලංකා පොහොර සමාගමේ කෙටිකාලීන හා දිගු කාලීන අරමුණු සාර්ථක කර ගැනීම සඳහා මානව සම්පත් සැලසුම්කරණය ඵලදායී විය. සේවකයන් පිළිබඳ විය හැකි බලපෑම් සහ කාර්ය බලකායේ දක්ෂතා හා ධාරිතා අවශ්‍යතාවය වැඩිකර ගැනීමට අවශ්‍ය වැදගත් වෙනස්කම් ක්‍රියාකාරී සැලැස්මෙන් යොමු කෙරුණි.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරන ලද බඳවා ගැනීම් හා උසස්වීම් යෝජනා ක්‍රමය සමාගමට සලසන ලද වටිනා සේවය සලකමින් සියළු සේවකයන්ගේ සුදුසුකම් මත උසස්වීම් මෙන්ම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ මඟින් ශ්‍රේණි තුළ උසස්වීම්ද ලබාදෙනු ලැබේ. පුහුණු වැඩ සටහන් මඟින් දැනුම ලබා ගැනීමට නිරතුරුවම සේවකයන් දිරිමත් කරනු ලැබේ. සේවකයන්ගේ නවෝත්පාදන අදහස් නිරතුරුව සලකනු ලබන අතර නව්‍යකරණයන් ක්‍රියාත්මක කරනු ලැබේ. පුද්ගලික කාර්ය සාධනය පදනම් කරගත් ප්‍රදානයන් ලබාදෙන ක්‍රමයන් හඳුන්වාදෙන ලදි.

තරුණ උපාධි අපේක්ෂකයින්ට ඔවුන්ගේ ජීවන ක්‍රමය සංවර්ධනය කර ගැනීම සඳහා ආධුනිකයන් ලෙස සම්බන්ධවීමට හා පළපුරුදු කළමනාකාරිත්ව කාර්ය මණ්ඩලයක අධීක්ෂණය යටතේ ඔවුන්ගේ පුහුණු අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමටද අවස්ථා සලසා දෙනු ලැබේ. ඔවුන්ගේ සුදුසුකම් සම්පූර්ණ වූ පසු පුරප්පාඩු පවතින විට ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ස්ථිර කාර්ය මණ්ඩලයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. මෙම සංකල්පයෙන් තරුණයන්ගේ දැනුම ආයතනයට ලබාදෙන අතරම ආධුනිකයින්ට තම අධ්‍යාපනික ප්‍රායෝගික අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ගැනීමටද අවස්ථාව සැලසේ.

**QMS සහතිකය**

රාජ්‍ය ව්‍යවසායක් සඳහා වූ වැදගත්ම ඉටුකර ගැනීමක් වන ගුණාත්මක සේවා හා පරිපාලන කටයුතු සඳහා ISO 9001 : 2008 ජාත්‍යන්තර ප්‍රමිත සහතිකය ලංකා පොහොර සමාගම වෙත ලැබී ඇත.

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් ISO 17025 : 2005 සහතිකය සඳහා ප්‍රතීතනය කරන ලද ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වූ පවත්නා පොහොර විශ්ලේෂණ රසායනාගාරය ආයතනය විසින් මෑතකදී සංවර්ධනය කරන ලදි. පොහොර ආදර්ශයන් පරීක්ෂා කර ගැනීමට අවශ්‍යවන අභ්‍යන්තර හා බාහිර ගනුදෙනුකරුවන්ට ප්‍රතිලාභී වන මෙම රසායනාගාරය සඳහා නවීන උපකරණ ලබාගැනීමට ආයතනය කටයුතු කරමින් සිටී.

සමාගම විසින් මෙම වර්ෂයේදී රීති හා රෙගුලාසිවලට අනුකූල වෙමින් ISO 14001 : 2004 සහතිකය ලබාගැනීම සඳහා සූදානම් වෙමින් සිටින අතර පාරිසරික කටයුතු වලට අදාළ බොහෝ ව්‍යාපෘති සඳහා කටයුතු කරමින් සිටියි.

**තොරතුරු තාක්ෂණය**

ලංකා පොහොර සමාගම විසින් නව තාක්ෂණය මත භාවිතා කරන්නන් සඳහා වැඩිදියුණු කරන ලද නවීන මෘදුකාංග සවිකර ගැනීමෙන් හා පුහුණු වැඩ සටහන් සංවිධානය කිරීමෙන් ඉහළ කාර්ය සාධනයක් සහිත පරිගණක උපයෝජනය මඟින් පහසු භාවිතයට සැකසූ මෘදුකාංග හා දෘඩාංග භාවිතා කරනු ලැබේ.

ආයතනයේ කාර්යයන් සම්බන්ධයෙන් තොරතුරු ලබාගැනීම සඳහා භාවිතා කරන්නන්ට හැකිවන පරිදි අපගේ වෙබ් අඩවිය www.lakphora.lk යළි ආරම්භ කරන ලදි.

**ආයතනික සමාජ වගකීම**

ලංකා පොහොර සමාගම විසින් ප්‍රජාවට නිරතුරුව සහාය වනවා මෙන්ම සමාජමය වගකීමක් ලෙසද සලකයි. ආයතනික සමාජ වගකීම සැලසුම් කිරීම, කළමනාකරණය කිරීම හා ක්‍රියාත්මක කරවීම සඳහා එකිනෙක කටයුතු සිදුකෙරෙන කණ්ඩායමක් පත් කර ඇත.

ප්‍රධාන දක්ෂකම් හා අනාගතය සඳහා සැලසුම් සංවර්ධනය කිරීම් සඳහා දිගු කාලීන ආයතනික තිරසාරත්වය අවශ්‍ය බව විශ්වාස කරමින් දිගු කාලීන හා කෙටිකාලීන උපාය මාර්ගික අරමුණු වර්ගීකරණය කරන ලද අතර ඒ අනුව උපාය මාර්ගික සැකැස්ම සංවර්ධනය කරන ලදි.

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රජාවගේ සංවර්ධනය සඳහා අවස්ථාවන් සහිත අභියෝගාත්මක වර්ෂය 2015 වන බවට අපි අපේක්ෂා කරමු. සංවර්ධනය සඳහා වූ නව අවස්ථාවන් අත්කර ගැනීමට ප්‍රවීන හා ශක්තිමත් කණ්ඩායම වගකීම දරයි.

සංවර්ධනය පිළිබඳ නව යුගයක් කරා අපට මඟ පෙන්වීමට, ඵලදායිතාවය හා ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීමට පූර්ව වර්ෂයන් පුරාම දෙනු ලැබූ නායකත්වය, දැක්ම හා උපාමාර්ගික යොමු කිරීම වෙනුවෙන් සභාපතිතුමාට හා අධ්‍යක්ෂ මණ්ඩලයට මම ස්තූතිවන්ත වෙමි. එසේම අපගේ දැක්ම සපුරා ගැනීම කෙරෙහි දක්වන අඛණ්ඩ වගකීම වෙනුවෙන් ''ලක් පොහොර පවුලේ'' සියළු සාමාජිකයන්ට මාගේ ස්තූතිය පුද කිරීමට කැමැත්තෙමි.

සංවර්ධනයේ විශ්වාසවන්තම හවුල්කරු ලෙස සැලකෙන අපගේ ප්‍රධාන ගනුදෙනුකරුවන් වූ දිවයින පුරා වගාකරුවන් අපගේ සාර්ථකත්වය පිටුපස සිටින ශක්තිය වන අතර ඔවුන්ගේ අවශ්‍යතා සඳහා ප්‍රතිචාර දැක්විය යුතු අප එකට සංවර්ධනය වන ලෙස වූ අපගේ පොරොන්දුව යළි ශක්තිමත් කරන්නෙමු.



**ප්‍රදීප් යසරත්න**
සාමාන්‍යාධිකාරී

# BOD අධ්‍යක්ෂ මණ්ඩලය

**සුදර්ශ ගණේගොඩ මහතා**
ක්‍රියාකාරී අධ්‍යක්ෂ





**බුද්ධික මඩිහහේවා මහතා**
සභාපති



**ප්‍රේමසිරි අබේනායක මහතා**
ක්‍රියාකාරී අධ්‍යක්ෂ

**ධම්මික දහනායක යාපා මහතා**
අධ්‍යක්ෂ





**එච්.එම්. අජිත් චන්ද්‍ර මහතා**
අධ්‍යක්ෂ



**නෙවිල් අබේරත්න මහතා**
අධ්‍යක්ෂ



**ඒ.එල්.ඒ. අශෝක සිරිවර්ධන මහතා**
අධ්‍යක්ෂ

''ලක්පොහොර අඛණ්ඩ උරුමයක
පාර්ශවකරුවන් වීම අපගේ අභිමානයයි''

# අධ්‍යක්ෂ මණ්ඩලය





## බුද්ධික මඩිහහේවා මහතා
සභාපති

2008 පෙබරවාරි මාසයේදී සීමාසහිත ලංකා පොහොර සමාගමේ සභාපතිවරයා වශයෙන් පත්වීම් ලද  බුද්ධික මඩිහහේවා මහතා මේ දක්වා එම තනතුරේ කටයුතු කරයි. වර්තමානයේ ඔහු ස්වර්ණකැළුම් සමාගම් සමූහයේ කළමනාකරණ අධ්‍යක්ෂවරයා/ ප්‍රධාන විධායක නිලධාරීවරයාද වේ.

සභාපතිවරයා වශයෙන් මඩිහහේවා මහතා වර්ෂ 6 කට වැඩි කාලයක් ලංකා පොහොර සමාගමේ නායකත්වය දරමින් සහ ප්‍රතිපත්ති සකස් කිරීමේ ක්‍රියාවලියෙහි නිරත වෙමින් පරිවර්තනාත්මක හා මහජනතාව කේන්ද්‍ර කර ගත් නායකත්වයක් සඳහා වගකීම් දරයි.

පුද්ගලික අංශ ව්‍යාපාර කළමනාකරණයේ වසර 22 ක අත් දැකීම් සම්භාරයක් ඔහු සතුව පවතී. පුද්ගලික අංශයේ සාර්ථක ව්‍යාපාර කළමනාකරණයේ අත් දැකීම් හා විශේෂඥ දැනුම අත් කර ගැනීමෙන් සියළු මට්ටමේ සේවකයන්ට ලංකා පොහොර  සමාගම ප්‍රියමනාප ස්ථානයක් බවට පත් කිරීම සඳහා සේවක අන්තර් සම්බන්ධතාවය, තාක්ෂණය, නිර්මාණශීලීත්වය හා වෘත්තීය නිපුණතාවය ප්‍රකාරව ලංකා පොහොර සමාගමේ නායකයා ලෙස මඟපෙන්වීම් ලබාදීමේ කාර්යයේ නියැලී සිටී.

කොළඹ රාජකීය විද්‍යාලයේ අධ්‍යාපනය ලබා ඇති මඩිහහේවා මහතා දැනට ඔස්ට්‍රේලියන් ඉන්ස්ටිටියුට් ඔෆ් බිස්නස්හි MBA උපාධිය හදාරමින් සිටි.

## සුදර්ශ ගණේගොඩ මහතා
ක්‍රියාකාරි අධ්‍යක්ෂ

බටහිර ඔස්ට්‍රේලියාවේ ඊඩිත් කෝවන් විශ්ව විද්‍යාලයේ විද්‍යා. උපාධිධරයකු වන (පරිගණක මාදුකාංග ඉංජිනේරු) සුදර්ශ ගණේගොඩ මහතා සීමාසහිත ලංකා පොහොර සමාගමේ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයකු ලෙස 2010 මැයි මාසයේදී පත්කරනු ලැබ ඇත.





## ප්‍රේමසිරි අබේනායක මහතා
ක්‍රියාකාරි  අධ්‍යක්ෂ

ප්‍රේමසිරි අබේනායක මහතා සීමාසහිත ලංකා පොහොර සමාගමේ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයකු ලෙස 2010 වර්ෂයේදී පත්කරන ලදි. ව්‍යවසායකයකු වශයෙන් ග්‍රාමීය ප්‍රජාව වෙනුවෙන් සේවය කරමින් විශේෂයෙන් දකුණු පළාතේ කෘෂිකාර්මික අංශයට සහාය සලසමින් හා විවිධ යෝජනා ක්‍රමවලට ප්‍රතිලාභ ලබාදෙමින් කටයුතු කරයි.

## එච්.එම්. අජිත් චන්ද්‍ර
අධ්‍යක්ෂ

එච්.එම්. අජිත්චන්ද්‍ර මහතා ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ වසර 30 ක් වු දිගු කාලීන සේවයක් සහිතව කටයුතු කරයි. ඔහුගේ සේවා කාලය තුළ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ හා රජයේ ඇපෙක්ස් පුහුණු ආයතනය ශ්‍රී  ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ගණකාධිකාරිවරයකු ලෙසද ලෝක බැංකුවේ හා ආසියානු සංවර්ධන බැංකුවේ සහ විදේශ මුල්‍යයන ව්‍යාපෘතිවල ව්‍යාපෘති ගණකාධිකාරි හා මුල්‍ය කළමනාකරු ලෙසද රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මුල්‍ය හා පරිපාලන අධ්‍යක්ෂවරයා ලෙසද, ප්‍රධාන අමාත්‍යාංශවල ප්‍රධාන ගණකාධිකාරිවරයා ලෙසද, ආදායම් අධ්‍යක්ෂ, විදේශාධාර කළමනාකරණ අධ්‍යක්ෂ හා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ විදේශාධාර කළමනාකරණය, රාජ්‍ය ණය, මුදල් හා පරිපාලන අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන්ද රාජ්‍ය මුල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රය සඳහා විශාල දායකත්වයක් ඒ මහතා විසින් ලබාදෙන ලදි.

දෙපාර්තමේන්තු සේවයට පමණක් සීමා නොවී සාගර විශ්ව විද්‍යාලයේ හා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ තනතුරුද දරා ඇත. 2012 වර්ෂයේදී ලංකා පොහොර සමාගමේ අධ්‍යක්ෂවරයකු වශයෙන් පත්වු ඒ මහතා එහි සාර්ථකත්වයට නොමඳ සේවයක්  ඉටුකරන ලදි.
පසුගිය වර්ෂ කිහිපය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපතිත්වය දරමින් සමාගමේ ගිණුම්, ණය රැස්කර ගැනීම සහ සමස්ත කාර්ය සාධනය සම්බන්ධයෙන් සමාගමේ පැවති විශාල ගැටළුවලට විසඳුම් ලබාදීමට ඔහුට හැකි විය. එසේම ඔහු ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ අධ්‍යක්ෂ තනතුරක්ද හොබවයි.

ඔහු ශ්‍රී  ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වාණිජවේදී (විශේෂ) උපාධිය හා කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය සහ ව්‍යාපාර පරිපාලන උපාධිය (MBA) ලබා ඇත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරිවරයකු වන අතර ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ අධි සාමාජිකත්වයද හා ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වයද ලබා ඇති අතර සිංගප්පූරු සිවිල් සේවා විද්‍යාලයේ ප්‍රධාන පුහුණුකරු ලෙසද කටයුතු කරයි.

# අධ්‍යක්ෂ මණ්ඩලය





## නෙවිල් අබේරත්න මහතා

අධ්‍යක්ෂ

නෙවිල් අබේරත්න මහතා වෘත්තියෙන් නීතිඥවරයෙකි. 1984 වර්ෂයේදී ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරයකු ලෙස පත් වන ලදි. ඔහු අධිකරණ වෛද්‍ය විද්‍යාව හා විද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (වෛද්‍ය පීඨය, කොළඹ) බුද්ධිමය දේපල නීතිය පිළිබඳ පශ්චාත් නීති ඩිප්ලෝමාව (ශ්‍රී ලංකා නීති විද්‍යාලය) ජාත්‍යන්තර වෙළඳ නීතිය පිළිබඳ පශ්චාත් නීති ඩිප්ලෝමාව (ශ්‍රී ලංකා නීති විද්‍යාලය) සහ  වාණිජ විනිශ්චය පිළිබඳ ඩිප්ලෝමාව (වාණිජ නීතිය හා පරිචයන් සංවර්ධනය සඳහා ආයතනය) ලබා ඇත. වර්ෂ 30ක් නීති වෘත්තියෙහි ක්‍රියාකාරීව යෙදෙන ඒ මහතා ශ්‍රී  ලංකා නීති විද්‍යාලයේ හා මහනුවර ජාතික සෙමනේරියේ බාහිර දේශකවරයකු වශයෙන්ද කටයුතු කරයි. කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ නීතිඥ සංගමයේ හිටපු සභාපති වන ඔහු ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ විධායක කමිටුවේ සාමාජිකත්වයද කැළණිය විශ්ව විද්‍යාලයේ විශ්ව විද්‍යාල පාලක සභාවේ සාමාජිකත්වයද දරයි.

## ධම්මික දහනායක යාපා මහතා

අධ්‍යක්ෂ

වෘත්තියෙන් නීතිඥවරයෙක් වන ධම්මික දහනායක යාපා මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ නීති උපාධියක් දරන අතර කොළඹ නීති සංගමයේ සාමාජිකයකුද වේ. ඔහු වර්ෂ 31ක කාලයක් ක්‍රියාකාරි නීතිවේදියෙකු වශයෙන් කටයුතු කර ඇත. රාජ්‍ය කැනීම් හා ඛනිජ සංවර්ධන සංස්ථාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක හා මූල්‍ය කළමනාකරු ලෙස ඔහු සේවය කර ඇත.





## ඒ.එල්.ඒ. අශෝක සිරිවර්ධන මහතා
අධ්‍යක්ෂ

ඒ.එල්.ඒ.අශෝක සිරිවර්ධන මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ වසර 23 ක අත් දැකීම් සපුරා ඇත. ඔහු කැළණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව හා කලා පශ්චාත් උපාධියක් (MA) ලබා ඇති අතර ඒ මහතා කොළඹ විශ්ව විද්‍යාලයෙන් බලය විමධ්‍යගත කිරීම හා පළාත් පාලන අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධියක්ද ලබා ඇත.

නාගරික සංවර්ධන හා ජල සම්පාදන අමාත්‍යාංශයේ ප්‍රාදේශීය අධ්‍යක්ෂවරයකු ලෙසද, එසේම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ප්‍රාදේශීය ලේකම්වරයකු, සීමාසහිත ලංකා පොහොර සමාගමේ සාමාන්‍යාධිකාරි, කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සැලසුම්/ ඉඩම්) රුහුණු සංචාරක කාර්යාංශයේ කළමනාකරණ අධ්‍යක්ෂ, ගාල්ල මහනගර සභාවේ නාගරික කොමසාරිස්, දකුණු පළාත් පරිවාස දෙපාර්තමේන්තුවේ පරිවාස කොමසාරිස්, දකුණු පළාත් නිවාස දෙපාර්තමේන්තුවේ නිවාස කොමසාරිස්, දකුණු පළාත් තැපැල් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පෝස්ට් මාස්ටර් ජනරාල්, ධීවර, සංස්කෘතික කටයුතු, ආහාර සැපයුම් හා බෙදාහැරීම්, වෙළඳ හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ (දකුණු පළාත) ලේකම්වරයා ලෙසද ඒ මහතා සේවය කර ඇත. ඔහු HARTI, SL SEA, EDB Helpo සංවිධානවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස මෙන්ම ශ්‍රී ලංකා නෙදර්ලන්ත විද්‍යාර්ථීන්ගේ සංගමයේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ පාරිසරික සභාවේ සාමාජිකයකු ලෙසද කටයුතු කරමින් සිටි.
දැනට ඒ.එල්.ඒ. අශෝක සිරිවර්ධන මහතා කෘෂිකර්ම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වශයෙන් සේවය කරයි.

## එස්.පී.මොරවක මහතා
සමාගමේ ලේකම්

නීතිවේදියෙක් වන එස්.පී.මොරවක මහතා ප්‍රංශය, ජර්මනිය හා ස්විට්සර්ලන්තයේ බුද්ධිමය දේපල නීතිය පිළිබඳ පුහුණුවී හිටපු සමාගම් රෙජිස්ට්‍රාර් වශයෙන් කටයුතු කර ඇත. පසුගිය වසර 10 තුළම ඒ මහතා සීමාසහිත ලංකා පොහොර සමාගමේ සමාගම් ලේකම් වශයෙන් සේවය කරමින් සිටී.

# කළමනාකරණ කණ්ඩායම









### ප්‍රදීප් යසරත්න මහතා

සමාගමේ සාමාන්‍යාධිකාරිවරයා වන ඒ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කලා උපාධිය (ගෞරව) (විශේෂ) සහ කැළණිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රාපති උපාධිය ලබා ඇත.  එසේම ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, වෘත්තීය සංවර්ධනය පිළිබඳ සහතිකය (AIT තායිලන්තය) සාමාන්‍ය කළමනාකරණය පිළිබඳ උසස් සහතිකය, මානව කේන්ද්‍රගත ඵලදායිතාවය පිළිබඳ සහතිකය (ඉන්දුනීසියාව) නායකත්ව හා සංවිධාන කළමනාකරණය පිළිබඳ සහතිකය (ඉන්ටාන් - මැලේසියාව) සහ වෙනස්වීම් කළමනාකරණය පිළිබඳ සහතිකය (ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය - එක්සත් රාජධානිය) ලබා ඇත. ඔහු හිටපු ප්‍රාදේශීය ලේකම්වරයකු (රත්මලාන හා හෝමාගම) අධ්‍යක්ෂ, මාධ්‍ය (සමෘද්ධි අධිකාරිය) සහ සහකාර ලේකම්වරයකුද (වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය) වේ.

### ලාල් කුමාරසිරි මහතා

සමාගමේ ප්‍රධාන අභ්‍යන්තර විගණක වන ඒ මහතා කැළණිය විශ්ව විද්‍යාලයේ වාණිජවේදී (විශේෂ) උපාධිය ලබා ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය මුල්‍ය ගණකාධිකාරී සංගමයේ අධි සාමාජිකත්වයද හා රාජ්‍ය මුල්‍ය  සංවර්ධන ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වයද දරයි. එසේම  රාජ්‍ය ගිණුම් හා මුල්‍ය ආයතනයෙන් සහ අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයෙන් අභ්‍යන්තර විගණනය පිළිබඳ සහතික ලබා ඇත. ඔහු ජාතික උපකරණ හා යන්ත්‍රෝපකරණ ආයතනයේ හිටපු ගණකාධිකාරී හා ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාද වේ.

### ප්‍රියන්ත සමරවීර මහතා

සමාගමේ මූල්‍ය කළමනාකරු වන ප්‍රියන්ත සමරවීර මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වාණිජවේදී (විශේෂ) උපාධිය ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා රාජ්‍ය මුල්‍ය හා සංවර්ධන ගණකාධිකාරී ආයතනයේ, වරලත් ව්‍යාපාර පරිපාලකයන්ගේ ආයතනයේ, ශ්‍රී ලංකා රාජ්‍ය මුල්‍ය ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ අධි සාමාජිකත්වය දරන අතර ශ්‍රී ලංකා ගණකාධිකාරී ශිල්පීය ආයතනයේ ආශ්‍රිත සාමාජිකයත්වයද දරයි. 1987 වර්ෂයේදී සමාග මට බැඳුණු  ඒ මහතා සමාගමේ ජ්‍යෙෂ්ඨතම කළමනාකාරවරයාද වේ.

### තරංගා හේරත් මහත්මිය

තරංගා හේරත් මහත්මිය සමාගමේ මානව සම්පත් කළමනාකාරිණිය වන අතර ඇය සාමාන්‍ය කලාවේදී උපාධිය (කැළණිය විශ්ව විද්‍යාලය) හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය (කැළණිය විශ්ව විද්‍යාලය) ලබා ඇත. එසේම මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (කැළණිය විශ්ව විද්‍යාලය) සහ වෙනස්වීම් කළමනාකරණය පිළිබඳ සහතිකය (ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය - එක්සත් රාජධානිය) ලබා ඇත. ඇය රත්මලාන හිටපු සහකාර ප්‍රාදේශීය ලේකම් වන අතර වන ජීවී අමාත්‍යාංශයේ හිටපු සහකාර ලේකම්වරියකද වේ.






## ඉංජිනේරු, කුමාර ජයකොඩි මහතා

සමාගමේ ප්‍රසම්පාදන හා ආනයන කළමනාකරු වන කුමාර ජයකොඩි මහතා පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් BSC ඉංජිනේරු උපාධියක් ලබා ඇති අතර රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්ද  ලබා ඇත. විදුලි සංදේශ ඉංජිනේරු සහ මාර්ග ඉදිකිරීම් පිළිබඳ පළපුරුද්දක්ද ලබා ඇත.

## සුරංගනී බෝධිපාල මහත්මිය

සමාගමේ විකුණුම් හා අලෙවි කළමනාකාරිණිය වන සුරංගනී බෝධිපාල මහත්මිය කෘෂිකර්මය පිළිබඳ විද්‍යා  උපාධිය (වැවිලි කළමනාකරණය (විශේෂ) - සබරගමුව විශ්ව විද්‍යාලය) සහ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය (පේරාදෙණිය විශ්ව විද්‍යාලය) ලබා ඇත. විශේෂයෙන් තේ අංශයේ වැවිලි කර්මාන්ත කළමනාකරණය පිළිබඳ පළපුරුද්දක් ඇත.

## ප්‍රියන්ත පෙරේරා මහතා

සමාගමේ බෙදාහැරීම් කළමනාකරු වන ඒ මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ කලා උපාධිධරයෙකි. (සමාජ විද්‍යාව - විශේෂ) වෘත්තීය පුහුණු අධිකාරියේ කළමනාකරණ ඩිප්ලෝමාවක් හා පිරිස් කළමනාකරණය පිළිබඳ ආයතනයෙන් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ සහතිකයක්ද ලබා ඇත. ගිනි හා ආරක්ෂණ, කාර්මික සෞඛ්‍ය හා ආරක්ෂණය සහ යන්ත්‍රෝපකරණ හා උපකරණ නඩත්තුව පිළිබඳ ක්ෂේත්‍රවල විශේෂඥ වෘත්තීය මට්ටමක් දරයි.

## ඉංජිනේරු අරුණසිරි දිසානායක මහතා

සමාගමේ කාර්මික කළමනාකරු වන ඒ මහතා විද්‍යා ඉංජිනේරු උපාධිය (විශේෂ) (පේරාදෙණිය විශ්ව විද්‍යාලය) සහ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය (මූල්‍ය) (කැළණිය විශ්ව විද්‍යාලය) ලබා ඇත. ශ්‍රී  ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ සාමාජිකයකු වන ඔහු එම ආයතනයේ ගොඩනැගිලි සේවා ඉංජිනේරු අංශ කමිටුවේ සාමාජිකයකුද වේ.



# කළමනාකරණ විමසුම සහ විශ්ලේෂණය

## ව්‍යාපාර සමාලෝචනය

2012 වර්ෂයේදී සියයට 6.3 ක් ලෙස වාර්තා කරන ලද දළ දේශීය නිෂ්පාදිතය 2013 වර්ෂයේදී සියයට 7.3 ක් ලෙස ශ්‍රී ලංකා ආර්ථිකයට ලද ඉහළ වර්ධන ගම්‍යතාවය වාර්තා කරන ලදි. ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන ප්‍රතිෂ්ඨාව ලෙස මෙම වර්ධනයට කෘෂිකර්ම අංශයේ දායකත්වය සමාලෝචිත වර්ෂයේදී සියයට 4.7 ක වර්ධනයක් වාර්තා කරන ලද අතර දළ දේශීය නිෂ්පාදිතයට සියයට 10.8 ක කොටසකින් හා රැකියා නියුක්තියට සියයට 30 ක කොටසකින් දායක විය. මෙම වර්ධනයට රබර් සහ පොල් හැර අනිකුත් සියළුම උප අංශයන් ධනාත්මකව දායකත්වය සපයන ලද අතර වී වගා හා තේ අංශයන් ඉහළම දායකත්වයක් වාර්තා කරන ලදි.

සහල් නිෂ්පාදනයේ සියයට 20 ක වර්ධනයක් වාර්තා කරමින් රටේ මුළු සහල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 4.62 ක් විය. 2013 වර්ෂයේ තේ නිෂ්පාදනය 2013 වර්ෂයේ සෑම විටම ඉහළම නිෂ්පාදනයට ළඟාවන ලදි. වෙනත් ක්ෂේත්‍ර භෝග මුළු නිෂ්පාදනය (OFCS) සියයට 3.4 කින් මෙට්‍රික් ටොන් 968,246 දක්වා 2013 වර්ෂයේදී වැඩිවූ අතර කුරුඳු, ගම්මිරිස්, කරාබු නැටි, කොකෝවා, සාදික්කා, බුලත් හා කජු ඇතුළත් සුළු අපනයන භෝගද වර්ධනයක් වාර්තා කරන ලදි. එළවළු නිෂ්පාදනය සියයට 15 කින් මෙට්‍රික් ටොන් 1,091,491 දක්වා වැඩිවී තිබුණි.

ජාතික පොහොර සහනාධාර යෝජනා ක්‍රමය, 2013 වර්ෂයේදී රු.බිලියන 40 ක මුළු සහනාධාර පිරිවැයකට පොහොර මෙට්‍රික් ටොන් 759,512 ක් බෙදාහරිමින් කෘෂිකර්ම අංශයේ වර්ධනය සඳහා දායකත්වය සපයන ලදි. ආනයනය කරන ලද පොහොර සියයට 50 කට වැඩි ප්‍රමාණයක් පුළුල් ලෙස වී වගාව සඳහා පරිභෝජනය කරන ලදි. මුළු මහත් වී වගා අංශය සඳහා සීමාසහිත ලංකා පොහොර සමාගම සහ සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම යන රාජ්‍ය සමාගම් දෙක විසින් පොහොර සපයන ලදි.

වී වගා පොහොර අංශයේ සියයට 65 කට සීමාසහිත ලංකා පොහොර සමාගම පොහොර සපයනු ලැබේ. රසායනික පොහොර භාවිතය විකල්ප මට්ටමකින් පවත්වාගෙන යාමට හා කාබනික පොහොර භාවිතය සඳහා දිරිමත් කිරීමට 2012 වර්ෂයේදී ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලදි.

2011 වර්ෂයේදී වෙනත් භෝග සඳහා ජාතික පොහොර සහනාධාර වැඩ සටහන ව්‍යාප්ත කිරීමත් සමඟ රාජ්‍ය සමාගම් වෙනත් භෝග අංශ සඳහා ඔවුන්ගේ වෙළඳපොළ පුළුල් කිරීමෙන් පසු ඉකුත් වර්ෂ පහ පුරා වෙනත් භෝග අංශ සැලකිය යුතු වර්ධනයක් වාර්තාකර තිබුණි.

2011 සිට 2013 වර්ෂ තුළ වෙනත් භෝග අංශයට රාජ්‍ය සමාගම්වල දායකත්වය සියයට 10 ක් විය. දීප ව්‍යාප්තව පෞද්ගලික අංශය මඟින් පොහොර බෙදාහැරීමේදී වන අඩුපාඩු බැහැර කිරීම සඳහා උපාය මාර්ගයක් වශයෙන් රාජ්‍ය සමාගම්වල වෙළඳපොළ දායකත්වය සියයට 40 දක්වා වැඩි කිරීමට ශ්‍රී ලංකා රජය විසින් 2014 වර්ෂයේදී ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලදි.

**වී වගා අංශය සඳහා වෙළඳපොළදායකය**




**වෙනත් වගා අංශය සඳහා වෙළඳපොළදායකය**



## ආයතනික සමාලෝචනය

### රටේ වී සහ වෙනත් භෝග සඳහා පොහොර සපයන රාජ්‍ය අංශයේ ප්‍රධාන ආනයනකරු, මිශ්‍රණකරු හා තොග වෙළඳකරු ලංකා පොහොර සමාගමයි.

ශ්‍රී ලංකා රජයේ සම්පූර්ණ අයිතිය සතු සමාගමක් වශයෙන් අපගේ මූලික අරමුණ රටේ කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය සඳහා සම්පූර්ණයෙන්ම සහායවීමයි. අප ගොවීන්ට පොහොර සැපයීම සිදුකිරීමට නොව දැරිය හැකි මිලකට ගුණාත්මක පොහොර සැපයීම අපගේ අරමුණ වේ.

අපගේ ඇසුරුම් ද්‍රව්‍ය වල මුද්‍රණය කර ඇති නව නිල්පාට ඉර අපගේ නිෂ්පාදනවල ගුණාත්මක තත්ත්වය නිරූපණය කරයි.

ලංකා පොහොර සමාගම විසින් රටට ආනයනය කරන එක් එක් පොහොර නෞභාරයක නියැළියක් තත්ත්ව පරීක්ෂාව සඳහා  කාර්මික තාක්‍ෂණ ආයතනය වෙත යවනු ලැබේ. අපගේ ගබඩාවල සිට බෙදුම්කරුවන්ගේ රාක්ක වලට පැමිණෙන එක් එක් භාරදුන් බඩුවල නියැළියක් ශ්‍රී  ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් (SLAB) ප්‍රතීතනය කරන ලද හා ISO/ IEC/ 17025: 2005 සහතික කරන ලද අපගේම රසායනාගාරයේ පරීක්ෂා කරනු ලැබේ.

හුණුපිටිය පිහිටි අපගේ මධ්‍යම ගබඩා සංකීර්ණය මෙට්‍රික් ටොන් 75,000 ක ධාරිතාවයක් සහිත විශාල ගබඩාවලින් සහ විවිධ භෝග වලට සුදුසු වන පරිදි විවිධ මිශ්‍රණයන් සැපයීම සඳහා වු මිශ්‍රණ යන්ත්‍ර වලින් සමන්විත වන අතර පොළොන්නරුව පිහිටි ප්‍රධාන ප්‍රාදේශීය ගබඩා සංකීර්ණය මෙට්‍රික් ටොන් 22,000 ක ගබඩා ධාරිතාවයකින් සමන්විත වේ. දීප ව්‍යාප්ත ප්‍රාදේශීය ගබඩා සංකීර්ණවල මෙට්‍රික් ටොන් 148,000 ක ගබඩා ධාරිතාවයක් අප සතු වේ.

ප්‍රධාන කාර්යාලය සඳහා එස්-5 සංකල්පය හඳුන්වාදීම සමඟ සමාගමේ කාර්ය මණ්ඩල ඵලදායීතාවය ඉහළ ගොස් ඇති අතර ISO - 9001: 2008 තත්ත්ව කළමනාකරණ පද්ධති සහතිකය කාර්යාලය වෙනුවෙන් ලැබී ඇත.

වී වගා අංශයට පොහොර සැපයීම පුමණකට සීමා නොවෙමින් අප විසින් වගාකරුවන් සඳහා නවෝත්පාදන, අගය එකතු කළ හා ගුණාත්මක පොහොර අඛණ්ඩව හඳුන්වා දෙනු ලැබේ. ගොවින් සඳහා ඵලදාව උපරිම කර ගැනීම සඳහා විවිධ භෝග වලට හා පසේ තත්ත්වයන් සඳහා වන විවිධ ඉල්ලුම් වලට සුදුසුවන පරිදි විවිධ පොහොර මිශ්‍රණයන් විධිමත්ව සකස් කෙරෙන රසායනාගාර පරීක්ෂණ අපගේ අංග සම්පූර්ණ රසායනාගාරයේ ක්‍රමවත්ව සිදු කෙරේ. වර්තමානයේ තේ, පොල්, රබර්, එළවළු, පළතුරු වෙනත් ක්ෂේත්‍රවල භෝග ඇතුළත් විවිධ භෝගයන් සඳහා විශේෂිත පොහොර සපයනු ලැබේ.

**2014 වර්ෂයේදී භෝග අනුව විකුණුම්**




රටේ මුල් බැසගත් පාරිසරික හා සමාජමය ගැටළු වටහා ගනිමින්, ''ලක් පොහොර'' සන්නම් නාමය යටතේ නව කාබනික පොහොර මිශ්‍රණයක් හදුන්වාදීමට පියවර ගන්නා ලදි. මෙම නව නිෂ්පාදන සැප්තැම්බර් මැද භාගයේදී වෙළඳපොළට නිකුත් කරනු ලැබේ.

වෙළඳ වගාවන්හි සිට කුඩා ගෙවතු දක්වා වු අනුග්‍රාහක පිරිසගේ විවිධ අවශ්‍යතාවලට මුහුණදීම සඳහා විවිධ ඇසුරුම් ප්‍රමාණයන්ගෙන් අපගේ පොහොර නිෂ්පාදන ලබාගැනීමට හැකි වේ. උතුරු නැගෙනහිර පළාත්වල අළුතෙන් නිදහස් වු ඉඩම්වල ගොවීන්ට පොහොර සඳහා ප්‍රවේශ වීමෙන් පොහොර භාවිතය වැඩිකිරීමේ අවස්ථා ලබාගැනීමේ ප්‍රයත්නය සඳහා සමාගම විසින් මෑතදී නව පොහොර ඇසුරුම්වල දෙමළ පරිවර්තනයද හඳුන්වා දෙන ලදි.




වැඩ මුළු හා කුඩා රැස්වීම් පැවැත්වීමෙන් අපගේ අනුග්‍රාහක පිරිස සඳහා අවශ්‍ය උපදෙස් හා සහාය නොකඩවා අප විසින් ලබා දෙනු ලැබේ. වර්ෂය තුළ වෙළඳපොළ ප්‍රමුඛයකු වශයෙන් එම තත්ත්වය පවත්වා ගැනීමේදී විවිධ භෝග අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි දිවයින පුරා විකුණුම් හා බෙදාහැරීම් ජාලය සංවර්ධනය කර ගැනීම සඳහා වෙළඳ නාමය අපට මහත් අනුග්‍රහයක් විය.

# මූල්‍ය සමාලෝචනය

## ආදායම

වී හා වෙනත් භෝග සඳහා පොහොර විකුණුම්වලින් සමාගම 2013/14 මුදල් වර්ෂය තුළ රු.බිලියන 2.6 ක ආදායමක් වාර්තා කර තිබුණි. එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 5 ක වැඩිවීමකි.

ආදායම




සමාගමේ ආදායම් වර්ධනය සඳහා වෙනත් භෝග අංශයේ ඉතා වැදගත් වර්ධනය විශාල ලෙස දායකවී ඇත.

2013/14 වර්ෂයේදී මුළු ආදායමට වී වගා අංශයේ දායකත්වය සියයට 48 ක් විය. 2012/13 වර්ෂයේ සිට මෙම අංශය ඉලක්කයෙන් සියයට 23 ක අඩු වීමක් වාර්තා කර තිබුණි. මෙය ප්‍රධාන වශයෙන් කාබනික පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා රජය විසින් ගන්නා ලද උපායමාර්ගික තීරණය හේතුවෙන් සිදුවිය.

2012/13 වර්ෂයේ සිට සියයට 62 ක සැලකිය යුතු වැඩිවීමක් සහිතව වෙනත් භෝග අංශය ආදායමට සියයට 52 කින් දායකවී තිබුණු අතර වර්ෂය සඳහා ඉලක්කය සතුටුදායක ලෙස වැඩිකර ගෙන තිබුණි.

## දළ ලාභය

සමාගම විසින් රු.575,467,461 ක දළ ලාභයක් මූල්‍ය වර්ෂය තුළදී වාර්තා කර තිබූ අතර එය පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 7 ක අඩුවීමක් විය. වී වගා පොහොර විකුණුම් අඩුවීම මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

දළ ලාභය




## පරිපාලන වියදම්

මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ පරිපාලන වියදම රු.මිලියන 448 ක් වූ අතර පෙර වර්ෂය සමඟ සැසඳීමේදී එය සියයට 5 ක අඩුවීමක් විය.

පරිපාලන වියදම්




## බෙදාහැරීම් වියදම්

සමාගමේ බෙදාහැරීම් වියදම රු.මිලියන 57 දක්වා අඩුවී තිබුණු අතර ඵලදායී හා කාර්යක්ෂම කළමනාකරණය හේතුවෙන් සමාගමේ බෙදාහැරීම් ජාලයේ සැලකිය යුතු ප්‍රසාරණයක් විය.

බෙදාහැරීම් වියදම්




## මූල්‍ය ආදායම හා වියදම

සමාගමේ වර්ෂයේ මූල්‍ය ආදායම රු.මිලියන 97 දක්වා වැඩිවී ඇත. ස්ථාවර වත්කම්වල හා ප්‍රතිමිලදී ගැනීම් ආයෝජනවල විචක්ෂණ ආයෝජනයන්ට අදාළ පොලී ආදායම මූල්‍ය ආදායමෙහි ඇතුළත් වේ. පෙර වර්ෂය සමඟ සැසඳීමේදී සමාගමේ මූල්‍ය වියදම් සියයට 53 කින් අඩුවී ඇත. බැංකු අයිරා පොලී මූල්‍ය වියදමෙහි ඇතුළත් ඇත.

**මූල්‍ය ආදායම හා වියදම**




**කොටසකට ඉපැයුම**




## බදුවලට පෙර ලාභය (PBT)

සමාගම මෙතෙක් ලද ඉහළම බදු පෙර ලාභය රු.241,328,764 ක් ලෙස වාර්තා කරන ලද අතර එය පෙර වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 21 ක වැඩිවීමක් විය.

**බදුවලට පෙර ලාභය**




## බදු

මූල්‍ය වර්ෂය සඳහා ආදායම් බදු වියදම රු.62,869,313 ක් වූ අතර එය 2012/13 වර්ෂයේදී රු.73,037,738 ක් විය. ආදායම් බදු වියදමෙහි විලම්බිත බදු වියදම රු.5,561,375 ක් ඇතුළත් වේ. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත හා පසුව එයට කරන ලද සංශෝධනයන් ප්‍රකාරව සමාගම සියයට 28 බැගින් වූ ආදායම් බදු බැරකමකට යටත් වේ.

## කොටසකට ඉපැයුම (EPS)

මූල්‍ය වර්ෂය තුළදී මෙතෙක් ඉහළම කොටසකට ඉපැයුම වූ රු.3.55 ක් සමාගම විසින් උත්පාදනය කරන ලදි. මෙය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 41 ක වැඩිවීමක් විය.

## කොටසකට ලාභාංශ (DPS)

ප්‍රවර්තන මූල්‍ය වර්ෂයේදී මෙතෙක් ඉහළම කොටසකට ලාභාංශය වූ රු.1.05 අධ්‍යක්‍ෂ, මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර එය වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස් හිමිකරුවන් විසින් අනුමත කළ යුතුය.

**කොටසකට ලාභාංශ**




## වත්කම් මත ප්‍රතිලාභ (ROA)

වර්ෂයේදී මුළු වත්කම් මත සියයට 0.49 ක ප්‍රතිලාභයක් ජනනය කිරීමට සමාගමට හැකි විය. මෙය පෙර වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 2 ක වැඩිවීමකි.

**වත්කම් මත ප්‍රතිලාභ**



## හිමිකම් මත ප්‍රතිලාභ (ROE)

මූල්‍ය වර්ෂය සඳහා සමාගම සියයට 4.6 ක හිමිකම් මත ප්‍රතිලාභයක් ජනනය කරන ලද අතර එය පෙර වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 36 ක වැඩිවීමකි.

**හිමිකම් මත ප්‍රතිලාභ**




## වත්කම් පදනම

සියයට 95 ක ජංගම නොවන වත්කම් පදනම හා සියයට 5 ක ජංගම වත්කම් පදනම සමඟ 2014 මූල්‍ය වර්ෂය අවසානයට සමාගමේ වත්කම් පදනම රු.36,266,731,183 ක් විය.

ප්‍රධාන වශයෙන් දේපල, පිරියත හා උපකරණ වලින් සමන්විත සමාගමේ ප්‍රවර්තන මූල්‍ය වර්ෂයේ ජංගම නොවන වත්කම් පදනම රු.1,879,519,023 ක් වේ.

පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී මුළු ජංගම වත්කම් රු.9,8158,939,610 කින් වැඩිවී තිබුණි.

**වත්කම්**




## මුදල් ප්‍රවාහය හා ද්‍රවශීලතාවය

මෙහෙයුම් වලින් හා ආයෝජනයන්ගෙන් ජනනය වන මුදල් සමාගමේ ප්‍රධාන මූල්‍ය ප්‍රභවයන් වේ. ප්‍රවර්ථන මූල්‍ය වර්ෂය තුළදී මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් ගලායාම රු.බිලියන 5.1 ක් වු අතර ආයෝජන කටයුතු වලින් ශුද්ධ මුදල් ගලායාම රු.බිලියන 0.5 ක් විය. සමාලෝචිත වර්ෂයේදී සමාගමේ මූල්‍ය කටයුතු වලින් ජනනය වු මුදල් ප්‍රවාහය රු.බිලියන 5.6 ක් විය.

සේවා ණය හා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා, ප්‍රාග්ධන වියදම හා ලාභාංශ ගෙවීම සඳහා ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් පවත්වා ගැනීමට සමාග මට හැකි විය.

## කොටස් හිමියන්ගේ අරමුදල්

පෙර වර්ෂයේ රු.බිලියන 3.7 ක් වු සමාගමේ කොටස් හිමියන්ගේ අරමුදල් සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ එය රු.බිලියන 3.8 ක් දක්වා ඉහළ ගිය අතර එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂය තුළදී ලාභය හේතුවෙන් රඳවා ගත් ඉපැයීම් වැඩිවී තිබුණි.





## ගෙවතු වගා සඳහා

පළතුරු, එළවළු හා මල් සඳහා කුඩා ඇසුරුම් පොහොර අපි සපයන්නෙමු.



# ලක් පොහොර පවුල

## මානව සම්පත් කළමනාකරණය

අපගේ ප්‍රජාව අපගේ ශක්තිය වන අතර සමාගමේ හා රටෙහි අඛණ්ඩ සාර්ථකත්වය සඳහා ඔවුන්ගේ අවිවාදාත්මක දායකත්වය ඉතා වැදගත් වේ.



### යහපත් පරිචයන් හා සේවක ප්‍රතිපත්තිය

සාප්පු හා කාර්යාල පනත, පඩිපාලක සභා ආඥා පනත, මහා භාණ්ඩාගාරය හා රේඛීය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ හා ශ්‍රී ලංකාවේ පවතින සියළුම අදාළ කම්කරු නීතිවලට අනුකූලව අපගේ පිරිස් කළමනාකරණ උපාය මාර්ගය විධිමත්ව ඇති කරන ලදි. තවද කාර්ය මණ්ඩල කළමනාකරණයේ විනිවිදභාවය වැඩිදියුණු කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සේවක සංඛ්‍යාව හා බඳවා ගැනීම් යෝජනා ක්‍රමය ප්‍රකාරව බඳවා ගැනීම් පරිපාටියද අප විසින් මනාව සකස් කරන ලදි.

### සේවක ප්‍රතිලාභ සැලැස්ම

සේවක අර්ථ සාධක අරමුදල වෙනුවෙන් (EPF) දළ වැටුපෙන් සියයට 15 ක් ලංකා පොහොර සමාගම විසින් දායක වන අතර එසේම සේවක භාරකාර අරමුදල (ETF) වෙනුවෙන් දළ වැටුපෙන් සියයට 3 ක දායකයක් කරනු ලැබේ.
සේවක ප්‍රතිලාභ සැලැස්ම.

### ප්‍රතිලාභ සැලැස්ම හැඳින්වීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 හි නිශ්චය කර ඇති පරිදි සුදුසුකම් ලත් ආයුගණකවරයකු මඟින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ නිරූපනය වන නිශ්චිත ප්‍රතිලාභ වගකීම වාර්ෂිකව ගණනය කරනු ලැබේ. විශ්‍රාම ප්‍රතිලාභ වගකීම සඳහා ප්‍රතිපාදන සියළු සේවකයන්ගේ පළමු සේවා වර්ෂය සිට ගණනය කෙරෙන නමුත් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ සේවකයකුගේ අඛණ්ඩ සේවා කාලය වර්ෂ 5 ක් සම්පූර්ණවීමේදී පමණක් වගකීම පැන නගී.

### සේවක අභිප්‍රේරණය

රජය සතු අයිතිය මත රැකියා සුරක්ෂිතභාවය සිත් තුළ ඇතිවන අතර සේවකයන් අතර පොදු වගකීමක් රාජකාරි කිරීමේදී ඇති වේ. ආයතනයේ සාර්ථකත්වයට අත්‍යවශ්‍ය සේවක පෙළඹවීම ඉතා ඉහළ මට්ටමක පවතින අතර බොහෝ මූල්‍ය හා  මූල්‍ය නොවන ප්‍රතිලාභද අපගේ සේවකයන්ට සපයා ඇත.

### මූල්‍ය ප්‍රතිලාභ

- එක් එක් සේවකයාගේ පුද්ගලික කාර්ය සාධනය ඇගයීම සඳහා සමාගමේ වාර්ෂික දිරි දීමනා යෝජනා ක්‍රමය සැලැසුම් කරන ලදි.
- හිමිකම් ඇති සේවකයන්ට දූවිලි, තේ, ආහාර , ඇඳුම් හා ශීත දීමනා ගෙවනු ලැබේ.
- ඉතිරි වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ගෙවීම.
- හිමිකම් ඇති සේවකයන් සඳහා ජංගම හා සෘජු දුරකථන සඳහා බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම.
- ජාතික හෝ ජාත්‍යන්තරව අධ්‍යාපනික, සංස්කෘතික හෝ ක්‍රීඩා අංශයන්ගෙන් සාර්ථකත්වයට පත්වූ සේවකයන්ගේ දරුවන්ට මුදල් ප්‍රදානයන් ලබාදෙන ලදි.

### වෙනත් ප්‍රතිලාභ

- ප්‍රාදේශීය අලෙවි කළමනාකරුවන්ට ඔවුන්ගේ කාර්ය සාධනය හඳුනාගෙන නිල වාහන පහසුකම් වෙන් කරන ලදි.
- දිස්ත්‍රික් අලෙවි විධායක නිලධාරීන්ට යතුරු පැදි සපයන ලදි.
- සේවකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල අයගේ ප්‍රතිලාභ සඳහා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදි.
- ඉහළ විකුණුම් වාර්තා කරන ලද දිස්ත්‍රික් අලෙවි විධායක නිලධාරීන්ට විදේශ ගමන් සලසා දෙන ලදි.
- පහළ සිට ඉහළට නිදහස් සන්නිවේදන ගලායාමක් දිරිමත් කිරීම සඳහා විවෘත සන්නිවේදන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන ලදි.
- අධ්‍යාත්මික සංවර්ධනය මෙන්ම කුසලතා සංවර්ධනය සහ කණ්ඩායම් කාර්යයන් වැඩිදියුණු කිරීම, ධනාත්මක චින්තනය සහ කණ්ඩායම් ගොඩනැඟීම ආදි විවිධ පුහුණු වැඩ සටහන් තුළින් සිදුකරන ලදි. එසේම තොරතුරු තාක්‍ෂණය හා ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය වැඩි දියුණු කිරීම සඳහා අප විසින් ඔවුන්ට අවස්ථා ලබා දෙන ලදි.
- සාමාන්‍ය සන්නිවේදනයට අමතර වශයෙන් දැනුම බෙදාගැනීමේ හා අදහස් ජනනය කර ගැනීමේ පහසුකම් සඳහා මාසික රැස්වීම් වැනි ව්‍යූහයාත්මක සේවක සන්නිවේදන සැලැස්මක් ක්‍රියාත්මක කරන ලදි.



- සේවක දුක් ගැනවිලි පිළිබඳ මෙහෙයවීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා මානව සම්පත් ප්‍රතිපත්ති රාමුව සමඟ පෙළ ගැසෙන ලෙස සැලසුම් කරන ලදි.
- රාජකාරී මෙන්ම පුද්ගලික කරුණුවලට අදාළ ගැටළු විසඳීම වෙනුවෙන් මෙහෙයුම් කරුණු මත විශේෂඥ උපදෙස් සඳහා සේවකයන්ට ප්‍රවේශය තහවුරු කර ගැනීමට සේවක උපදේශන වැඩ සටහන සැලැසුම් කරන ලදි.
- වර්ෂ 25 ක දීර්ඝ සේවා කාලය සැපිරූ සේවක භවතුන්ට රත්රන් කාසියක් පිරිනැමීම මඟින් සිදුකරන ලදි.

## අපගේ සේවා සංයුතිය

ලක් පොහොර පවුලේ සාමාජිකයන් විසින් සිදුකරන තිරසාර කාර්යයන්හි ඵලය ආයතනයේ සමස්ත සාර්ථකත්වයයි. අපගේ සමාගමේ ප්‍රධාන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේදී සකස් කරන ලද ඉලක්කයන්ට ඉහළින් හා බැහැරින් කැපවී කටයුතු කරන සේවකයන් 428 ක කණ්ඩායමක් අප සතු වේ. රැකියා කොන්ත්‍රාත්තු, වර්ගය, පළාත හා ස්ත්‍රී පුරුෂ වශයෙන් සේවකයන්ගේ කොටස් කිරීම පහත පරිදි වේ. සේවකයන් පත් කිරීමේදී වයස, ස්ත්‍රී පුරුෂ භාවය නිවැරදිව සමානුපාතිකව පවත්වා ගෙනයාම සුරක්ෂිත කෙරේ.

**රැකියා කොන්ත්‍රාත් මඟින් සේවකයන්**




**පළාත් වශයෙන් ස්ථීර සේවකයන්**




**වර්ග වශයෙන් ස්ථීර සේවකයන්**




**ස්ත්‍රී පුරුෂ වශයෙන් ස්ථීර සේවකයන්**





**සේවකයාගේ සුභ සාධනය හා ශක්තිමත් ඵලදායිතාවය වැඩිදියුණු කිරීම සඳහා සේවකයන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව වෙනුවෙන් සමාගමේ මානව සම්පත් න්‍යාය පත්‍රයෙහි විශාල වැදගත්කමක් අප විසින් ලබාදී තිබේ.**

ආයතනය තුළ ක්‍රියාත්මක කෙරෙන වෛද්‍ය රක්ෂණ ක්‍රමයක් ඇති අතර මුළු රක්ෂණ පිරිවැයෙන් සියයට 75 ක් සමාගම විසින් වැය කරනු ලැබේ. වැඩිමනත් වශයෙන් හදිසියේ සිදුවන අනතුරු සඳහා සේවක වන්දි යෝජනා ක්‍රමයක්ද ඇත. ජල ගැලීම්, නාය යාම් හා කුණාටු වැනි ස්වාභාවික ආපදා වලදී ඒවාට මුහුණදීමට සිදුවන සේවකයන් සඳහා ආධාර සැපයීමට වැඩ සටහනක් සමාගම විසින් ආරම්භ කර ඇත. ඒ අනුව සමාගම විසින් උපකරණ හා මුල්‍ය ආධාර එම ආපදා වලට ලක්වූ සේවකයන්ට ලබාදෙනු ලැබේ.

තවදුරටත්, සේවකයන්ගේ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සඳහා මාසිකව ආගමික හෝ විද්වත් දේශන සංවිධානය කරනු ලැබේ. සේවකයන්ගේ මනා ශාරීරික යෝග්‍යතාවයක් පවත්වා ගැනීමේ අරමුණින් සමාගම විසින් ශාරීරික අභ්‍යාස පුහුණු ශාලාවක්, බැඩ්මින්ටන් ක්‍රීඩා පිටියක් හා වොලිබෝල් ක්‍රීඩා පිටියක් ස්ථාපිත කරන ලදි.

## සේවකයන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව

සමාගමේ පහසු ක්‍රියාකාරිත්වය සඳහා අප සේවකයන්ගේ යහපත් සෞඛ්‍ය තත්ත්වය අත්‍යවශ්‍ය වේ. එබැවින් සේවකයාගේ සුභ සාධනය හා ශක්තිමක් ඵලදායීතාවයක් වැඩිදියුණු කිරීම සඳහා සේවකයන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව වෙනුවෙන් සමාගමේ මානව සම්පත් න්‍යාය පත්‍රයෙහි විශාල වැදගත්කමක් අප විසින් ලබාදී තිබේ.

සේවකයකුට සිදුවන රැකියාවට සම්බන්ධ සුළු හෝ විශාල අනතුරු හෝ අසනීප හේතුවෙන් දින 3 කට වැඩි කාලයක් සේවයට වාර්තා කළ නොහැකි වන විට ඒ පිළිබඳ ක්‍රමවත්ව සමාලෝචනය කරන අතර වළක්වා ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගනු ලැබේ.







## මානව සම්පත් අභිවෘධිය

අපගේ සේවකයන් සඳහා උසස් කාර්ය පරිසරයේ වැදගත්කම අප හොඳින් අවබෝධ කර ගෙන ඇති අතර සේවකයන්ට තම කාර්යයන් සපුරා ගැනීම්, සංවර්ධනය හා දැනුම සඳහා අවස්ථාවන් උත්පාදනයට හා අභියෝගයන්ට ඉඩ ප්‍රස්ථා එමඟින් ඇති වේ. මෙම මූලධර්මයන් සඳහා අපගේ වගකීම හා ඉතා ඉහළ ප්‍රතිලාභ ලබාගැනීම සඳහා අපගේ සේවකයන් වෙනුවෙන් කරන ආයෝජනයන් අඛණ්ඩව සිදුකෙරේ.



තවද අඛණ්ඩ මානව සම්පත් සංවර්ධනය ප්‍රධාන වශයෙන් තාක්ෂණ හා කුසලතා සංවර්ධනය, නායකත්ව සංවර්ධනය, රැකියා පිළිබඳ උනන්දුව, අත්දැකීම් සහිත ඉගෙනීම හා උපදේශනය සමඟ සම්බන්ධ වේ. අදාළ ක්ෂේත්‍රවල විශේෂඥයන් වූ අභ්‍යන්තර හා බාහිර වෘත්තිකයන් යොදා ගනිමින් සමාගම විසින් සියළු




පුහුණු වැඩ සටහන් සංවිධානය කරනු ලැබේ.

- 2010 වර්ෂයේ සිට සමාගම ICT පුහුණු වැඩ සටහන් පවත්වන අතර සමාගමේ අනුග්‍රාහය ඇතිව පුහුණු වැඩ සටහන් සාර්ථකව නිම කිරීමේදී ජාත්‍යන්තර පිළිගත් ICDL සහතිකය ප්‍රදානය කරනු ලැබේ.
- සේවකයන් ඉංග්‍රීසි ප්‍රවීණතාවය වැඩිදියුණු කිරීම සඳහා ඉංග්‍රීසි පාඨමාලා පවත්වනු ලැබේ.
- පුහුණු සැසි සඳහා විධායක කාර්ය මණ්ඩලය යොමු කෙරෙන  අතර ඔවුන්ගේ කණ්ඩායම් කළමනාකරණ කුසලතා, ධනාත්මක ආකල්ප හා තීරණ ගැනීමේ නිපුණතා වැඩිදියුණු කිරීම සඳහා විදේශ පුහුණු වැඩ සටහන්ද සංවිධානය කරනු ලැබේ.
- එක් එක් අංශයට තොරතුරු තාක්ෂණ නිපුණතා ඇති සේවකයන් යෙදවීමේ අරමුණින් ආයතනයේ සියළුම අංශයන් ආවරණය වන පරිදි තෝරා ගත් සේවකයන්ට පරිගණක, පරිගණක මෘදුකාංග හා දෘඩාංග පුහුණුව ලබාදෙනු ලැබේ.
- අලෙවිකරණ අංශයේ සේවකයන් සඳහා රසායනික පොහොර පිළිබඳ අධ්‍යයනයන් ලබා ගැනීමට ප්‍රධාන කාර්යාලයේ හා පොළොන්නරුව ප්‍රාදේශීය ගබඩාවල විශේෂ පුහුණු සලසා දෙන අතර සේවකයන්ගේ දැනුම ඉහළ නැංවීම සඳහා පුස්තකාලයක්ද පවත්වා ගෙන යනු ලැබේ.

> අදාළ ක්ෂේත්‍රවල විශේෂඥයන් වූ අභ්‍යන්තර හා බාහිර වෘත්තිකයන් යොදා ගනිමින් සමාගම විසින් සියළු පුහුණු වැඩ සටහන් සංවිධානය කරනු ලැබේ.

## රඳවා ගැනීම

වර්ෂය තුළදී සැලකිය යුතු අඩු සේවක පිරිවැටුමක් පවත්වා ගැනීමට අපට හැකිවීම අභිමානයක් වන අතර, එයට මානව සම්පත් සංවර්ධනය වැඩිදියුණු කිරීම, පුද්ගලික සංවර්ධනය, විවිධත්වය, හඳුනා ගැනීම, මිත්‍රශීලී හා ඉගෙනීමේ පරිසරය, වෘත්තීයතාවයේ ඉහළ ප්‍රමිතීන්, ත්‍යාග හා ප්‍රතිලාභ සහ ඉහතදී සාකච්ඡා කරන ලද බොහෝ කරුණු ඉවහල් වන සේවක තෘප්තිය වැඩිදියුණු කරන කරුණු සංකලනයක් ප්‍රධාන වශයෙන් හේතු වේ.



## වයස් කාණ්ඩය අනුව සේවක පිරිවැටුම

| | සේවක සංඛ්‍යාව | % |
|---|---|---|
| අවුරුදු 30 ට අඩු | 1 | 2.7 |
| අවුරුදු 30 - 49 අතර | 8 | 3.1 |
| අවුරුදු 50 සහ ඊට ඉහළ | 1 | 1 |



## ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවක පිරිවැටුම

| | සේවක සංඛ්‍යාව | % |
|---|---|---|
| පුරුෂ | 9 | 2.28 |
| ස්ත්‍රී | 1 | 0.25 |
| මුළු පිරිවැටුම (%) | | 2.53 |



## සේවක සංවර්ධනය

කාර්යාල සංකීර්ණය ඉදිරිපස හා හුණුපිටිය මධ්‍යම ගබඩා සංකීර්ණයේ සකස් කරන ලද බුද්ධ ප්‍රතිමා වහන්සේ පවත්වා ගෙනයාමේ මහඟු කාර්යය බෞද්ධ සංගමය විසින් සිදුකෙරේ.

කාර්යාල සංකීර්ණයේ හා හුණුපිටිය මධ්‍යම ගබඩා සංකිර්ණයේ පැවති ඉතා පැරණි බෝ වෘක්ෂය වටා තිබු සෞඛ්‍යයට අහිතකර පරිසරය වෙනස් කිරීමෙන් 2011 වර්ෂයේදී ජනවාර්ගික හා ආගමික එකඟතාවය දිරිමත් කිරීමට ''ගණ දෙවියන්ගේ'' ප්‍රතිමාවක් සමාගම විසින් ස්ථානගත කරන ලදි.

සමාගම විසින් සේවකයන් සඳහා අධ්‍යාත්මික සංවර්ධන වැඩ සටහන්ද ක්‍රමානුකූලව පවත්වනු ලැබේ. ඊට අමතරව වාර්ෂිකව අපගේ සේවකයන් හා පවුල් එකතුවීමේ අරමුණින් ''ලක් පොහොර'' පවුලේ දිනය හා නත්තල් කැරොල් පවත්වනු ලබයි.





# අපගේ ප්‍රජාව

## අපගේ ආයතනික සමාජ වගකීම

අපගේ ආයතනික සමාජ වගකීම න්‍යායානුගත ප්‍රතිපත්තිය රටේ තිරසාර සංවර්ධනයට දායකත්වය සපයයි. මෙම ක්‍රියාවලියේදී අපගේ උනන්දුවක් දක්වන සියළුම පාර්ශ්වයන් හා සමස්තයක් ලෙස මුළු සමාජයම විසින් අගය කෙරෙන හා විශ්වාස කෙරෙන සමාගමක් ලෙස අපි වැඩෙන්නෙමු.

## අපගේ ආයතනික සමාජ වගකීම පිළිබඳ සමස්ත විග්‍රහය




### අපගේ ප්‍රජාව

ගුණාත්මක නිෂ්පාදන හඳුන්වාදීමේදී ක්‍රමවත්ව රසායනාගාර පරීක්‍ෂණ

අනුග්‍රාහක වැඩ සටහන්

විවිධත්වයට ගරු කිරීම

ලංකා පොහොර සමාගමේ ආධුනික යෝජනා ක්‍රමය

ප්‍රජා කාර්යයන් සංවිධානය හා අනුග්‍රහය

පොහොර භාවිතය පිළිබඳ ගනුදෙනුකරුවන් සඳහා ක්‍රමවත් අධ්‍යාපනික වැඩසටහන්

### අපගේ පරිසරය

කෘෂිකර්ම ක්ෂේත්‍රය සංවර්ධනය සඳහා දායකත්වය

සෘජු හා වක්‍ර රැකියා අවස්ථාවන්

බදු ගෙවීම

කොටස්කරුවන්ට ප්‍රතිලාභ

ආයතනික පාලනය

### අපගේ ආර්ථිකය

අපගේ ආර්ථිකයේ ශක්ති පරිභෝජනය අඩුකිරීම

පරිසර හිතකාමී නිෂ්පාදන හඳුන්වාදීම සඳහා ක්‍රමවත් රසායනාගාර පරීක්ෂණ

ජාතික කාබනික පොහොර වැඩ සටහනට දායකත්වය

නිර්මල හා හරිත පරිසරය අපද්‍රව්‍යමය කළමනාකරණ පද්ධතිය

පාරිසරික කළමනාකරණ පද්ධතිය

## අපගේ පරිසරය

අපගේ පරිසරය ආරක්ෂා කර ගැනීම අපගේ යුතුකම බව අප විශ්වාස කරන අතරම වගකිව යුතු ආයතනයක් වශයෙන් අනාගත පරම්පරාව උදෙසා එය ආරක්‍ෂා කිරීම අපගේ කාර්යයයි.

රටේ මුල් බැස ගත් පාරිසරික අභියෝගයන් අවබෝධ කර ගනිමින් කාබනික පොහොර භාවිතය පිළිබඳ දිගුකාලීන වැදගත්කම ලංකා පොහොර සමාගම විසින් අවබෝධ කොට ඇත. මෙම පසුබිම යටතේ, ගොවි ප්‍රජාව අතර කාබනික පොහොර භාවිතය දිරිගන්වන ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ වැඩ සටහන්වල සමාගම නිරත වේ. වර්ෂය තුළදී සමාගම එකම සැපයුම්කරුවන එප්පාවල පොස්පේට් නිධිය (ERP) සමඟ ඒකාබද්ධව ජාතික කාබනික පොහොර වැඩ සටහනට සම්බන්ධ විය.

කාබනික පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීමේදී සමාගම ආයතනික මට්ටමින් ලක් පොහොර සන්නාම නාමය යටතේ කොම්පෝස්ට් පොහොර මිශ්‍රණයක් හඳුන්වාදීමට පියවරයන් ගන්නා ලදි.

කළමනාකරණය විසින් නව කොම්පෝස්ට් පොහොර මිශ්‍රණය සැප්තැම්බර් මැද භාගයේදී වෙළඳපොළට නිකුත් කිරීමට අපේක්ෂා කර ඇත. සමාගම විසින් ලංකා පොහොර සමාගම පරිශ්‍රය තුළ ආදර්ශ ගොවිපළක් ''ගොවියා පාය'' නමින් පවත්වා ගෙන යනු ලැබේ.










පරිසරය ආරක්ෂා කර ගැනීමේ කැපවීම නිරූපනය කරමින් සමාගම විසින් නිර්මල හා හරිත වටපිටාවක් සහිතව කාර්යාල සංකීර්ණය පවත්වා ගනු ලබන අතර ISO 14001 : 2004 සහතිකය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් සමාගම කටයුතු කරයි. පාරිසරික බලපෑම පාලනය කිරීම සඳහා කාර්යක්ෂම පාරිසරික කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීමට දැනටමත් සමාගම විසින් ක්‍රියාමාර්ග ගෙන ඇති අතර සමාගමේ පාරිසරික කාර්ය සාධනය නිරන්තරයෙන් වැඩිදියුණු කරනු ලැබේ. සරලව ආරම්භ කිරීමක් ලෙස, සමාග මේ දිනපතා අප ද්‍රව්‍ය කළමනාකරණය කිරීමෙන් ඝන අප ද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දෙන ලදි. අන්තරායකර පාරිසරික බලපෑම අවම කරමින් අභ්‍යන්තර ඉන්ධන හල ප්‍රතිසංස්කරණය කරන ලදි. වර්තමානයේ ඊලඟ පියවරට අඩිය තබමින් පරිසරයට ඉතා වගකිව යුතු ආකාරයෙන් කර්මාන්ත අප ද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ සම-ක්‍රියාවලි තාක්‍ෂණය යොදා ගන්නා අප ද්‍රව්‍ය කළමනාකරණ විසඳුම් සපයන්නකු සමඟ සමාගම සාකච්ඡා කරමින් පවතී.




පාරිසරක හා සංරක්ෂණය සමාගම විසින් කේන්ද්‍රකර ගැනීම මත කාර්යාල පරිශ්‍රය තුළ බලශක්ති පරිභෝජනය අවම කිරීමේ අරමුණින් උසස් තාක්ෂණයන් යොදා ගැනෙන බලශක්ති සුරැකීමේ උපාය මාර්ග  සමාගම විසින් ක්‍රියාත්මක කරන ලදි. එහි පළමු පියවර ලෙස 2014 ජනවාරි මාසයේදී කාර්යාල පරිශ්‍රය තුළ සවිකර තිබූ ෆ්ලෝරසන්ට් බල්බ් (ටියුබ් ලයිට්ස්) වෙනුවට 1/5 ක සිට 1/3 ක විදුලිය ඉතිරි කරන හා වාර 8 සිට 15 ක දිගු කාලයක් පවතින සම්පීඩිත ෆ්ලෝරසන්ට් ලාම්පු (CFL) සවිකරන ලදි. ඒ අනුව සමාගමේ විදුලි පරිභෝජනයේ මාසික වියදම සියයට 28 ක විශාල අඩුවීමක් සහිතව සමාගමේ විදුලි පරිභෝජනය විශාල ලෙස අඩුවී තිබුණි. තවදුරටත් ශක්ති පරිභෝජනයේ හා දිගු කාලීන පැවැත්මේ වඩාත් ආර්ථිකදායී වූ ලයිට් - එමිටින් ඩයෝඩ (Light - Emitting Diode - LED) සමඟ CFL බල්බ යොදා ගැනීමේ  ක්‍රියාවලියක සමාගම නිතරව සිටී. තුන්වැනි පියවර ලෙස සමාගමේ සමස්ත බලශක්ති අවශ්‍යතාවය සම්පූර්ණ කළ හැකි තනිකරම පුනර්ජනනීය බල ක්‍රමය ස්ථාපිත කර ගැනීමට කළමනාකරණය අපේක්ෂාවෙන් සිටී.

මෙයට සමගාමීව, සැපයුම්කරුවන් සමඟ එකඟතාවයෙන් පරිසරයට අඩුම බලපෑමකින් යුතුව ෆ්ලෝරසන්ට් බල්බ්ස් අපහරණය කරන ලදි. මෙය නිෂ්පාදකයින්ට ඔවුන්ගේ නිෂ්පාදන භාර ගැනීම හා ප්‍රතිචක්‍රීකරණය කිරීමේදී දිරිගැන්වීමක් විය.

ප්‍රජාව තුළ පුද්ගල ජීවනෝපාය, බල ගැන්වීමේ ක්‍රියාවලිය, ප්‍රජා සංවර්ධනය බව අපි විශ්වාස කරමු. ප්‍රජාව සඳහා සමෘද්ධිය ඇති කිරීමට සහ විවිධ මාර්ගවලින් ඔවුන්ගේ ජීවනෝපායන් වැඩිදියුණු කිරීමට අපි යෙදී සිටිමු.

අපගේ ආයතනික සමාජ වගකීම් කාර්යයන් මඟින් බුද්ධිමත් ඊලඟ පරපුරක් නිර්මාණය කිරීම අපි අරමුණුකර සිටිමු. මෙම කාර්යය සඳහා, දිවයින පුරා සිටින පහ වසර පන්තිවල සිසුන් සඳහා ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහිත පොත් පිංචයන් බෙදාහැරීමේ වැඩ සටහනක් සංවිධානය කරන ලදි. මෙම ප්‍රයත්නය ඉතා සාර්ථක වූ අතර ගුරුවරුන් හා දෙමාපියන් විසින් ඉතා අගය කරන ලදි.





ක්‍රීඩා හා විනෝද කාර්යයන් සඳහා තරුණ සහභාගීත්වය දිරිගැන්වීමට ජාතික ගොවි සතියට සමගාමීව ''ලක් පොහොර පාපැදි සවාරිය'' නමින් වාර්ෂිකව පාපැදි තරඟයක් පවත්වනු ලැබේ.





සමාගම විසින් පොසොන් පෝය නිමිත්තෙන් එකවර 500 දෙනෙකුට පහසුකම් සැලසෙන පරිදි වාර්ෂිකව දන් සැලක් පවත්වනු ලැබේ. 2013/2014 වර්ෂයේදී දවස පුරාම 15,000 ක් පමණ ජනතාවට සේවාව සපයන ලදි.






පොසොන් දන්සැලට සමගාමීව ''පොසොන් භක්ති ගී වැඩ සටහනක්ද'' වත්තල කැළණිය ප්‍රදේශවල දහම් පාසැල් සිසුන්ගේ ගායනා දක්ෂකම් සඳහා දිරිගැන්වීමක් වශයෙන් පවත්වන ලදි.



උපාධිය අපේක්ෂක සිසුන් සඳහා මූල්‍ය සහායක් වශයෙන් හා කාර්ය පළපුරුද්දක් ලබාගැනීම සඳහා ලංකා පොහොර සමාගමේ ආධුනිකත්ව වැඩසටහන් පහසුකම් සලසයි. තවද මෙය උපාධි අපේක්ෂකයන් සඳහා ලංකා පොහොර සමාගමේ හෝ වෙනත් පිළිගත් සේවා ආයතනයක රැකියා ලබාගැනීමේදී වැදගත් ස්ථානයන් ලැබීම සඳහා තහවුරු වේ.

මෙයට අමතරව, විවිධ ආගමික ආයතන, පාසැල්, සංගම් හා දැයට කිරුළ, ජාතික ගොවි සතිය ආදි ජාතික අවස්ථාවන්හිදී අනුග්‍රහය දැක්වීම් වශයෙන් වර්ෂය තුළ රු.මිලියන 2 ක පමණ ප්‍රමාණයක් සමාගම වැය කර ඇත. මෙම අනුග්‍රාහක වැඩ සටහන් වල ප්‍රධාන අරමුණු වන්නේ සමාජ හා ආගමික විවිධත්වය කෙරෙහි ගෞරව දැක්වීමයි.

## අපගේ ආර්ථිකය

ජාතික පොහොර සහනාධාර වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා සමාගමේ දායකත්වය ඉතා භාරදූරය. ජාතික පොහොර සහනාධාර වැඩ සටහන ක්‍රියාත්මක කිරීමෙහිලා සමාගමේ දායකත්වයේදී රටේ වී නිෂ්පාදන 2007 වර්ෂයේදී මෙට්රික් ටොන් 3,131,000 සිට 2013 වන විට සමාගමේ උරදීම සියයට 48 ක වර්ධනයක් සඳහා විය.

සමාගම සෘජු රැකියා අවස්ථා 428ක් සපයා ඇති අතර රට පුරාම වක්‍ර රැකියාවන් දහස් ගණනක් සපයා ඇත.

වගකිව යුතු ආයතනික පුරවැසියන් ලෙස සමාගම බදු ගෙවීමේ ආර්ථික වැදගත්කම අවබෝධ කර ගනිමින් කාලීනව සියළුම සෘජු හා වක්‍ර බදු ගෙවීම සඳහා ඉතා උද්යෝගී වේ.



# රබර් සඳහා

ආර්.ඒ. - 465, ආර්.යු. - 462, ආර්.යු. – 465, ආර්/ වයි.බි,
ආර්/එස්.ඒ වැනි විශේෂ මිශ්‍රිත පොහොර
අපි සයන්නෙමු






# ආයතනික පාලනය

ආයතනික පාලනයේ දර්ශනය වන්නේ ශක්තිමත් ආයතනික වටිනාකම් මාලාවක්, ලිඛිත පාලන සංග්‍රහයක් සහ උදාහරණයක් ලෙස පාලක මණ්ඩලයක් මගින් ලක් පොහොර හි සියළුම මට්ටම්වලින් ආයතනගත වීමයි.

සීමාසහිත ලංකා පොහොර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳෙන අතර ආයතනික පාලනය පිළිබඳ ඉහළම ප්‍රමිතීන්ට අනුව පවත්වා ගැනීම කෙරෙහි වගකීම දරයි. සමාගමේ ආයතනික පාලනයේ යන්ත්‍රණය එහි සියළු උනන්දුවක් දක්වන්නන් කෙරෙහි ගිවිසුම්ගත වටිනාකමක් සපයා දෙන බවට තහවුරු කරයි. සමාගමේ ආයතනික පාලන දර්ශනය පහත දැක්වෙන කරුණුවලට අනුකූලව උපරිමව කටයුතු සිදු කරයි.

1. 2007 අංක 07 දරන සමාගම් පනත
2. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ යහ පාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශය
3. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ආයතනික පාලනය පිළිබඳ යහපත් පරිචය සංග්‍රහය

## අධ්‍යක්ෂ මණ්ඩලය

රජය වෙනුවෙන් හා උනන්දුවක් දක්වන්නන් වෙනුවෙන් ආයතනයේ භාරකාරත්වය සඳහා වගකීම් දරන ප්‍රබල අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් සමාගම පාලනය වේ. අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ කෙටි සටහනක් 24 පිටුව සිට 27 පිටුව දක්වා සාරාංශ කර ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් අය ඇතුළත්ව අධ්‍යක්ෂවරුන් 07 දෙනෙකුගෙන් සමන්විත වේ.

- කළමනාකරණය, මූල්‍ය, නීතිය හා කෘෂිකර්ම ක්ෂේත්‍රවල විශේෂඥයින්
- කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් හා මහා භාණ්ඩාගාරයෙන් නියෝජිතයන්
- විධායක අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක්

| | |
|---|---|
| බුද්ධික මඩිහහේවා මහතා | සභාපති |
| සුදර්ශ ගනේගොඩ මහතා | ක්‍රියාකාරී අධ්‍යක්ෂ |
| ප්‍රේමසිරි අබේනායක මහතා | ක්‍රියාකාරී අධ්‍යක්ෂ |
| එච්.එම්. අජිත්චන්ද්‍ර මහතා | මහා භාණ්ඩාගාර නියෝජිත (NED) |
| ඒ.එල්.ඒ. අශෝක සිරිවර්ධන මහතා | කෘෂිකර්ම අමාත්‍යාංශයේ නියෝජිත (NED) |
| නෙවිල් අබේරත්න මහතා | විධායක නොවන අධ්‍යක්ෂ |
| ධම්මික ඩී. යාපා මහතා | විධායක නොවන අධ්‍යක්ෂ |

පනස් වසරක
සාර්ථක
ගමනෙහි
රහස
යහ පාලනයයි

## අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්ය භාරය

රජයේ ප්‍රතිපත්ති වලට අනුකූලවන පරිදි රාජ්‍ය ව්‍යවසාය කාර්යක්ෂමව හා ඵලදායීව කළමනාකරණය කෙරෙන බවට තහවුරු කර ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමයි. සම්පත් ආරක්ෂා කර ගැනීම, විධිමත් ගිණුම් පවත්වා ගැනීම, නිවැරදි වාර්තා සම්පාදනය කරගත් බවට තහවුරු කර ගැනීම, කළමනාකරණය සම්බන්ධයෙන් සියළු ව්‍යවස්ථාපිත හා වෙනත් නීත්‍යානුකූල අවශ්‍යතාවලට අනුකූලවීම මගින් මෙය සාක්ෂාත් කර ගැනීමට හැකි වේ.

ව්‍යවසායයේ උපායමාර්ගික ඉලක්ක තිබෙන බවට තහවුරු කර ගැනීම සහ උපාය මාර්ගික ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා සමාගම කටයුතු කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ගනියි. අභ්‍යන්තර පාලනයන් පිළිබඳ ඵලදායී පද්ධතියක් සහ අවදානම් කළමනාකරණය තිබෙන බවට සමාගමේ කළමනාකරණ කාර්යයන් ඵලදායීව ක්‍රියාත්මක වන බව හා සම්පත් හා වත්කම් ඵලදායීව උපයෝජනය වන බවට මණ්ඩලය විසින් ක්‍රමවත්ව අධීක්ෂණය කෙරේ. මණ්ඩලය විසින් වාර්ෂිකව සාමාන්‍යාධිකාරීවරයාගේ හා ජ්‍යේෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය ඇගයීමට ලක්කරන අතර, උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට මූල්‍ය අංශයන් පිළිබඳව ප්‍රමාණවත් වාර්තාකරණයක් ලබා දීම මෙන්ම අවශ්‍ය විට ක්‍රමවත් පදනමකින් වෙනත් එවැනි අවශ්‍යතාවන් හෙළිදරව් කිරීම්ද ලබා දෙනු ලැබේ.

විගණන හා අවදානම් කළමනාකරණ කමිටු පත්කිරීම පිළිබඳ වගකීම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. විධිමත් පාලන සංග්‍රහයක්, ආචාර ධර්ම ප්‍රමිතීන් හා ආයතනික පාලන උපාය මාර්ග සමාගම විසින් හඳුන්වා දී ඇත. සමාගමේ සියළු ක්‍රියාවන් අයිතිය පිළිබඳ කිසිදු ගැටුමක් නොවන පරිදි අදාළ ව්‍යවස්ථාවලින්, මාර්ගෝපදේශ, රජයේ චක්‍රලේඛ වලට අනුකූල පරිදි වන බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ගනී.

## අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීම

රජය විසින් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හා සභාපතිවරයා පත් කිරීමේදී එම පත්කිරීම් විධිමත්, තරගකාරී හා වගකීම් සහිත ක්‍රියාවලියක් මගින් සිදුකෙරේ. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ හිමිකම් පටිපාටි හා වගකීම් පත්කිරීම් බලධාරියා විසින් පත් කිරීම් ලිපියේ නිශ්චිතව දක්වන අතර එය අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් විසින් පිළිගනී.

පත්කරන ලද හෝ පත් වූ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට, ඔහුට/ ඇයට නිශ්චිත වගකීම්, සමාගමේ උපාය මාර්ගික ඉලක්ක හා ආයතනික අරමුණු සහ සමාගමේ ආයතනික පාලනය, කළමනාකාරීත්ව හා පාලන පද්ධති සහ පරිපාටි පිළිබඳ අවශ්‍ය පැවරීමක් ලැබේ.

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

2014 වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩලය වාර 10 කදී රැස්වී තිබුණි. කළමනාකරණය විසින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා මගින් කාලීන හා අදාළ තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

## අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික

පාරිශ්‍රමික ප්‍රතිපත්ති හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට පාරිශ්‍රමික, රජය විසින් සකස් කරන ලද පාරිශ්‍රමික ප්‍රතිපත්ති හා පරිමාණයන් මත පදනම් වේ. ඔහු /ඇය පිළිබඳ පාරිශ්‍රමිකය තීරණය කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් එයට මැදිහත් නොවේ.

## සභාපති

සමස්ත ආයතනික ව්‍යුහයටම සභාපතිවරයාගේ කාර්ය භාරය ඉතා වැදගත් වන අතර ව්‍යාපාරය නිවැරදි මාර්ගයට යොමු කිරීමේ කාර්යය ඔහු සතු වේ. ආයතනික පාලනය පවත්වා ගැනීම, සියළු අධ්‍යක්ෂවරුන්ට සම සැලකීම, වගකීම නිවැරදිව බෙදාදීම, බලතල හා අධිකාරිය සමබරව තබා ගැනීම, සභාපතිවරයා තහවුරු කර ගනියි. රැස්වීම විධිමත්ව ඉදිරියට ගෙන යාම පිළිබඳ තහවුරු කර ගැනීම මගින් ඔහු සියළු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල සභාපතීත්වය දරයි. ඔහුගේ විශේෂිත දැනුම ඇති අංශ පිළිබඳ උපරිම දායකත්වය ලබාදෙමින් මෙහෙයුම් කටයුතුවලින් වැළකෙමින් ඔහු අධීක්ෂණ කාර්ය භාරයක් ක්‍රියාත්මක කරන අතර පූර්ව ක්‍රියාකාරී කාර්ය භාරයක් සිදු කිරීමට සියළු අධ්‍යක්ෂවරුන් දිරිගන්වයි.

## අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩලය හා වාර්ෂික රැස්වීම් පිළිබඳ පරිපාටි වලට අනුකූල වීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දීම, නීතිය හා අදාළ රීති හා රෙගුලාසි සහ විශ්වාසනීය හා අදාළ තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලයට හා වාර්ෂික රැස්වීමට කාලීනව ඉදිරිපත් කරන බවට තහවුරු කර ගැනීම සඳහා වගකිව යුතු වන වෘත්තීය සුදුසුකම් වලින් හෙබි ආයතනික ලේකම්වරයාගේ උපදෙස් හා සේවා සඳහා සියළු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ ප්‍රවේශය ඇත. අධ්‍යක්ෂ මණ්ඩල

රැස්වීම් පාලනය කෙරෙන පටිපාටි අනුගමනය කෙරෙන බවට හා මණ්ඩලයේ ඵලදායී ක්‍රියාකාරීත්වය ඇති බවට හා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා කාලීනව බෙදා හරින බවට ලේකම් තහවුරු කර ගනී. ඔහු මණ්ඩලයේ මෙහෙයුම්වලට බලපාන වගකීම්, රීති හා රෙගුලාසි පිළිබඳ මඟ පෙන්වීම් ලබාදෙන අතර සියළු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට උපදෙස් හා සහාය ලබා දේ.

## සාමාන්‍යාධිකාරී හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණය

සමාගමේ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ වගකීම සාමාන්‍යාධිකාරීවරයා හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සතුව පවතී. ප්‍රතිපත්ති පිළිබඳ ඵලදායී ක්‍රියාත්මකකිරීම් හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන තීරණ පිළිබඳ ඔවුන් වගකීම දරනු ලැබේ. සාමාන්‍යාධිකාරී හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම් විසින් හොඳින් සලකා බලා තීරණ ගැනීමට හැකිවන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත තොරතුරු හා අවශ්‍ය පැහැදිලි කිරීම් සපයයි. සමාගමේ අරමුණු හා ඉලක්ක ඉටු කර ගැනීම සඳහා ඔවුන් මෙහෙයුම් සැලසුම් හා අයවැය විධිමත්ව සකස් කරන අතර සමාගමේ ඵලදායී කළමනාරකණය උදෙසා පද්ධති, පරිපාටි හා පාලන පවත්වා ගනී.

සාමාන්‍යාධිකාරීවරයාගේ හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායමේ පාරිශ්‍රමිකයන් තීරණය කිරීම සඳහා පාරිශ්‍රමික ගෙවීම් යෝජනාක්‍රමයේ මාර්ගෝපදේශ සමාගම විසින් අනුගමනය කරයි.

## මූල්‍ය වාර්තාකරණය

සමාගමේ වාර්ෂික තත්ත්වය හා කාර්යසාධනය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන පරිදි වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට හා 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුකූලව සිදු කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලයට හා සාමාන්‍යාධිකාරීට සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයට තම වගකීම් ඵලදායීව සම්පූර්ණ කර ගැනීමට හැකිවන පරිදි කාලීනව හා ඔවුන්ට අවශ්‍ය විශ්වාසනීය තොරතුරු පිළිබඳව සම්පූර්ණ හෙළිදරව් කිරීම් හා විනිවිදභාවය ආයතනය තුළ බල පැවැත්වේ.

## වාර්ෂික විගණනය

විගණකාධිපතිවරයා/ මහා භාණ්ඩාගාරය විසින් වරලත් ගණකාධිකාරී ලැයිස්තුවෙන් අනුමත කරන ලද හා විගණන කමිටුවේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශය පරිදි වාර්ෂික රැස්වීම් මගින් පත්කර ගන්නා ලද බාහිර විගණකවරයකු මගින් සමාගමේ වාර්ෂික විගණනය සිදු කරනු ලැබේ. වාර්ෂික විගණන වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර අනුමැතිය සඳහා වාර්ෂික රැස්වීමට ඉදිරිපත් කරනු ලැබේ. ආයතනය විගණනයේදී එහි අපක්ෂපාතී බවට හා ස්වාධීන විනිශ්චය සඳහා අපකීර්තියක් ඇතිවන උපදේශක සේවා හෝ වෙනත් සේවා සමාගමට සැපයීමෙන් බාහිර විගණක වැළකෙන අතර සෑම වර්ෂ පහකට වරක් බාහිර විගණක වරුන් වෙනස් කරනු ලැබේ.

## විගණන හා අවදානම් කළමනාකරණ කමිටුව

සමාගමේ විගණන හා අවදානම් කළමනාකරණ කමිටුව එහි අධ්‍යක්ෂ මණ්ඩලයට පාලන කාර්යයන් පහසු කරමින් වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. සමාගමේ විගණන කමිටුව මූල්‍ය කළමනාකරණ කුසලතා සහිත භාණ්ඩාගාර නියෝජිතයෙක් ඇතුළත්ව විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. භාණ්ඩාගාර නියෝජිතයා විගණන කමිටුවේ සභාපතීත්වය දරයි.

## සමාගමේ සංවිධාන ව්‍යුහය




නි.ක - නියෝජ්‍ය කළමණාකරු
ස.ක - සහකාර කළමණාකරු
ක.කා - කණිෂ්ඨ කළමණාකරු
ක.ස. - කළමණාකාර සහකරු

ප්‍රා.ශ්‍රේ.ශි.සේ - ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය සේවක හවතුන්
ප්‍රා.අ.ශි.සේ - ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවක හවතුන්
ප්‍රා.ශි.නො.සේ - ප්‍රාථමික ශිල්පීය නොවන සේවක හවතුන්



## තේ වගාව සඳහා

ටී - 65, ටී - 200, ටී - 750, යූටී - 1625, යූටී - 397,
යූටී - 752, වී.පි.එල්.සි. - 880, වී.පි.එල්.සි. - 945, වී.පි.යූ.එම්. - 910,
යූ – 625, එස්.ටි./යූ.එම්. - 400, එස්.ටි.යූ.වී.ඒ. - 435,
යූ - 709 වැනි විශේෂ නිෂ්පාදන අපි සපයන්නෙමු.



# අපගේ භූගෝලීය ආවරණය

**53** දීපව්‍යාප්ත පොහොර බෙදාහැරීම් ජාලය.....

**සීමාසහිත ලංකා පොහොර සමාගම**

දීපව්‍යාප්ත පොහොර බෙදාහැරීම් ජාලය

- ප්‍රධාන කාර්යාලය හා මධ්‍යම ගබඩා සංකීර්ණය
- ප්‍රාදේශීය ගබඩා සංකීර්ණය
- ප්‍රාදේශීය පොහොර ගබඩා

**උතුරු පළාත**
කොණ්ඩවිල්
කිළිනොච්චි
වරණි
ඕලුමඩු
මුරන්කන්

**උතුරු මැද පළාත**
පදවිය
මැදවච්චිය
හොරොව්පතාන
නොච්චියාගම
කිරලෝගම
හිඟුරක්ගොඩ
වැලිකන්ද
පොළොන්නරුව

**වයඹ පළාත**
ආණමඩුව
මහව
කුලියාපිටිය
කුරුණෑගල
නාත්තණ්ඩිය
පොල්ගහවෙල

**මධ්‍යම පළාත**
දඹුල්ල
නාගොල්ල
මාතලේ
ගම්පොල
රිකිල්ලගස්කඩ
නුවර-එළිය

**නැගෙනහිර පළාත**
ත්‍රිකුණාමලය
කන්තලේ
මඩකලපුව
දෙහිඅත්තකණ්ඩිය
සමන්තුරෙයි
අම්පාර
පොතුවිල්

**බස්නාහිර පළාත**
හුණුපිටිය
දොඩංගොඩ
මතුගම
පැලවත්ත

**සබරගමුව පළාත**
කෑගල්ල
කුරුවිට
ඇඹිලිපිටිය

**ඌව පළාත**
මහියංගනය
බිබිල
බදුල්ල
වැලිමඩ
මොණරාගල
වැල්ලවාය

**දකුණු පළාත**
සූරියවැව
වීරවිල
දෙහිගහලන්ද
වීරකැටිය
බට-අත
මැදවියන්ගොඩ
අකුරැස්ස
කොග්ගල



# අවදානම් කළමනාකරණය




## අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

ආයතනයක හෙළිදරව් වන අවදානම හඳුනාගැනීම හා අවබෝධ කර ගැනීම අවදානම් කළමනාකරණය නිශ්චය කර ගනී. පාඩු වලක්වා ගැනීමට හා පාඩුවක් සිදු වූ විට එහි බලපෑම අවම කර ගැනීමට ආයතනය විසින් ඵලදායී සැලැස්මක් ඇති කර ක්‍රියාත්මක කරන බවට අවදානම් කළමනාකරණය සහතික සපයයි. එසේම අවදානම් කළමනාකරණය අවදානම් හඳුනා ගැනීම සඳහා නිරවුල් සහ ව්‍යුහාත්මක ප්‍රවේශයක් සපයයි. සියළුම අවදානම් පිළිබඳ නිරවුල් අවබෝධයක් ලබා ගැනීමෙන් ආයතනයකට ඒවා තක්සේරු කර හා ප්‍රමුඛතාකරණය සඳහා ඉඩ ලැබෙන අතර එම අවදානම් අඩුකර ගැනීම සඳහා අදාළ පියවරයන් ගැනීමටද හැකි වේ.

අවදානම් හඳුනාගැනීම, ඇගයීම, මගහැරීම අවම කිරීම හා මාරුකිරීම සඳහා සමාගම වහාම ස්ථාපිත කල ක්‍රියාවලියක් අනුගමනය කර ඇත. අපගේ අවදානම් කළමනාකරණ පද්ධතියේ මූලික ඉලක්කය, අවදානම් පිළිබඳ සම්පූර්ණ සුපරීක්ෂාකාරීත්වය පදනම් කරගෙන අපගේ ව්‍යාපාරයේ මෙහෙයුම් පහසුකරලීමට සහාය සඳහා වේ.

අනිත් සියළුම කාර්යයන්ට වඩා අවදානම් හඳුනා ගෙන තක්සේරු කිරීම ඒ අනුව පෙරට එයි. ඊළඟට හඳුනාගත් අවදානම් වළක්වා ගැනීමට, අවම කරගැනීමට හා මාරු කර ගැනීමට යොදාගත හැකි උපාය මාර්ග සැලසුම් කෙරේ. සමාගමේ මෙහෙයුම් සඳහා මූලික වූ අවදානම් කළමනාකරණය සඳහා ඵලදායී අවදානම් කළමනාකරණ පද්ධතියක් තිබෙන බවට සමාගමේ අධ්‍යක්ෂවරුන් තහවුරු කර ගෙන ඇත.

## ප්‍රධාන අවදානම් සාධක

අවදානම් සාධක කිහිපයක් සඳහා අපගේ ව්‍යාපාරය තුළ අනාවරණයන් ඇති අතර මෙහෙයුම් පරිසරය තුළ අවිනිශ්චිතතාවන් සිදු වේ. සමාගම මුහුණ දෙන එම අවදානම් සාධක හා සමාගම ඒවා අවම කිරීම සඳහා ගනු ලැබූ පියවරයන් පහත දැක්වේ. එහෙත් අවදානම් සාධක එම ලැයිස්තුවෙන් සීමා නොකෙරේ. සමාගමේ ක්‍රියාකාරීත්වය සඳහා බලපාන වෙනත් සාධක ඇතිවාක් මෙන්ම සමාගම ඒ පිළිබඳ දැනුවත් නැත.

## උපාය මාර්ගික අවදානම

අපගේ උපාය මාර්ගික අභිප්‍රායන් තුළ කාවැදී ඇති අවිනිශ්චිතතාවයන් හා අභාවිත අවස්ථාවන් හේතුවෙන් මුහුණ දෙන අවදානම් උපායමාර්ගික අවදානමයි. මෙම අවදානම් ප්‍රධාන වශයෙන් ආයතනයේ අරමුණු වලට අදාළව අධ්‍යක්ෂවරුන් විසින් සිදුකරන මූලික තීරණයන්ගෙන් පැන නගී. උපාය මාර්ගික අවදානම පිටුපස ඇති මූලික සංකල්පය අපගේ යෝජිත ආයතනික අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වීමයි. මේ සම්බන්ධයෙන් වර්ෂ 5 ක සංයුක්ත සැලැස්ම වර්ෂ 3 ක ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික සැලසුම් මත අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකරණ කණ්ඩායම විසින් ක්‍රමවත් පසු විපරම් කාර්යයන් සිදු කරනු ලබයි.

උපාය මාර්ගික අවදානම් පිළිබඳ උප අංශයන් පහත පරිදි වේ.

## ව්‍යාපාර අවදානම්

නිෂ්පාදනය, අලෙවිකරණය හා නිෂ්පාදන විකිණීම සම්බන්ධ අවදානම, නිෂ්පාදන පිරිවැයට බලපාන ආර්ථික අවදානම, තාක්ෂණික පරිසරය හා ගණුදෙනුකරුවන්ගේ කැමැත්ත වෙනස්වීමෙන් පැනනගින අවදානම මෙම අවදානමට ඇතුළත් වේ. අපගේ ව්‍යාපාරය ආශ්‍රිත ප්‍රධාන අභ්‍යන්තර අවදානම් වන්නේ පවත්නා නිෂ්පාදන පිළිබඳ නොහැකියාව සහ නව නිෂ්පාදන සංවර්ධනයන් සමඟ සම්බන්ධිත අවදානමය.

පවත්නා නිෂ්පාදනයේ නොහැකියාව පිළිබඳ හේතු සතර ආකාර වේ. එනම් ගනුදෙනුකරු අවශ්‍යතා, තාක්ෂණය, කර්මාන්ත හා ආර්ථික කරුණු සහ න්‍යායාත්මක අවශ්‍යතාවන්ය. සමාගම ගනුදෙනුකරු තෘප්තිය පිළිබඳ සමීක්ෂණ හා ඔවුන්ගේ අවශ්‍යතා වෙනස්වීම පිළිබඳ ඇගයීම ක්‍රමවත්ව සිදු කරනු ලබයි. සමාගම ඉදිරියට විය හැකි රෙගුලාසි හා නිර්දේශවල වෙනස්වීම් හඳුනා ගැනීම සඳහා රජය, පොල් පර්යේෂණ ආයතනය, තේ පර්යේෂණ ආයතනය හා රබර් පර්යේෂණ ආයතනය වැනි ප්‍රධාන නීත්‍යානුකූල මණ්ඩල හා ආයතන සමඟ සමීප සම්බන්ධතාවයකින් යුතුව කටයුතු කරයි.

වෙළඳපොළ හා පාරිභෝගික අවශ්‍යතා පිළිබඳ පරිපූර්ණ අධ්‍යයනයකින් පසුව පමණක් නව නිෂ්පාදන වෙළඳපොළට හඳුන්වා දෙනු ලැබේ.

## ව්‍යාපාර නොවන අවදානම

මෙම අවදානම් සමාගමේ ප්‍රධාන ව්‍යාපාරයට අදාළ නොවන අතර ප්‍රධාන වශයෙන් දිගුකාලීන මූල්‍යයනයට අදාළ වේ. වර්ෂ 5 ක් සඳහා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම හා වර්ෂ තුනක් සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලසුම් මගින් සමාගමේ දිගුකාලීන මූල්‍ය අවශ්‍යතාවයන් කලින් තක්සේරු කර මෙම මූල්‍ය අවශ්‍යතාවයන් ඉටු කර ගැනීම සඳහා ප්‍රභවයන් හඳුනා ගැනේ. පිළියෙල කරන ලද වාර්ෂික අයවැයෙන් හා ප්‍රසම්පාදන සැලැස්මෙන් සමාගමට ගලාඑන මුදල් ප්‍රවාහය හා ගලා යන මුදල් ප්‍රවාහය කාර්යක්ෂම වන අතර කිසිදු ක්ෂණික මූල්‍ය අවශ්‍යතාවයන් ඇති නොවේ.

## මෙහෙයුම් අවදානම

ආයතනයේ බිම් මට්ටමින් කුමක් සිදුවන්නේද යන්න පිළිබඳ දැනුවත්වීම මෙයින් යොමු කෙරේ. ප්‍රධාන වශයෙන් අභ්‍යන්තර සම්පත්, පද්ධති, ක්‍රියාවලීන්

හා ආයතනයේ සේවකයන් සමග මෙහෙයුම් අවදානම් සම්බන්ධ වේ. ගබඩා හා යන්ත්‍ර ක්‍රියාවිරහිත වීම්, සේවක පිරිවැටුම හා අහිතකර දේශගුණික තත්ත්වයන් වැනි ස්වභාවික සිදුවීම් මෙයට ඇතුළත් වේ.

- ප්‍රමාණවත් ගිනි නිවන උපකරණ, අනතුරු සංඥා ඇතුළත් විශාල ගිනි ආරක්ෂණ පද්ධතියක් සමාගම විසින් පවත්වා ගෙන යන අතර වර්ෂය තුළ සියළුම සේවකයන් සඳහා ගිනි ආරක්ෂණ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.
- ගිනි ගැනීමක් සිදුවීමෙන් වන හානි ආවරණය කරගැනීම සඳහා සමාගම විසින් ගිනි ආරක්ෂණයක් ලබා ගෙන ඇති අතර ඉතා සංවේදී රසායනාගාර උපකරණ සඳහා අමතර විද්‍යුත් රක්ෂණයක් ලබාගෙන ඇත.
- සොරකම් හා දූෂණ වලින් වන බලපෑම අවම කිරීම සඳහා මාර්ගස්ථ මුදල් හා මුදල් සේප්පු රක්ෂණ ලබා ගෙන ඇත.
- එක් එක් ආනයනය කරන නැව් බඩු ප්‍රමාණය සඳහා ප්‍රමාණවත් නාවික රක්ෂණ සහතික ලබා ගැනේ.
- සමාගමේ මුදල් හා මුදල් නොවන සේවක පෙළඹවීම් වැඩසටහන් හේතුවෙන් සමාගමේ සේවක පිරිවැටුම අඩු මට්ටමක පවතී.

## මූල්‍ය අවදානම

ණය අවදානම, ද්‍රවශීලතා අවදානම හා මූල්‍ය උපකරණ යොදාගැනීමේදී වන වෙළඳපොළ අවදානම ඇතුළත් මූල්‍ය, අවදානම සමාගම සතුව ඇත.

## ණය අවදානම

සමාගමේ ගිවිසුම්ගත වගකීම් සඳහා මුහුණ දීමට ප්‍රතිපාර්ශ්වයට නොහැකි වේ නම් ණය අවදානම සමාගමේ මූල්‍ය පාඩුව පිළිබඳ අවදානමයි. ප්‍රධාන වශයෙන් ණය අවදානම පැන නගින්නේ සමාගම විසින් සිදු කරන ණයට විකුණුම් හා මූල්‍ය ආයතන සමඟ පවත්නා තැන්පතු හේතුවෙනි. තවද, ණය අවදානම අවම කර ගැනීම සඳහා

- බෙදාහරින්නන් පත් කිරීමට පෙර ප්‍රාදේශීය අලෙවි කළමනාකරුවන්, ප්‍රධාන අභ්‍යන්තර විගණක, මූල්‍ය කළමනාකරු හා සමාගමේ නීති නිලධාරීගෙන් සමන්විත කණ්ඩායමක් විසින් එක් එක් පුද්ගලයාගේ ණය ගෙවීමේ හැකියාව පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් කරනු ලැබේ.
- බෙදුම්කරුවන්ගෙන් මෙන්ම ප්‍රතිපාර්ශ්වකරුවන්ගෙන් ණය පහසුකම් ලබාදීමට පෙර බැංකු ඇපකර ලබා ගනී.
- එක් එක් බෙදුම්කරුවන් සහ ප්‍රතිපාර්ශ්වකරුවන් සඳහා ණය විශ්ලේෂණයේදී ඇති කර ගත් නිගමන අනුව ණය කාල සීමාවන් සහ වටිනාකම් සීමාවන් දක්වා ඇත.

## ද්‍රවශීලතා අවදානම

සමාගම මූල්‍ය වගකීම්වලට මුහුණ දීමට නොහැකිවීම ද්‍රවශීලතා අවදානමයි. ද්‍රවශීලතාවය කළමනාකරණය කිරීමේ සමාගමේ ප්‍රවේශය, සාමාන්‍ය හා අනපේක්ෂිත අවස්ථාවල පැනනගින වගකීම් වලට මුහුණ දීමට හැකිවීම සඳහා ප්‍රමාණවත් මුදල් ඇති බවට තහවුරු කර ගැනීමයි. වර්ෂ පහක් සඳහා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම, වර්ෂ තුනක් සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම, සමාගමෙන් පිටතට මුදල් ප්‍රවාහය පිළිබඳ පූර්ව තක්සේරුව සහ මෙම මුදල් ප්‍රවාහයන් පිළිබඳ ප්‍රභවයන් හඳුනා ගන්නා අතර සමාගමේ පිළියෙල කරන ලද වාර්ෂික අයවැයෙන් හා ප්‍රසම්පාදන සැලැස්මෙන් සමාගමට ගලා එන මුදල් ප්‍රවාහය හා සමාගමෙන් පිටතට ගලා යන මුදල් ප්‍රවාහය කාර්යක්ෂම කෙරෙන අතර සියළුම මූල්‍ය වගකීම් පියවීම සඳහා පහසුකම් සපයයි.

## වෙළඳපොළ අවදානම

විදේශ විනිමය අනුපාතයන්ගේ (හුවමාරු මුදල් අවදානම) වෙනස්වීම් හා පොලී අනුපාතයන් වෙනස් වීම (පොලී අවදානම) හේතුවෙන් වෙළඳපොළ මිල වෙනස්වීම වෙළඳපොළ අවදානම වන අතර සමාගමේ ආදායමට හෝ මූල්‍ය උපකරණ පවත්වා ගැනීමේ ධාරණ අගයට මෙය බලපානු ලැබේ.

## හුවමාරු මුදල් අවදානම

එක්සත් ජනපද ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියල් වටිනාකම උච්චාවචනයන්ගෙන් සමාගමේ මුදල් හුවමාරු අවදානමට පාත්‍රවීම පැන නගී.

## පොලී අවදානම

ස්ථිර පොලී අනුපාතයකට හා බැංකු තැන්පතු සමඟ පොලිය දරා සිටින ණය ගැණුම් සඳහා වෙළඳපොළ පොලී අනුපාතයන් වෙනස්වීම, සමාගම පොලී අවදානමට පාත්‍රවීමයි.

## නියාමන අවදානම

පොහොර ආනයනය, නිෂ්පාදනය, බෙදාහැරීම හා පරිභෝජනය සම්බන්ධයෙන් සහ පොල් පර්යේෂණ මණ්ඩලය, තේ පර්යේෂණ ආයතනය සහ රබර් පර්යේෂණ ආයතනය වැනි රජයේ ආයතන විසින් නියම කරන ලද නිර්දේශ සම්බන්ධයෙන් රජයේ රෙගුලාසි වෙනස් කිරීමේදී එම හැකියාවද සමාගමට ඇත. නියාමන පරිසරයේ විය හැකි ඕනෑම වෙනස්වීමක් හඳුනාගැනීමේදී සමාගම මෙම ආයතන සමඟ සමීපව කටයුතු කරයි.

# විගණන හා අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

සාධනීය මෙහෙයුම් සඳහා තීරණ ගනු ලබන්නේ කමිටුව මගින් සිදුකරනු ලබන පරීක්ෂාකාරී විචාරණයෙන් පසුවය

## කමිටු සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන හා අවදානම් කමිටුව පත් කර ඇත. කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් හා මහා භාණ්ඩාගාරයේ නියෝජිතයා වන කමිටු සභාපතිවරයාගෙන් සමන්විත වේ. කමිටු සාමාජිකයන් මූල්‍ය, නීති හා වෙනත් අදාළ කරුණු කළමනාකරණයේදී හසළ දැනුමක් ඇති බවට මණ්ඩලය තහවුරු කරගෙන ඇත.

## කමිටු රැස්වීම් හා පැමිණීම

2014 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී වාර 11 ක් විගණන කමිටුව නියමාකාරයෙන් රැස්වී ඇත. අවශ්‍ය අවස්ථාවලදී සාමාන්‍යාධිකාරී අදාළ අංශ ප්‍රධානීන් හා වෙනත් නිලධාරීන් විමසුම් සම්බන්ධයෙන් කමිටුවට පැමිණ පැහැදිලි කිරීම් ලබා දේ. අභ්‍යන්තර විගණක, විගණන හා අවදානම් කමිටුවේ කැඳවුම්කරු ලෙස කටයුතු කරයි. ඒ අනුව කමිටුවේ නිර්දේශ හා වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරනු ලැබේ. බාහිර විගණකද නිරීක්ෂණයකු ලෙස කමිටු රැස්වීම්වලට සහභාගී වේ.

## කමිටුවේ කාර්යයන්

කමිටුව එහි පුළුල් පලපුරුද්ද, අවබෝධය හා කෘතහස්ත විශේෂඥතාවය පිළිබඳ සහාය සමාගමේ අභ්‍යන්තර පාලන හා අවදානම් කළමනාකරණ පද්ධති ප්‍රමාණවත් බව හා උසස් පරිචයන්ට අනුකූලව ව්‍යාපාරය පවත්වා ගන්නා බව තහවුරු කර ගැනීම සඳහා වන අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යය සඳහා භාවිතා කරයි.

- අභ්‍යන්තර විගණන අංශය පිළිබඳ වගකීම් නිශ්චය කර ගැනීම හා වාර්ෂික විගණන සැලසුම් සමාලෝචනය කිරීම.
- ආයතනයේ සියළු කාර්යයන් සඳහා අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය හා ඇගයීම.
- පිරිවැය ඵලදායී බව සඳහා සහ වියදම් ඉවත් කිරීම් ආදිය පිළිබඳ ක්‍රමවත් කාල පරාසයන්හි කාර්ය සාධනය සමාලෝචනය.
- බාහිර විගණකවරුන් සමඟ සාකච්ඡා කිරීම හා විගණක කළමනාකරණ ලිපිය පිළිබඳව පසු විපරම් සිදු කිරීම
- ව්‍යවස්ථාවලින්, රෙගුලාසිවලට, රීතිවලට හා චක්‍රලේඛ වලට අනුකූල වන්නේද යන්න පිළිබඳ තහවුරු කර ගැනීම
- ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන බවට තහවුරු කර ගැනීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය
- පිළියම් ක්‍රියාමාර්ග සඳහා අභ්‍යන්තර විගණන/ බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි සමාලෝචනය
- රාජ්‍ය ව්‍යාපාර කමිටුවේ නිර්දේශ/ නියෝග ක්‍රියාත්මක කිරීම පිළිබඳ සමාලෝචනය

## කමිටුවේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම

### අභ්‍යන්තර විගණන කාර්යයන්

ඉහත සඳහන් කරන ලද කාර්යයන් ක්‍රියාත්මක කරවීමේ අරමුණින් සමාගම අභ්‍යන්තර විගණන ඒකකය මනාව සංවිධානය කර ඇත. මෙම අංශය මූල්‍ය ගිණුම්කරණය, විගණනය හා ව්‍යාපාර පරිපාලනය ක්ෂේත්‍රය පිළිබඳ පළපුරුදු වෘත්තිකයන්ගෙන් සමන්විත වේ.

අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන අරමුණු වන්නේ :

- ගිණුම්කරණය හා අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය
- මූල්‍ය හා මෙහෙයුම් තොරතුරු පරීක්ෂා කිරීම
- මෙහෙයුම් පිළිබඳ ආර්ථිකභාවය, කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය සමාලෝචනය
- සැලසුම් කළ පරිදි මෙහෙයුම් හා වැඩ සටහන් ක්‍රියාත්මක කරන බවට සහ ස්ථාපිත ඉලක්ක හා අරමුණු සමඟ මෙහෙයුම් ප්‍රතිඵල අනුරූප වන බවට සාධාරණ තහවුරුවක් සමඟ මෙහෙයුම් සහ කළමනාකරුවන්ට සපයන ලද වැඩ සටහන් පිළිබඳ පාලනයන් සිදුවන්නේද යන්න නිශ්චය කර ගැනීමට

- නීති, රෙගුලාසි හා වෙනත් බාහිර අවශ්‍යතාවයන් සහ කළමනාකරණ ප්‍රතිපත්ති සමඟ අනුකූල වන බවට සමාලෝචනය

- විශේෂ විමර්ශන පැවැත්වීම

වාර්තාකරණ කාලය තුළදී විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචනය කරන අතර ක්‍රමවත් පදනමක් මත අභ්‍යන්තර විගණන කාර්යයේ ඵලදායීතාවය අධීක්‍ෂණය කරනු ලැබේ. විගණනයන් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට ඔවුන්ට ප්‍රමාණවත් ප්‍රවේශයක් ඇති බවට තහවුරු කර ගැනීම සඳහා කමිටුව වගකිව යුතු වේ. සමාලෝචිත වර්ෂය තුළදී අභ්‍යන්තර විගණකවරුන්ගේ වාර්තා සලකා බැලීම, කළමනාකරණයේ ප්‍රතිචාර හා අභ්‍යන්තර පාලනයන් පිළිබඳ ඵලදායීතාවය සම්බන්ධයෙන් අවශ්‍ය පසුවිපරම් කරුණු සහ විගණන නිර්දේශයන් පිළිබඳ සලකා බැලීම සඳහා විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණකවරුන් සමඟ සාකච්ඡාවන් පවත්වා ඇත.

අභ්‍යන්තර විගණනයේ වාර ගණන එක් එක් අංශ පිළිබඳ අවදානම් පැතිකඩ අනුව වන අතර අවදානම් කළමනාකරණය සඳහා ප්‍රශස්ථ විසඳුම මෙම පදනම බව කමිටුවේ මතය විය. සහනාධාර පොහොර බෙදාහැරීමේදී වන දූෂණ හා වංචා වලක්වා ගැනීමේ අරමුණින් ආයතනයට තොරතුරු ලබාදීමට මහජනයාට හැකිවන පරිදි ඔවුන්ගේ රහස්‍යභාවය තහවුරු කරමින් විශේෂ සන්නිවේදන ජාලයක් ස්ථාපිත කරන ලදී. තවද කෘෂිකර්ම අමාත්‍යාංශයේ පවත්වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලට සමාගමේ ප්‍රධාන අභ්‍යන්තර විගණක කාර්තුමය පදනමින් වැදගත් විමසුම් කරුණු සාකච්ඡා කිරීම සඳහා සහභාගී වේ. තවද විගණකාධිපති දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව හා සමාගමේ නීති නිලධාරීන් විසින් මෙම කරුණු පිළිබඳව දෙන ලද සහාය කෘතඥතා පූර්වකව අගය කරමි.

## බාහිර විගණනය කාර්යය

සමාගමේ බාහිර විගණක වන්නේ ස්වාධීන වරලත් ගණකාධිකාරී ආයතනයක් වන ප්‍රනාන්දු + හේවගේ (වරලත් ගණකාධිකාරීන්) සමාගමයි. 2014 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ බාහිර විගණනය සිදු කිරීම පිළිබඳව විගණකවරුන් සමඟ කමිටුව සාකච්ඡා පවත්වන ලදී.

## කමිටුවට සහාය

අවශ්‍ය අවස්ථාවලදී කමිටුවට අවශ්‍ය සහාය සභාපති ඇතුළු කළමනාකරණ කමිටුව විසින් ලබා දෙන අතර වාර්තාකරණ කාලය තුළදී ඵලදායීව සේවා ලබා දීම සඳහා එය කමිටුවට මහත් රුකුලක් වේ.

## කමිටු ඇගයුම

අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් කමිටුවේ කාර්ය සාධනය ඇගයීම් කරන අතර ස්වකීය සමාලෝචනයද කරනු ලැබේ. කමිටුවේ කාර්ය සාධනය ඵලදායී බවට අධ්‍යක්‍ෂ මණ්ඩලය නිගමනය කර ඇත.



**එච්.එම්. අජිත්චන්ද්‍ර**
(අතිරේක අධ්‍යක්‍ෂ ජනරාල්)
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව)
කමිටු සභාපති
2014 අගෝස්තු 26 දින





# මූල්‍ය ප්‍රකාශන

2014.03.31 දිනෙන්
අවසන් වර්ෂය සඳහා
ලංකා පොහොර සමාගම

# අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශනය

2007 අංක 07 දරණ සමාගම් පනතේ අංක 150(1) සහ 151 වගන්තීන්ට අනුව එහි සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල වන ආකාරයෙන් සෑම මූල්‍ය වර්ෂයක් සඳහාම සමාගමේ කටයුතු සහ සමාගමේ ලාභ අලාභ ගිණුමෙහි සත්‍ය හා සාධාරණත්වය පිළිඹිබු වන ආකාරයෙන් මූල්‍ය ප්‍රකාශන සකස් කරන බවට අධ්‍යක්ෂකවරුන් වගකිව යුතු වේ.

මූල්‍යමය තත්වය සාධාරණ නිර්වද්‍යතාවයකින් තීරණය කිරීමට ඉවහල් වන පරිදි විධිමත් ලේඛන පවත්වාගෙන යන බවට, මූල්‍ය ප්‍රකාශන සකස් කරන බවට සහ එම ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන නියමාකාරයෙන් සිදුවන බවට අංක 148 වගන්තියට අනුව අධ්‍යක්ෂකවරු වගකිව යුතු වේ.

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශ වල අවංකභාවය හා වාස්තවිකතාවය පිළිබඳ වගකීම අධ්‍යක්ෂක මණ්ඩලය භාර ගනි. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ගණුදෙනු වල ස්වරූපය හා අන්තර්ගතය නිසි අයුරින් පිළිඹිබු වන සාධාරණ හා විචක්ෂණ විනිශ්චයන්ට එළෙඹෙින් උචිත ගිණුම් ප්‍රතිපත්ති සංගතභාවයකින් යුතුව තෝරාගෙන භාවිතා කළ බවට අධ්‍යක්ෂවරුන් සහතික කරති.

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම පනතට හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කරන ලද බවට ද අධ්‍යක්ෂක මණ්ඩලය සහතික කරති.

තවද, මෙම මූල්‍ය ප්‍රකාශන සමාගම් පනත යටතේ අවශ්‍ය තොරතුරු සම්පාදනය කරනු ලබන අතර, අධ්‍යක්ෂකවරුන් තමන් සතු සමාගම පිළිබඳ දැනීම, ප්‍රධාන මෙහෙයුම් හා සමාගමේ අඛන්ඩ පැවැත්ම පිළිබඳ නිශ්චිත තොරතුරු මත පදනම්ව තම මතය ඉදිරිපත් කරයි. මෙම මූල්‍ය ප්‍රකාශන එම පදනම මත පිළියෙල කර ඇත.

සමූහයේ වත්කම් සුරැකීම පිළිබඳව අධ්‍යක්ෂකවරුන් සාධාරණ පියවර ගෙන තිබෙන අතර, වංචා හා වෙනත් අක්‍රමිකතාවයන් වලක්වා ගැනීමේ අරමුණින් ඒ සම්බන්ධයෙන් උචිත අභ්‍යන්තර පාලන පද්ධති ස්ථාපිත කර තිබේ. සමාගම් පනතේ අංක 57 වගන්තිය යටතේ එවැනි බෙදාහැරීමකින් පසු සමාගමට නුබුන්වත්භාවය පිළිබඳව පරීක්ෂාවෙන් සාර්ථකව ලැබිය හැකි බවට ලැබී ඇති තොරතුරු මත සෑහීමකට පත් වී, සමාගම් පනතේ අංක 56(2) වගන්තිය අනුකූලව දැනට යෝජිත ලාභාංශ බෙදා හැරීමට අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇති අතර, යෝජිත ලාභාංශ සම්බන්ධයෙන් නුබුන්වත්භාවය පිළිබඳ ප්‍රකාශනයක් සමාගමේ විගණකවරුන්ගෙන් ඉල්ලා ඇත.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තම මතය ඇති කර ගැනීමට ඉවහල් වන උචිත යැයි හැගෙන පරීක්ෂා කිරීම් සිදු කිරීමට පසුගිය වාර්ෂික මහා සභා රැස්වීමේදී භාහිර විගණකයන් වශයෙන් පත්කර ගනු ලැබූ ප්‍රනාන්දු සහ හේවගේ සමාගමට සෑම අවස්ථාවක්ම සලසා තිබුණි.

මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකවරුන්ගේ මතය 61 පිටුවේ විස්තර වේ.
අනුකූලතා වාර්තාව

සමාගමේ සේවකයන් හා රජයට අදාළව සමාගමෙන් එහි පරිපාලිත සමාගම් වලින් මූල්‍ය තත්ව ප්‍රකාශයේ දිනය වන විට ගෙවීමට නියමිත සියලුම නීතිප්‍රකාර ගෙවීම් සියලුම උපරිම දැනුම අනුව ගෙවා නිමකර ඇති බව හෝ අදාළ පරිදි ඒ වෙනුවෙන් ප්‍රතිපාදන සලසා ඇති බවට අධ්‍යක්ෂක මණ්ඩලය සහතික වේ.



**එස්.පි. මොරවක**
සමාගම් ලේකම්,
අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි,
සීමාසහිත ලංකා පොහොර සමාගමේදී,

2014 අගෝස්තු 26 දිනදී ය.

# සභාපතිවරයාගේ හා මූල්‍ය කළමණාකරුගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය

2014 මාර්තු මස 31 දිනට සීමාසහිත ලංකා පොහොර සමාගමේ මූල්‍ය ප්‍රකාශණ සකස් කර ඉදිරිපත් කරනු ලබනුයේ පහත දැක්වෙන අවශ්‍යතාවයන්ට අනුකූල වෙමිනි

- ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්
- 2007 අංක 07 දරණ සමාගම් පනත
- මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති සංයුත්ත පාලනය සම්බන්ධයෙන් හොඳම පරිචයන සංග්‍රහය.

මූල්‍ය ප්‍රකාශණවල, සටහන් යටතේ විස්තර කර ඇති පරිදි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී උපයෝගී කරගන්නා ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති උචිත පරිදි හා නිරන්තරයෙන් යොදාගත් බව අපි සනාථ කරමු. කිසිම අපගමනයකින් තොරව නිර්දිෂ්ඨ ගිණුම් ප්‍රමිතීන් යොදාගෙන තිබේ. ඉහල මට්ටමේ විචාර බුද්ධි ගෝචර හා සංකීර්ණ වැදගත් ගිණුම් ප්‍රතිපත්ති හා ඇස්තමේන්තු සම්බන්ධයෙන් විගණන කමිටුව සහ අපගේ බාහිර විගණකයින්ගේ අදහස් විමසන ලදී.

වත්කම් සුරැකීමේ, වංචා හා වෙනත් අක්‍රමිකතාවයන් වලක්වා ගැනීමේ හා අනාවරණය කරගැනීමේ අරමුණෙන් අභ්‍යන්තර පාලන පද්ධති හා ගිණුම් ලේඛන ස්ථාපිත කිරීමටද අප නිසි හා ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා ඇත. මේවා ඉදිරියටද ක්‍රියාත්මක වන පදනමක් මත සමාලෝචනයට, අගැයුමට හා යාවත්කරණයට ලක්වී තිබේ. සමාගමේ අභ්‍යන්තර විගණකයින් විසින් කලින් කලට කරන ලද විගණන තුළින් සමාගමේ ස්ථාපිත ප්‍රතිපත්ති හා පටිපාටි නින්තරයෙන්ම අනුගමනය වී තිබෙන බවට සාධාරණ සහතික වීමක් සැලසී ඇත. එසේවුවද, ඕනෑම අභ්‍යන්තර පාලන හා ගිණුම් තැබීමේ පද්ධතියක් තුළින් සැලසෙන සහතික වීම් කිරා කර බැලිමේදී හඳුනාගත යුතුවූ ආවේනික සීමාවන් තිබේ.

විගණනවල සඵලතාවය සමාලෝචනය කිරීමටත්, විගණනය කිරීම, අභ්‍යන්තර පාලනය හා මූල්‍ය වාර්තාකරණයේ ගැටලු ගැන සාකච්ඡා කිරීමටත් සමාගමේ විගණන කමිටුව කලින් කලට අභ්‍යන්තර විගණකයින්ට හා බාහිර විගණකයින්ට පූර්ණ හා නිදහස් අවසරය තිබේ.

ස්වාධීන බාහිර විගණකයින් වන ප්‍රනාන්දු සහ හේවගේ සමාගම (වරලත් ගණකාධිකාරීන්) විසින් මූල්‍ය ප්‍රකාශ විගණනය කරණ ලදී.

**බුද්ධික මඩිහේවා**
සභාපති

**ප්‍රියන්ත සමරවීර**
මූල්‍ය කළමණාකරු

2014 ජූලි 30

**ප්‍රනාන්දු + හේවගේ සමාගම**
(වරලත් ගණකාධිකාරීන්)
32, ප්‍රනාන්දු පෙදෙස, මොරටුව, ශ්‍රී ලංකාව
දුරකථන අංක: +94 11 2641589 ෆැක්ස්: +94 11 2641589 විද්‍යුත් තැපෑල: f_hco@sltnet.lk, gregory_f@sltnet.lk

**L.S.G. ප්‍රනාන්දු**
*MBA, BA, FCA, FIPFASL, DIP In ACC,*

# ස්වාධීන විගණකගේ වාර්තාව

## සීමාසහිත ලංකා පොහොර සමාගමේ කොටස්කරුවන් වෙතටය.

### මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වාර්තාව

2014 මාර්තු 31 දිනට සීමාසහිත ලංකා පොහොර සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වූ වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, කොටස් හිමියන්ගේ ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය, ගිණුම් පතිපත්ති හා අදාල ගිණුම් සටහන්ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලද අතර, ඒවා පිටු අංක 66 සිට 89 දක්වා ඇතුළත්ව ඇත.

### මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ කළමනාකරණ වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සත්‍ය හා සාධාරණ තත්වය නිරූපණය වන පරිදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. මෙම වගකීම්වලට, වංචා හෝ දෝෂ මත ඇතිවිය හැකි ප්‍රමාණාත්මක අව ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය හා සම්බන්ධවන අභ්‍යන්තර පාලන ක්‍රම සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමද, වඩාත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම හා භාවිතය සහ අවස්ථානුකූලව වඩා සාධාරණ ගිණුම්කරණ ඇස්තමේන්තුකරණය යනාදිය අයත් වේ. විගණක විෂය පථය හා විගණන මතය ප්‍රකාශ කිරීමේ පදනම

විගණකයින් වශයෙන් අපගේ වගකීම වන්නේ විගණනයෙන් හෙළිවන පරිදි මෙම මූල්‍ය වාර්තාවන් මත අපගේ මතය ප්‍රකාශ කිරීමයි. අපගේ විගණනය පවත්වාගෙන යන ලද්දේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලවය. ඒ අනුව ප්‍රමාණාත්මක වූ වැරදි සහගත ප්‍රකාශවලින්, අදාල මූල්‍ය වාර්තා තොර බව සාධාරණ ලෙස සහතික කළ හැකි වන පරිදි, අපගේ විගණනය සැළසුම් කර පවත්වාගෙන යන ලදී.
ඉහත සඳහන් මූල්‍ය වාර්තාවල ඇතුළත් සංඛ්‍යා පැහැදිලි කිරීම් සහ අදාල කරගත් ගිණුම් පතිපත්ති හා කළමනාකරුවන් කර ඇති ඇස්තමේන්තු යනාදිය තහවුරු කරගැනීමට අදාල සාක්ෂි නියදි පදනමක් යටතේ භාවිතා කළ අතර, මූල්‍ය ප්‍රකාශන ගිණුම් ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කර ඇත්දැයි යන්නද පරික්ෂා කරන ලදී.

විගණනය සඳහා අදාල වේ යැයි විශ්වාස කළ සියලුම තොරතුරු හා පැහැදිලි කිරීම් අප විසින් ලබාගන්නා ලදී. එම නිසා අප විසින් කරන ලද විගණනයෙන් ප්‍රකාශිත මතය සඳහා ප්‍රමාණවත් පදනමක් ලබාදෙන බව අපගේ විශ්වාසයයි.

### විගණන මතය

අපගේ නිරීක්ෂණයන්ගෙන් නිරූපණය වන අපගේ මතය වන්නේ 2014 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ගිණුම් වාර්තා නිසි පරිදි පවත්වාගෙන ගොස් ඇති බවත් 2014 මාර්තු 31 දිනට සමාගමේ මූල්‍ය තත්වය සහ ඒ දිනෙන් අවසන් වූ වර්ෂය තුළ ලබාගත් ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහයන් සාධාරණ ලෙස නිරූපණය වන පරිදි මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බවත්ය.

### අනෙකුත් නීති හා රෙගුලාසි අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

අපගේ මතය වන්නේ, මෙම මූල්‍ය වාර්තා 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 (2) දරන වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත්ය

Fernando + Hewage Co

**ප්‍රනාන්දු + හේවගේ සමාගම**
වරලත් ගණකාධිකාරීන්
2014 අගෝස්තු 28

# සීමාසහිත ලංකා පොහොර සමාගම

## 2014 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි

| | සටහන | 2014 මාර්තු | 2013 |
|---|---|---|---|
| අයභාරය | 3 | 2,563,549,727 | 2,450,132,816 |
| විකුණුම් පිරිවැය | 4 | (1,988,082,266) | (1,828,448,719) |
| **දළ ලාභය** | | **575,467,461** | **621,684,097** |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | 5 | 93,172,755 | 108,809,998 |
| පරිපාලන වියදම් | 6 | (447,891,771) | (472,067,026) |
| බෙදාහැරීමේ වියදම් | 7 | (57,427,928) | (74,037,323) |
| **මෙහෙයුම් ලාභය** | | **163,320,516** | **184,389,745** |
| ශුද්ධ මූල්‍ය ආදායම | 8 | 78,008,248 | 15,504,573 |
| **බදු පෙර ලාභය** | | **241,328,764** | **199,894,318** |
| ආදායම් බදු | 9 | (62,869,312) | (73,037,738) |
| **වර්ෂය සඳහා ලාභය** | | **178,459,452** | **126,856,580** |
| **කොටසක මූලික ඉපයුම** | **10** | **3.55** | **2.52** |
| වර්ෂය සඳහා ලාභය | | 178,459,452 | 126,856,580 |
| **අනෙකුත් විස්තරණ ආදායම්** | | **-** | **-** |
| **වර්ෂය සඳහා වන මුළු විස්තරණ ආදායම්** | | **178,459,452** | **126,856,580** |

වරහන් තුල අගයන් වලින් අඩුකිරීම් පෙන්නුම් කෙරේ.

අංක 66 සිට 89 දක්වා පිටුවල දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශවල සංකලිත කොටසක් වශයෙන් සැලකිය යුතුයි.

# සීමාසහිත ලංකා පොහොර සමාගම
## 2014 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මූල්‍ය තත්ව ප්‍රකාශය

සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි

| | සටහන | 2014 මාර්තු | 2013 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත හා උපකරණ | 11 | 1,879,174,306 | 1,882,887,059 |
| අස්පෘශ වත්කම් | 12 | 344,717 | 669,017 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **1,879,519,023** | **1,883,556,076** |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | 13 | 368,758,034 | 309,147,848 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 14 | 32,677,680,725 | 23,485,322,540 |
| කල් පිරීම සඳහා පවත්වාගෙන යන ආයෝජන | 15 | 369,088,140 | 338,620,163 |
| තැන්පතු | | 850,400 | 704,400 |
| අත්තිකාරම් සහ කලින් ගෙවූ වියදම් | | 26,488,734 | 2,345,327 |
| ව්‍යවස්ථාපිත ලැබිය යුතු දෑ | 16 | - | 34,439,690 |
| සේවක ණය හා අත්තිකාරම් | 17 | 33,926,652 | 42,364,042 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 18 | 768,606,041 | 228,474,651 |
| මුදල් හා මුදල් සමාන | 19 | 141,813,435 | 126,853,889 |
| **මුළු ජංගම වත්කම්** | | **34,387,212,161** | **24,568,272,551** |
| **මුළු වත්කම්** | | **36,266,731,182** | **26,451,828,627** |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| **හිමිකම්** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 20 | 502,456,080 | 502,456,080 |
| ප්‍රත්‍යගණන සංචිත | 21 | 1,835,723,580 | 1,835,723,580 |
| රඳවා ගත් ලාභ | | 1,500,363,432 | 1,397,891,510 |
| **මුලළු හිමිකම්** | | **3,838,543,092** | **3,736,071,170** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| සේවක පාරිතෝෂිත බැදීම | 22 | 50,189,133 | 44,748,577 |
| රාජ්‍ය පදාන | 23 | 9,981,441 | 17,343,307 |
| විලම්භිත බදු | 24 | 6,647,539 | 1,086,164 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **66,818,113** | **63,178,048** |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | 26 | 11,362,419,612 | 7,399,153,649 |
| ගෙවිය යුතු ණය | 25 | 20,646,483,768 | 14,954,413,210 |
| තැන්පතු හා අත්තිකාරම් ලැබීම් | 27 | 116,261,797 | 108,096,315 |
| ගෙවිය යුතු ලාභාංශ | | 52,930,556 | 15,000,000 |
| ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ | 28 | 4,771,727 | 1,314,401 |
| උපචිත වියදම් හා වෙන්කිරීම් | 29 | 172,963,926 | 122,220,294 |
| බැංකු අයිරා | 19 | 5,538,591 | 52,381,540 |
| **මුළු ජංගම වගකීම්** | | **32,361,369,977** | **22,652,579,410** |
| **මුළු හිමිකම හා වගකීම්** | | **36,266,731,182** | **26,451,828,627** |

සමාගමෙහි මෙම මූල්‍ය ප්‍රකාශණ කට්ටලය 2007 අංක 7 දරණ සමාගම්පනතෙහි අවශ්‍යතාවයන්ට අනුරූපව පිළියෙල කර ඇති බවට මම සහතික කරමි. අංක 66 සිට 89 දක්වා පිටුවල දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශවල සංකලික කොටසක් වශයෙන් සැලකීය යුතුයි.

මූල්‍ය කළමණාකරු

අධ්‍යක්ෂක මණ්ඩලය මෙම මූල්‍ය පකාශණ පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීමට බැදේ.

සභාපති

අධ්‍යක්ෂක

දිනය 31 අගෝස්තු 2014
කොළඹදීය
වරහන් තුල අගයන් වලින් අඩු කිරීම් පෙන්නුම් කෙරේ

# සීමාසහිත ලංකා පොහොර සමාගම
## 2014 මර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය

සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයී

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ප්‍රත්‍යගණන සංචිත | රදවාගත් ලාභ | එකතුව |
|---|---|---|---|---|
| **2012 අප්‍රේල් 01 දිනට ශේෂය** | 502,456,080 | 1,835,723,580 | 1,412,891,510 | 126,856,580 |
| ලාභාංශ | - | - | (15,000,000) | (15,000,000) |
| **2013 මාර්තු 31 දිනට ශේෂය** | **502,456,080** | **1,835,723,580** | **1,397,891,510** | **111,856,580** |
| වර්ෂය සඳහා ලාභය | - | - | 178,459,452 | 178,459,452 |
| **මුළු විස්තීර්ණ ආදායම්** | | | | **178,459,452** |
| ලාභාංශ 2012 /2013 | - | - | (23,056,974) | (23,056,974) |
| ලාභාංශ වෙන්කිරීම් 2013/2014 | - | - | (52,930,556) | (52,930,556) |
| **2014 මාර්තු31 දිනට ශේෂය** | **502,456,080** | **1,835,723,580** | **1,500,363,432** | **102,471,922** |

වරහන් තුල අගයන් වලින් අඩුකිරීම් පෙන්නුම් කෙරේ.

අංක 66 සිට 89 දක්වා පිටුවල දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශවල සංකලිත කොටසක් වශයෙන් සැලකිය යුතුයි.

# සීමාසහිත ලංකා පොහොර සමාගම
## 2014 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි

| | | 2014 | 2013 |
|---|---|---|---|
| මෙහෙයුම් කියාකරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශය | | | |
| බදු පෙර ලාභය | | 241,328,764 | 199,894,318 |
| **ගැලපීම්** | | | |
| ක්ෂයවීම් | | 26,339,772 | 35,042,042 |
| දේපල පිරියත හා උපකරණ නවීකරණය සඳහා වෙන්කිරීම | | - | 680,000 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක් ක්ෂය | | 324,300 | 208,884 |
| රාජ්‍ය පධාන ක්‍රමක් ක්ෂය | | (7,361,866) | (2,791,284) |
| දේපල පිරියත හා උපකරණ විකිණීමේ ලාභ අලාභය | | (2,277,722) | (867,702) |
| වෙළඳ ලැබිය යුතු දෑ සඳහා හානිකරණය | | 40,351,788 | 15,740,931 |
| වර්ෂය සඳහා සේවක පාරිතෝෂික වෙන් කිරීම් | | 7,144,846 | 6,679,983 |
| නිශ්චල තොග නවීකරණය | | (31,606) | 1,400,455 |
| නීතීමය වන්දි සඳහා වෙන් කිරීම | | 22,943,253 | 36,080,199 |
| පොලී ආදායම | | (97,262,460) | (56,041,160) |
| පොලී වියදම | | 19,254,213 | 40,536,587 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය** | | **250,753,282** | **276,563,253** |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්** | | | |
| තොගය | | (59,578,579) | 222,175,641 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | | (9,232,709,973) | (2,671,060,458) |
| තැන්පතු හා අත්තිකාරම් | | (146,000) | 4,706,651 |
| කලින් ගෙවූ වියදම් | | (24,143,407) | 8,803,740 |
| සේවක ණය හා අත්තිකාරම් | | 8,437,390 | (8,481,196) |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | | 3,963,265,963 | (7,264,318,480) |
| ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ | | (5,563,170) | - |
| තැන්පතු හා අත්තිකාරම් ලැබීම් | | 8,165,482 | 3,781,287 |
| උපචිත වියදම් හා වෙන්කිරීම් | | 27,800,379 | (4,466,431) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | **(5,063,718,634)** | **(9,432,295,993)** |
| ගෙවූ සේවක පාරිතෝෂිත | | (1,704,290) | (4,632,856) |
| ගෙවූ පොලී | | (19,254,213) | (40,536,587) |
| ගෙවූ බදු | | (9,428,723) | (39,694,372) |
| **මෙහෙයුම ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(5,094,105,859)** | **(9,517,159,808)** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ප්‍රකාශය** | | | |
| දේපල පිරියත හා උපකරණ අත්පත්කර ගැනීම් | | (22,628,659) | (10,707,368) |
| අස්පෘශ්‍ය වත්කම් අත්පත්කර ගැනීම් | | - | (877,901) |
| දේපල පිරියත හා උපකරණ විකිණීමෙන් ලැබූ මුදල් | | 2,279,362 | 1,523,729 |
| භාණ්ඩාගාර බිල්පත්වල ශුද්ධ ආයෝජන විකිණීම් | | (30,467,976) | 132,405,590 |
| අනෙකුත් මූල්‍ය වත්කම් ශුද්ධ ආයෝජන | | (540,131,390) | (90,712,583) |
| ලැබුණු පොලී | | 92,843,432 | 51,601,469 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(498,105,232)** | **83,232,936** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | | |
| වර්ෂය තුල ලාභාංශ ගෙවීම් | | (38,056,974) | (9,000,000) |
| වර්ෂය තුල ණය ගැණුම් | | 25,113,976,817 | 21,465,432,551 |
| වර්ෂය තුල ණය පියවීම් | | (19,421,906,258) | (11,880,949,269) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **5,654,013,585** | **9,575,483,282** |
| **මුදල් හා මුදල් හා සමාන දෑ වල වර්ෂය තුළ සිදුවූ ශුද්ධ වෙනස් වීම්** | | **61,802,494** | **141,556,410** |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් හා සමාන දෑ | | 74,472,349 | (68,398,461) |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් හා සමාන දෑ** | (සටහන 19) | **136,274,843** | **74,472,349** |

වරහන් තුල අගයන් වලින් අඩුකිරීම් පෙන්නුම් කෙරේ.

අංක 66 සිට 89 දක්වා පිටුවල දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශවල සංකලිත කොටසක් වශයෙන් සැලකිය යුතුයි.

## 1 ආයතනික තොරතුරු

### 1.1 සාමාන්‍ය

සීමාසහිත ලංකා පොහොර සමාගම ශ්‍රී ලංකාවේ ස්ථාපනය කරන ලද නිත්‍යවාසි හා සීමිත වගකීම් සහිත සියලුම අයිතීන් ශ්‍රී ලංකා රජය සතු සමාගමකි.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වභාවය

සමාගම ප්‍රධාන ක්‍රියාකාරකම ලෙස වී, තේ, පොල්, රබර් සහ අනෙකුත් අස්වනු සඳහා අවශ්‍ය පොහොර ආනයනය, මිශ්‍ර කිරීම හා අලෙවිකරනය සිදු කරයි.

### 1.3 මූල්‍ය වර්ෂය

සමාගමේ මූල්‍ය වාර්තාකරණ කාල සීමාව මාර්තු 31 දිනෙන් අවසන් වේ.

### 1.4 ලියාපදිංචි කාර්යාලය

සමාගමේ ලියාපදිංචි කාර්යාලය බිෂොප්හීල්, හුණුපිටිය, වත්තල, පිහිටා ඇත.

### 1.5 සේවක සංඛ්‍යාව.

2014 මාර්තු 31 දිනට සමාගමේ සේවක සංඛ්‍යාව 399 කි. (2013-389)

### 1.6 මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමත කිරීම.

2014 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා වර්ෂ 2014 ක් වූ අගොස්තු 28 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවෙන් අනුමැතිය ලබා දී ඇත.

## 2 සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1 පිළියෙල කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලවය. ඓතිහාසික පිරිවැය සංකල්පය පදනම්ව පිළියෙල කර ඇති මෙම මූල්‍ය ප්‍රකාශන වල ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනයෙන් වෙනස් කර ඇත. ශ්‍රී ලංකා මූල්‍යවාර්තා කරන ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමණාකරණයට නිශ්චිත හා තීරණාත්මක වන ගිණුම්කරන ඇස්තමේන්තු භාවිතා කිරීමට සිදුවේ. එසේම ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීමේදී කළමණාකරණයේ මතයන් යොදා ගැනීමද අවශ්‍ය වේ. ඉහළ පරාසයක විමසුමක් හෝ සංකීර්ණතාවයක් හෝ නිගමණයන් ඇස්මේන්තු හා සම්බන්ධ වන විශේෂිත අනාවරණයන් මෙම මූල්‍ය ප්‍රකාශන වල සටහන් 2.26 දක්වා ඇත.

#### 2.1.1 2013 වර්ෂයේදී නිකුත්කර අදාළවූ නව ගිණුම්කරණ ප්‍රමිත වෙනස් කිරීම් සහ පැහැදිලි කිරීම්

ශ්‍රී.ල.නි.ප්‍ර. 19 වෙනස්කිරීම 2013 ජනවාරි 01 දින හෝ පසුව ආරම්භවන ගිණුම්කරණ වර්ෂ සඳහා ශ්‍රී.ල.නි.ප්‍ර. 19 වෙනස්කිරීම් සමාගම විසින් අදාළ කරගෙන ඇත.

**2.1.2 නිකුත් කළනමුත් භාවිතා නොකළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ල.මු.වා.ප්‍ර. ශ්‍රී.ල.ගි.ප්‍ර.)**

a. ශ්‍රී.ල.මු.වා.ප්‍ර. 9 මූල්‍ය උපකරණ : ශ්‍රී.ල.ගි.ප්‍ර. 39 වෙනුවට නිකුත් කරන ලද ශ්‍රී.ල.මු.වා.ප්‍ර. 9 පෙන්නුම්කරන්නේ ශ්‍රී.ල.ගි.ප්‍ර. 39 මූල්‍යවත්කම් හා මූල්‍ය වගකීම් හඳුනාගන්නා ආකාරය වර්ගීකරණය සහ මැනීමයි. මෙම ප්‍රමිතිය 2015 ජනවාරි 01 දින හෝ පසුව ආරම්භවන මූල්‍ය වාර්ථා සඳහා අදාළවේ.

b. ශ්‍රී.ල.මු.වා.ප්‍ර. 12 - අනිකුත් ආයතන සමග ඇති සම්බන්ධතාව හෙළිදරව් කිරීම් : පෙර ශ්‍රී.ල.ගි.ප්‍ර. 27 ශ්‍රී.ල.ගි.ප්‍ර. 28 ශ්‍රී.ල.ගි.ප්‍ර. 31 ඒකාබද්ධ ගිණුම් වාර්තා සඳහා පැවති සියළුම හෙළිදරව් කිරීම් ශ්‍රී.ල.මු.වා.ප්‍ර. 12 ඇතුලත්ව ඇත. මෙම හෙළිදරව් කිරීම් පරිපාලිත සමාගම්, හවුල් පාලනය කිරීම් සහ ආශ්‍රිතයන් සඳහා අදාළවේ. මෙම ප්‍රමිතිය 2014 ජනවාරි 01 දින හෝ පසුව ආරම්භවන මූල්‍ය වාර්තා සඳහා අදාළ වේ.

c. ශ්‍රී.ල.මු.වා.ප්‍ර 13 සාධාරණ අගය මැණීම : සියළුම සාධාරණ වටිනාකම් මැනිම හා හෙළිදරව් කිරීම් සඳහා උපදේශනයක් ලෙස ශ්‍රී.ල.මු.වා.ප්‍ර. 13 ස්ථාපනය කර ඇත. සමාගම විසින් වර්තමානයේදී සමාගම් මූල්‍ය තත්වය හා මූල්‍ය ප්‍රගතියට මෙම ප්‍රමිතියෙන් වන බලපෑම තහවුරු කරමින් සිටියි. මෙම ප්‍රමිතිය 2014 ජනවාරි 01 දින හෝ පසුව ආරම්භවන මූල්‍ය වාර්තා සඳහා අදාළවේ.

**2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම්**

වෙනත් ආකාරයට සඳහන් කර නොමැති අවස්ථාවලදී සමාගම විසින් පෙර මූල්‍ය වර්ෂවලදී අනුගමනය කල ගිණුම්කරණ ප්‍රතිපත්ති ඒ ආකාරයෙන්ම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත මුල් වරට භාවිතා කල මෙම වර්ෂයට අදාළ කරගෙන ඇත. වඩා හොඳ ඉදිරිපත් කිරීමක් හා වර්තමාන වර්ෂය සමඟ සැසදීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී පෙර වර්ෂයේ මූල්‍ය වාර්තා වෙනස් කර ඇත.

**2.3 විදේශ මුදල් ගණුදෙනු**

**2.3.1 මෙහෙයුම් හා ඉදිරිපත්කරන මුදල් ඒකකයන්**

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර, එය සමාගම මෙහෙයුම් කටයුතු සඳහා භාවිතාකරණ ප්‍රධාන මුදල් ඒකකය වේ.

**2.3.2 ගණුදෙනු හා ශේෂයන්**

තත්කාලීනව බලපවත්නා වූ අනුපාතිකය අනුව සියළුම විදේශ විනිමය ගණුදෙනු ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කෙරේ. විදේශ වලංගු මුදල් වලින් දක්වා ඇති මූල්‍ය වත්කම් හා වගකීම් වර්ෂය අවසානයේදී පැවැති විදේශ විනිමය අනුපාතය අනුව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කෙරේ. ඒ අනුව ලබන්නා වූ ලාභය හෝ අලාභය විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ගිණුම්ගත කෙරේ.

මූල්‍ය නොවන වත්කම් හා වගකීම් ඓතිහාසික පිරිවැය මත මණිනු ලබන අතර මුල් ගණුදෙනුව සිදුකල දිනයේදී පැවැති විදේශ විනිමය අනුපාතිකයට අනුව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කෙරේ.

### 2.4.1 දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ පිරිවැය ලෙස මූලික වශයෙන් ගැණුම් පිරිවැය සහ වැඩ කල හැකි හා භාවිතා කල හැකි තැනට, තත්ත්වයට පත් කිරීම සඳහා දරණ වියදම් වල එකතුවෙන් වාර්තා කර ඇත.

සමාගමේ මූල්‍ය තත්වයෙහි දේපල, පිරියත හා උපකරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව වාර්තා කර ඇත. ඉඩම් හා ගොඩනැගිලි හැර අනෙකුත් දේපල, පිරියත හා උපකරණ පිරිවැය අගයෙන් වාර්තා කර ඇත. ඉඩම් හා ගොඩනැගිලි හැර අනෙකුත් දේපල, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය හෝ සමුච්චිත හානිකරණය පිරිවැයෙන් අඩුකොට වාර්තා කර ඇත. 2010 වර්ෂයේ සමාගම ඉඩම් හා ගොඩනැගිලිවල ප්‍රත්‍යගණන අගය ගණනය කොට වත්කමේ සාධාරණ අගයේ සිදුවූ වෙනස්කම් ස්කන්ධ ප්‍රකාශනයට හඳුනාගෙන ඇත.

දේපල, පිරියත හා උපකරණ අලුත් වැඩියාවේදී හා නඩත්තු කිරීමේදී මුල් තක්සේරු ක්‍රියාකාරී ප්‍රමිතියේදී බලාපොරොත්තු වූ ඉදිරි ආර්ථික ප්‍රතිලාභ නැවත ඇති කිරීමට දරණ වියදම් ප්‍රාග්ධනික කරනු ලබන අතර අනෙකුත් වියදම් අදාළ වර්ෂයේදී විස්තිරණ ආදායම් ප්‍රකාශයට ගලපනු ලබයි.

ඉඩම් හැර අනෙකුත් වත්කම් සරළ මාර්ග ක්‍රමයට පිරිවැය හෝ ප්‍රත්‍යාගණන අගය මත වත්කමේ ප්‍රයෝජනවත් ජීවකාලය තුලදී පහත අනුපාතයන්ට ක්ෂය කරනු ලබයි.

| | |
|---|---|
| ගොඩනැගිලි | අවුරුදු 40 |
| යන්ත්‍රාගාර හා උපකරණ | අවුරුදු 05 - 10 දක්වා |
| මෝටර් රථ | අවුරුදු 05 |
| පාපැදි | අවුරුදු 03 |
| කාර්යාලීය ගෘහ භාණ්ඩ | අවුරුදු 03 |
| කාර්යාලීය උපකරණ | අවුරුදු 03 |
| වැඩ පොළ මෙවලම් | අවුරුදු 05 |
| රසායනාගාර උපකරණ | අවුරුදු 03 |
| වෙනත් උපකරණ | අවුරුදු 03 |
| භෝජනාගාර උපකරණ | අවුරුදු 05 |
| පරිඝනක උපාංග | අවුරුදු 03 |

වත්කමක ධාරණ අගය එම වත්කමෙන් නැවත අයකරගත හැකි අගයට වඩා අඩුවන විට ධාරණ අගය නැවත අයකරගත හැකි අගය දක්වා ක්ෂය කරනු ලබයි.

### 2.4.2 අස්පෘශ්‍යය වත්කම්

අත්පත්කර ගන්නා ලද පරිඝනක මෘදුකාංග හා මෙහෙයුම් පද්ධති අත්පත් කර ගැනීමට හා වැඩකර ගත හැකි තත්වයකට පත් කිරීමට දරනු ලබන වියදම් ප්‍රාග්ධනික කර ඇත. අස්පෘශ්‍යය වත්කම් ඒවායේ පිරිවැය අගයෙන් සමුච්චිත ක්‍රමක් ක්ෂය හෝ සමුච්චිත හානිකරණයන් අඩුකොට වාර්තා කර ඇත. මෙම පිරිවැය පහත පරිදි වත්කමේ ඵලදායි ජීවිතකාලය පුරා ක්‍රමක් ක්ෂය කරයි.

| | |
|---|---|
| පරිඝනක මෘදුකාංග | අවුරුදු 03 |

පරිඝනක මෘදුකාංග හා මෙහෙයුම් පද්ධති නඩත්තු කිරීම සඳහා දරණ වියදම් වියදමක් ලෙස හඳුනා ගැනේ.

### 2.4.3 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සෑම වාර්තාකරණ දිනයකදීම වත්කම්, හානිකරණය වීමේ සංඥාවක් ඇත්දැයි සමාගම තක්සේරු කරයි. යම් වත්කමක් සඳහා එවැනි සංඥාවක් ඇත්නම් සමාගම වත්කමෙහි නැවත අයකරගත හැකි අගය ඇස්තමේන්තු කරයි. එකිනෙක වත්කමෙහි

නැවත අයකරගත හැකි අගය ගණනය කිරීම අපහසු අවස්ථා වල සමාගම මුදල් උත්පාදන ඒකකයන් වල නැවත අයකල හැකි අගයන් ගණනය කරනු ලබයි.

වත්කමක නැවත අයකර ගත හැකි අගය එහි සාධාරණ අගයට හෝ වත්කම භාවිතයේ ආර්ථික ප්‍රතිලාභයන්ට වඩා අඩුවන විට වත්කම නැවත අයකරගත හැකි අගය දක්වා ක්ෂය කරනු ලබයි.

වත්කමේ නැවත අයකරගත හැකි අගයට වඩා වත්කමේ සාධාරණ අගය වැඩිවන විට එම වත්කම නැවත අගය කල හැකි වටිනාකම දක්වා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට කපා හරිනු ලබයි.

**2.9 මූල්‍ය වත්කම්**

**2.9.1 සමාගම මූලික හඳුනාගැනීමේදී තම මූල්‍ය වත්කම් පහත පරිදි වර්ගීකරණය කරයි.**

අ) කල්පිරීම තෙක් පවත්වා ගන්නා මූල්‍ය වත්කම්
ආ) ණය සහ ලැබිය යුතු දෑ

**අ) කල්පිරීම තෙක් පවත්වා ගන්නා මූල්‍ය වත්කම්**

සමාගම විසින් කල්පිරීම තෙක් රඳවා තබා ගැනීමේ අභිප්‍රායෙන් හා හැකියාවෙන් යුක්තව තබාගෙන ඇති නිශ්චිත හෝ ස්ථිර වූ ගෙවුම්වලින් සමන්විත ව්‍යුත්පන්න කල නොහැකි මූල්‍ය වත්කම් මේ නමින් හැඳින්වේ. කල්පිරීම තෙක් පවත්වා ගන්නා මූල්‍ය වත්කම් ජංගම වත්කම් යටතේ වර්ග කර ඇත.

**(ආ) ණය හා ලැබිය යුතු දෑ**

ව්‍යුත්පන්න කල නොහැකි මූල්‍ය වත්කම් වන ණය හා ලැබිය යුතු දෑ උපලබ්ධි වීමට නියමිත තක්සේරු කල වටිනාකම මත පදනම්ව වාර්තා කර ඇත. ජංගම නොවන වත්කම් යටතේ දක්වා ඇති වාර්තා කරන දිනයේ සිට මාස 12 කට පසු උපලබ්ධි වීමට නියමිත ණය සහ ලැබිය යුතු දෑ හැර අනෙකුත් ණය හා ලැබිය යුතු දෑ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. සමාගමේ ණය හා ලැබිය යුතු දෑ, ලැබිය යුතු සහනාධාර, වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ ප්‍රතිමිළදී ගන්නා රාජ්‍ය බැඳුම්කර, ස්ථාවර තැන්පතු, පෙර ගෙවීම්, අත්තිකාරම්, තැන්පතු, සේවක ණය සහ වාර්තාකරණ දිනට මුදල් හා මුදල් සමාන දෑ වලින් සමන්විත වේ.

**2.9.2 හඳුනාගැනීම හා මූලික මැණීම්**

සමාගමේ ණය හා ලැබිය යුතු දෑ සහ තැන්පතු ඒවා ඇති වූ දිනට මූලික වශයෙන් හඳුනාගනු ලැබේ. අනෙකුත් මූල්‍ය වත්කම් මුල්වරට හඳුනාගැනීමේදී වෙළඳාම් සිදුවූ දිනට එනම්, සමාගම මූල්‍ය උපකරණයන්හි ගිවිසුම්ගත බැඳීමේ පාර්ශවයන් බවට පත් වූ දිනට හඳුනාගත යුතු මූල්‍ය වත්කමක් වශයෙන් අගය කරනුයේ සාධාරණ අගයට ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගය යන වර්ගීකරණයට අයත් නොවන්නා වූ අයිතමයන්ට අදාළ අත්පත් කර ගැනීමට හෝ නිකුත් කිරීමට අදාළ කරගත හැකි ගණුදෙනුවල පිරිවැයට එකතු කල අගයයි.

සමාගම විසින් එහි මූල්‍ය වත්කම් හඳුනා ගැනීම නවතා දමනුයේ මූල්‍ය වත්කම් තුළින් මුදල් ලැබීමට ඇති ගිවිසුම්ගත බැඳීම කල්පිරීමකදී හෝ එම මූල්‍ය වත්කම්වලට අදාළ සියලු අවධානම් හා ප්‍රතිලාභයන් වෙනත් පාර්ශවයක් වෙත පරිවත්‍ය කරන අවස්ථාවකදී ය.

### 2.9.3 පසුකාලීන මැනීම්

#### (අ) කල්පිරීම තෙක් පවත්වා ගන්නා මූල්‍ය වත්කම්

කල්පිරීම තෙක් පවත්වා ගන්නා මූල්‍ය වත්කම් සඵල පොළී අනුපාතිකය භාවිතා කර ක්‍රමක් ක්ෂය වූ පිරිවැයෙන් හානිකරණයත් අඩුකල පසු අගයට අගය කරනු ලැබේ. අත්පත් කර ගැනීමේ වත්කම් හෝ අධිභාරයන් සහ ගණුදෙනු පිරිවැය මූල්‍ය වත්කමේ ක්‍රමක් ක්ෂය පිරිවැය ගණනයේදී සලකා බලයි.

#### (ආ) ණය හා ලැබිය යුතු දෑ

මුල් වරට අගය කිරීමෙන් පසුව ණය හා අනෙකුත් ලැබිය යුතු දෑ සඵල පොළී අනුපාතිකය භාවිතා කර ක්‍රමක් ක්ෂය වූ පිරිවැයෙන් හානි කරණයන් අඩුකල පසු අගයට වාර්තා කරයි.

### 2.9.4 මූල්‍ය වත්කම් හානිකරණය

#### ක්‍රමක් ක්ෂය පිරිවැයට පවත්වාගෙන යනු ලබන වත්කම්

සමාගම සෑම ගිණුම් කාල පරිච්ඡේදයක් අවසානයේදී තම මූල්‍ය වත්කම් හානිකරණයට ලක්වී ඇති බවට සාක්ෂි තිබේද නැද්ද යන්න පිළිබඳව විමසා බැලිය යුතුය. මූල්‍ය වත්කමක් හානිකරණය කිරීම සහ එම හානිකරණ අලාභය දැරිය යුත්තේ මුල්වරට හදුනාගැනිමෙන් පසුව ඇති වූ එක් හේතුවක් (සිදුවීමක්) හෝ හේතු කිහිපයක් නිසා වූ බවට සාක්ෂි ඇත්නම් පමණක් හා එම අලාභ සිදුවීමෙන් අනාගත මූලය ප්‍රවාහයන් මත ඇති වන්නා වූ බලපෑම විශ්වාසනීය ලෙස ආගණනය කල හැකිනම් පමණි.

ක්‍රමක් ක්ෂය වූ පිරිවැය මත පවත්වාගෙන යනු ලබන ණය සහ ලැබිය යුතු දෑ වල හානිකරණ අලාභ හඳුනාගත යුත්තේ වත්කම් පවත්වාගෙන යන අගය හා එම වත්කමේ අනාගත මුදල් ප්‍රවාහයන් සඵලදායි පොළි අනුපාතය මත වට්ටම් කල පසු අතර ඇති වෙනසයි. (අනාගත මුදල් ප්‍රවාහයන් සැලකීමේදී දරණු නොලබන අනාගත අපේක්ෂිත අලාභ ඉවත් කරයි.) වත්කමේ පවත්වාගෙන යනු ලබන අගය හා කපා හල යුතු අගය අතර අලාභය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සඳහා හඳුනාගත යුතුය.

යම් හෙයකින් පසු කාල පරිච්ඡේදයේදී හානිකරණ අලාභය අඩු වුවහොත් එම අඩුවීම හානිකරණය හඳුනාගත් ගැනීමෙන් පසු ඇති වූ කිසියම් සිදුවීමකට අදාල කළ හැකි නම් පමණක් කලින් හඳුනාගත් හානිකරණ අලාභය ප්‍රත්‍යාවර්ථනය කල හැකිය.

### 2.10 තොගය

තොගය (සෘජු හා මිශ්‍ර පොහොර) පිරිවැය අගයෙන් සහනාධාර අඩු කර දක්වා ඇත. පිරිවැය ගණනය කරනු ලබන්නේ පළමු ලබාගත් තොග පළමු බැහැර කිරීමේ ක්‍රමයටය. මිශ්‍ර පොහොර තොග පිරිවැය අමුද්‍රව්‍ය, සෘජු වේතන, අනෙකුත් සෘජු පිරිවැයන් හා නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයන්ගෙන් සමන්විත වේ. දේශීයව මිළදී ගත් පොහොර පිරිවැයට වාර්තා කර ඇත. සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී විකිණීමට බලාපොරොත්තු වන මිළෙන් එයට අදාළ වියදම් අඩුකිරීමෙන් ශුද්ධ උපලබ්ධි අගය ගණනය කර තිබේ.

පාරිභෝගික ද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය ඊට අදාළ පිරිවැය යටතේ දක්වා ඇත.

### 2.11 වෙළඳ ලැබිය යුතු දෑ

සාමාන්‍ය ව්‍යාපාර චක්‍රය තුලදී භාණ්ඩ විකිණීමෙන් ලැබිය යුතු මුදල් වෙළඳ ලැබිය යුතු දෑ වේ. ණය එකතු කිරීම සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාවලිය තුලදී බලාපොරොත්තු වන අතර, ඒවා ජංගම වත්කම් ලෙස වර්ග කර ඇත. පළමු හඳුනාගැනිමේදී වෙළඳ ලැබිය යුතු ඉන්වොයිස් වටිනාකම වන සාධාරණ අගයට හඳුනාගැනේ. පසුව ඉන්වොයිස් අගයෙන් හානිකරණයන් අඩුකිරීමෙන් හඳුනාගැනේ.

සමාගම සෑම ගිණුම්කාල පරිච්ඡේදයක් අවසානයේදීම තම වෙළෙඳ ලැබිය යුතු දෑ හානිකරණයට ලක් වී තිබේද නැද්ද යන්න පිළිබඳ විමසා බලයි. සමාගමේ ණය එකතු කිරීම පිළිබඳ අතීත පලපුරුද්ද, ගෙවීම් ප්‍රමාණ වීමේ දින ගණන උපරිමය දින 90 ට වැඩිවීම යනාදිය හානිකරණය ගණනයේදී සලකා බලයි. වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය හා එම හානිකරණ අලාභය දැරිය යුත්තේ එම හානිකරණය පිළිබඳ සාක්ෂි ඇත්නම් පමණි. සියලුම වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය සඳහා තනි තනිව සලකා බලයි.

වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය නිර්ණය කිරීමේ පදනම හා ආකෘතිය පහත පරිදි වේ.

තනි තනිව ඇගයීමේ ක්‍රමය ට හානිකරණය ගණනය කිරීම සඳහා පහත දැක්වෙන වෙළඳ ලැබිය යුතු දෑ තනි තනිව ආගණනය කර ඇත.

i) විවිධ සේවා සමුපකාර සමිති
ii) ගොවිජන සේවා මධ්‍යස්ථාන
iii) බලයලත් නියෝජිතයන්
iv) රාජ්‍ය හා ආයතන හා දෙපාර්තමේන්තු

### 2.12 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේදී අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු, අනෙකුත් මාස 03 අඩු කාලයකින් කල් පිරෙන ඉහළ ද්‍රවශීලතාවයකින් යුත් ආයෝජන, මුදල් හා මුදල් සමාන දෑ ලෙස වර්ගීකරණය කෙරේ.

### 2.13 ප්‍රකාශිත ප්‍රාග්ධනය

ශ්‍රී ලංකා රජයට නිකුත් කරන ලද සාමාන්‍ය කොටස් හිමිකම ලෙස වර්ගීකරණය කරයි.

### 2.14 මූල්‍ය වත්කම්

සමාගම මූල්‍ය වගකීම් අනෙකුත් මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත. සමාගමේ අනෙකුත් මූල්‍ය වගකීම් ලෙස ණය, වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ සහ බැංකු අයිරා ඇතුලත් වේ. අනෙකුත් මූල්‍ය වගකීම් මූලිකවම සෘජුව වෙන්කර හැකි අනෙකුත් වියදම් සමග සාධාරණ අගයට හඳුනා ගනී. පසුව සඵල පොළී අනුපාතිකය භාවිතා කරමින් හානිකරණ පිරිවැය මත පදනම්ව හඳුනාගනී. සමාගම ගිවිසුම්ප්‍රකාර බැඳීම් ඉවත් කිරීමේදී, අවලංගු කිරීමකදී හෝ කල් ඉකුත්වීමකදී මූල්‍ය වගකීම් හඳුනාගැනීම නවතා දමයි.

### 2.15 වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ

සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී භාණ්ඩ හා සේවා අත්පත් කර ගැනීම නිසා ඒවාට ගෙවීමට ඇති වූ බැදියාව වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ලෙස වර්ග කරයි. ව්‍යාපාරයේ සාමාන්‍ය කටයුතුවලින් පැන නැගී වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරයි.

වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ මූලිකව ඒවායේ ගණුදෙනු වටිනාකම වන සාධාරණ අගයට හදුනා ගනී. පසුව මුදලෙහි කාලීන වටිනාකම වැදගත් නොවන විට සහ කෙටිකාලීනව ගෙවීමට බලාපොරොත්තු වන විට ඒවායේ නියමිත ඉන්වොයිස් වටිනාකමට හඳුනා ගනී.

**2.16 ණය ගැණුම්**

ණය ගැණුම් මුලිකව වාර්තා කල ශුද්ධ ගණුදෙනු වටිනාකමට, සාධාරණ අගයට හඳුනා ගනි. පසුව සඵල පොලී අනුපාතිකය භාවිතා කරමින් ක්‍රමක් ක්ෂය වු වටිනාකමට හඳුනාගනි.

**2.17 ණය ගැණුම් පිරිවැය**

ණය ගැණුම් පිරිවැය ඒවා වාර්තා කල කාල පරිච්ඡේදයේදී විස්තිරණ ආදායමේ ප්‍රකාශයට හඳුනාගනි.

**2.18 රාජ්‍ය ප්‍රදාන**

රාජ්‍ය ප්‍රදානයන් ලැබෙන බවට සෑහීමකට පත්විය හැකි තහවුරුවක් ලැබීමත්, සමාගම විසින් අදාළ කොන්දේසි සපුරන්නේ නම් රාජ්‍ය ප්‍රදාන ඒවායේ සාධාරණ අගයට හඳුනා ගනි.

ආනයන වියදම් පියවීම සඳහා ලැබෙන සහනාධාරවලට අදාළ වියදම් එම වියදම දරනු ලබන්නා වු කාල පරිච්ඡේදයේදී විස්තිරණ ආදායම් ප්‍රකාශයට හඳුනා ගැනේ. දැනටමත් දරා ඇති ආනයන වියදම් සඳහා ලැබෙන සහනාධාර ඒවා ලැබීම පිළිබද සෑහීමකට පත්විය හැකි තහවුරුවක් ලැබේ නම් ලැබිය යුතු සහනාධාර ලෙස හදුනා ගැනේ.

දේපල, පිරියත හා උපකරණ සඳහා ලැබුනු රාජ්‍ය ප්‍රදාන විලම්භිත රාජ්‍ය ප්‍රදාන ලෙස ජංගම නොවන වගකිම්වලට ඇතුළත් කර ඇත. ඒවා වත්කමේ අපේක්ෂිත ආයු කාලය තුල සරළ මාර්ග ක්‍රමයට විස්තිරණ ආදායම් ප්‍රකාශයට හදුනා ගනි.

**2.19 වර්තමාන හා විලම්භිත බදු**

කාල පරිච්ඡේදය සඳහා අදාළ බදු වියදම වර්තමාන බදු වියදම හා විලම්භිත බදු වියදමෙන් සමන්විත වේ. බදු වියදම විස්තිරණ අදායම් ප්‍රකාශයට හදුනාගනු ලබන්නේ ඒවා අනෙකුත් විස්තිරණ අදායම් ප්‍රකාශයේ අයිතමයන් ලෙස හඳුනාගත් ප්‍රමාණය දක්වා පමණි.

වර්තමාන වසර සඳහා ආදායම් බදු වගකීම දේශීය ආදායම් පනතේ විධි විධානයන්ට අනුකූලව ආදායම් බදු අධිකාරිය වෙත ගෙවීමට අපේක්ෂිත ප්‍රමාණය දක්වා හඳුනාග නු ලැබේ.

මූල්‍ය වාර්තාවල වත්කම් හා වගකිම් වල ධාරණ අගයේ සහ බදු පදනම අනුව වත්කම් හා වගකීම් වල ධාරණ අගයේ ඇති වෙනස්වීම් මත විලම්භීත ආදායම් බදු හදුනාග ැනේ.

බදු සඳහා හදුනාගත් සියලුම තාවකාලික වෙනස්වීම් මත විලම්භීත ආදායම් බදු වගකීම හඳුන්වාදී ඇත. එසේ නොවන්නේ ව්‍යාපාර සංයෝජනයක් නොවන ගණුදෙනුවකදී හා ගණුදෙනුව කරන අවස්ථාවේදී ගිණුම්කරන ලාභයට හෝ බද්ධට යටත් ලාභයට හෝ පාඩුවට බලනොපාන මූලිකව වත්කමක් හෝ වගකීමක් හෝ විමලම්භීත බදු වගකීම සිදුවන අවස්ථාවේදී ය.

වත්කමේ උපලබ්ධි වූ විට හෝ වගකීමෙන් නිදහස් වූ විට ඒකී වසර සඳහා බලපැවැත්වෙන්නා වූ බදු අනුපාතය පදනම් කරගෙන හා ප්‍රඥප්ති කල හෝ පසුව මූල්‍ය තත්ව ප්‍රකාශන දිනය වන විට බලපැවැත්වෙන බදු නීති මත විලම්භීත ආදායම් බමු වගකීම හෝ වත්කම හඳුනා ගනි.

ප්‍රවර්ථන ආදායම් බදු වගකීම්වලට එරෙහිව ප්‍රවර්ථන බදු වත්කම් හිලව් කිරීමට නෛතිකව පැණ වු අයිතියක් ඇත්නම් ද විලම්භිත ආදායම් බදු එකම අඩු බදු

අයකරන ඒකකයට හෝ එකම බදු අධිකාරියකට සම්බන්ධ නම්ද විලම්භිත ආදායම් බදු වත්කම් හා විලම්භිත ආදායම් බදු වගකීම් හිලව් කරනු ලැබේ.

**2.20 සේවක ප්‍රතිලාභ**

**(අ) නිශ්චිත දායකත්ව සැලසුම්**

නිශ්චිත දායකත්ව සැලසුම් පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුමක් වන අතර, සමාගම විසින් ස්ථාවර දායකත්වයක් වෙනත් ආයතනයකට ඒ වෙනුවෙන් සපයයි. සමාගමට මෙම දායකත්වයන් සම්බන්ධයෙන් හා ඒවා ගෙවීම සම්බන්ධයෙන් තවදුරටත් නීතිමය හෝ වෙනත් ආකාරයක බැඳීමක් නොමැත.

සමාගම සේවක භාරකාර අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙනුවෙන් පිළිවෙලින් 15% හා 3% ප්‍රමාණයන් සේවක දළ වැටුපට අනුව ගෙවයි.

**(ආ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්**

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් යනු පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුමකි. නිශ්චිත දායකත්ව සැලසුම් ගණයට අයත් නොවන මූල්‍ය තත්ව ප්‍රකාශ දිනට මූල්‍ය ප්‍රකාශයන් තුළ නිශ්චිත ප්‍රතිලාභ සම්බන්ධයෙන් දක්වා ඇති වගකීම් හඳුනාගෙන ඇත්තේ එම නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වගකීමෙහි වර්තමාන අගයයි. මූල්‍ය තත්ව ප්‍රකාශ දිනට නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වගකීම සුදුසුකම්ලත් ජීවගණනවරයෙකු ලවා පුරෝකතනය කරන ලද ඒකක බැර ක්‍රමය භාවිතා කරමින් තක්සේරු කල ඇත්තේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරන ප්‍රමිත අංක 19 සේවක ප්‍රතිලාභයන්හි විධිවිධාන වල අන්තර්ගත වන පරිදිය.

ජීව ගණන තක්සේරු ක්‍රමය තුළ වට්ටම් අනුපාතිකය සම්බන්ධව සිදුකරන උපකල්පනයන් සේවක වැටුප් වර්ධක අනුපාතිකයන් හා සේවකයන්ගේ ඉතිරි සේවා කාලය යන දෑ අන්තර්ගත වේ. මෙම සැලසුමෙහි පවන්නා දිගු කාලීන ස්වභාවය හේතු කොටගෙන තක්සේරු අගයන් තුල සැලකිය යුතු අවිනිශ්චිත තාවයන් අන්තර්ගත වන අතරඒවා වාර්තා වූ කාල පරිච්ඡේදයේ විස්තිරන ආදායම් ප්‍රකාශයට හඳුනා ගැනේ.

එම වගකීම බාහිරව ආයෝජනය කර නොමැත.

**(ඇ) කෙටි කාලීන සේවක ප්‍රතිලාභ**

සේවකයන් විසින් සපයනු ලබන සේවයට ගෙවීමට බලාපොරොත්තු වන වටිනාකම වට්ටම් නොකර වාර්තා කරයි.

**2.21 වෙන් කිරීම් හා අසම්භාව්‍ය වගකීම්**

පසුගිය සිද්ධීන් නිසා ආර්ථික ප්‍රතිලාභ ගලායාමක් හා එම ප්‍රමාණය ගැන සෑහීමට පත් විය හැකි ආකාරයෙන් ගණනය කල හැකි විට එම වගකීම පියවීම සඳහා නීතිමය හෝ වෙනත් ආකාරයක බැඳීමක් ඇත්නම් ඒවා මෙහෙයුම් වියදම් ලෙස හඳුනා ගැනේ.

වාර්තාකරන දිනයේදී වෙන් කිරීමක් පියවීම සඳහා ඇති වර්තමාන බැඳීම නිවැරදිව සෑහීමට පත්විය සාධක මත පදනම්ව අවධානම හා අසම්භාවයතාවයන් ඇතුලත්ව වෙන්කිරීම හඳුනා ගැනේ.

සියළුම අසම්භාව්‍ය වගකීම් මූල්‍ය වාර්තා සඳහා වන සටහන් තුල දක්වා වාර්කා කර ඇති අතර ඒවා පියවීම සඳහා අවශ්‍ය වන ආර්ථික ප්‍රතිලාභයන් හෝ ප්‍රමාණය නිශ්චිත හෝ විශ්වාසදායක ලෙස මැන දැක්වීමක් කල නොහැකි අසම්භාව්‍ය වගකීම් මූල්‍ය වාර්තා තුල හඳුනා නොගන්නා අතර හෙළි දරව් කිරීමක් පමණක් සිදු කරනු ලැබේ.

**2.22 ආදායම් හඳුනාගැනීම්**

ලැබිය යුතු හා ලැබුණු සහනාධාර වටිනාකම සහ භාණ්ඩ විකිණීමෙන් පෙන්නුම් කරන ලැබිය යුතු ප්‍රමාණයන්ය. එකතු කල අගය මත බද්ද (එ.අ.බ.) හා ජාතිය ගොඩනැගීමේ බද්ද (ජ.ගො.බ) අඩු කිරීමෙන් ආදායම් හඳුනා ගනී. අනාගත ආර්ථික ප්‍රතිලාභයන්ගේ ප්‍රමාණය නිශ්චිත හෝ විශ්වාස දායක ලෙස මැන දැක්වීමක් කල හැකි වීම සාමාගම ආදායම හදුනා ගනී.

ආදායම හඳුනා ගැනීමේ ප්‍රධාන ආකාරයන් පහත පරිදි වේ.

(අ) පොහොර විකිණීම

සමාගම සෘජු සහ මිශ්‍ර පොහොර ආනයනය කර තොග හා සිල්ලර වශයෙන් විකිණීම කරයි. භාණ්ඩ සම්බන්ධ ප්‍රධාන අවධානම් සහා ප්‍රතිලාභ පාරිභෝග කයාට මාරුවන අවස්ථාවේදී එනම්, ගබඩාවෙන් භාණ්ඩ නිකුත් කරනු ලබන අවස්ථාවේදී ආදායම හඳුනා ගනී.

(ආ) පොළී ආදායම

සඵල පොළී අනුපාතිකය භාවිතා කර පොළී ආදායම හඳුනාගනී.

(ඇ) කුළී ආදායම

කල්බදු ගිවිසුමට අනුව උපචිත පදනමට කුළී ආදයම හඳුනා ගනී.

(ඈ) දේපල, පිරියත හා උපකරණ ඉවත් කිරීමේ ලාභ හා පාඩු

දේපල, පිරියත හා උපකරණ වල ධාරණ අගයන් ඉවත් කිරීමෙන් ලැබෙන වටිනාකමත් සංසන්දනය කර විස්තිරණ ආදායම් ප්‍රකාශයට ලාභය හෝ පාඩුව හඳුනා ගනී.

(ඉ) අනෙකුක් ආදායම්

අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

**2.23 වියදම්**

වාර්තා කරණ කාල පරිච්ඡේදයේ ලාභය ගණනය කිරීමේදී මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා දායක වු සියලුම වියදම සලකා බලයි.

**2.24 ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්**

ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවු සියලුම වැදගත් සිද්ධීන් සලකා බලා අවශ්‍ය අවස්ථාවල කරන ලද ගැලපීම් හෝ අනාවරණයක් මෙම ප්‍රකාශන සදහා වන සටහන් වල දක්වා ඇත.

**2.25 වගකීම්**

වාර්තාකරණ දිනය මූල්‍ය ප්‍රකාශවල හදුනාගත යුතු හා ගැලපිය යුතු සියලුම වගකීම් මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන් තුල දක්වා ඇත.

**2.26 වැදගත් ගිණුම්කරණ ඇස්මේන්තු හා උපකල්පනයන්**

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකාරිත්වය විසින් වත්කම්, වගකීම්, ආදායම්, වියදම් මැනීම සඳහා පවතින තොරතුරු විනිශ්චය කිරීම, ඇස්තමේන්තු සකස් කිරීම සහ උපකල්පනයන් සිදු කරයි.

2.26.1 පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුගමනය කිරීමේදී විශේෂ විනිශ්චයන් කරනු ලබන අතර ඒවා මූල්‍ය වාර්තා වලට විශේෂිත බලපෑමක් ඇති කරයි.

**(අ) විලම්භිත බදු වත්කම් හඳුනා ගැනීම**

විලම්භිත බදු වත්කම් භාවිතා කල හැකි අනාගත බදුවන ආදායමේ තක්සේරුව මත විලම්භීත බදු වත්කම් ප්‍රමාණය තීරණය වේ.

2.26.2 වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් හඳුනා ගැනීමේදී සහ මැණීමේදී විශේෂිත බලපෑමක් කරන ඇස්මේන්තු සහ නිගමනයන් පහත පරිදි වේ.

**(අ) ක්ෂය කල හැකි වත්කම් ඵලදායි ජීව කාලය**

අපේක්ෂිත භාවිතිය මත කලමනාකාරිත්වය විසින් සෑම වාර්තාකරණ දිනයකටම ක්ෂය කලහැකි වත්කම් වල ඵලදායි ජීවකාලය පිළිබඳව වන ඇස්මේන්තු නැවත විමසා බලයි. තාක්ෂණික යල්පැනීන් හේතු කොටගෙන ඇස්මේන්තු වල සිදුවන අවිනිශ්චිත තාවයන් නිසා මෘදුකාංග සහ තොරතුරු තාක්ෂණ උපකරණ වල ඵලදායි ජීවකාලය පිළිබඳ වෙනස් වීම් සිදුවිය හැක.

(ආ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම

ආයු ගණක පදනම මත භාවිතා කල සාධක රාශියකගේ නියමනයන් මත නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වල වර්තමාන අගය රදා පවති. මෙම උපකල්පනයන් සහ වට්ටම් අනුපාතය භාවිතා කරමින් ශුද්ධ පිරිවැය හා බැදීම තිරණය කරයි. නිගමනයන්ගේ වෙනස්වීම් මත ඇති වන බලපෑම නිශ්චිත ප්‍රතිලාභ බැදීමෙහි ධාරණ අගයට ගලපනු ලැබේ.

සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි

| 3 | අයභාරය | | 2014 මාර්තු | 2013 |
|---|---|---|---|---|
| | දළ පිරිවැටුම | | 2,585,461,395 | 2,472,787,219 |
| | අඩුකලා : ජාතිය ගොඩනැගීමේ බදු | | (21,911,668) | (22,654,403) |
| | | | **2,563,549,727** | **2,450,132,816** |

| 4 | **විකුණුම් පිරිවැය** | | | |
|---|---|---|---|---|
| | ගැණුම් | (සටහන 4.1) | 1,640,562,990 | 998,919,088 |
| | සැපුපු වියදම | (සටහන 4.2) | 414,275,191 | 613,400,995 |
| | **නිෂ්පාදන පිරිවැය** | | **2,054,838,180** | **1,612,320,083** |
| | අප්‍රේල් 01 දිනට නිමි තොගය | | 287,058,889 | 503,187,525 |
| | මාර්තු 31 දිනට නිමි තොගය | | (353,814,803) | (287,058,889) |
| | | | **1,988,082,266** | **1,828,448,719** |

| **4.1 ගැණුම්** | | |
|---|---|---|
| ආයනික පොහොර නීතිගත කල වටිනිකම | 14,332,252,236 | 17,082,884,609 |
| රක්ෂණය | 15,876,076 | 26,793,573 |
| තීරුබදු හා තීරුබදු අධිභාරය | 5,438 | - |
| වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු | 750,198,629 | 856,507,229 |
| නිෂ්කාශන වියදම් | 4,746,029 | 3,545,915 |
| ගොඩබෑමේ ගාස්තු | 23,619,226 | 21,965,965 |
| නැව්භාණ්ඩ පරිහරණ ගාස්තු | 187,222,746 | 149,293,323 |
| විවිධ වියදම් (රේගුව) | 1,952,532 | 6,570,313 |
| විවිධ වියදම් (ශ්‍රී ලංකා වරාය අධිකාරිය) | 3,313,565 | 5,597,771 |
| ප්‍රමාද ගාස්තු | - | (3,486,307) |
| නියදි පරීක්ෂණ ගාස්තු | 3,387,564 | 8,882,769 |
| ප්‍රවාහන හා පරිහරණ ගාස්තු | 250,874,144 | 234,828,726 |
| ණයවර ලිපි ගාස්තු | 108,180,105 | 81,139,101 |
| බැංකු ගාස්තු | 795,721 | 717,765 |
| දේශිය ගැණුම් | 47,570,780 | 34,872,760 |
| ඇසුරුම් ද්‍රව්‍ය | 31,281,046 | 32,849,735 |
| තොගභාර ඇප සඳහා ගාස්තු | 3,146,493 | (841,978) |
| විනිමය හුවමාරු වාසි /අලාභ | (3,057,911) | 103,521,575 |
| | 15,761,364,419 | 18,645,642,845 |
| සහනාධාර ඉල්ලීම | (14,120,801,429) | (17,646,723,758) |
| | **1,640,562,990** | **998,919,087** |

| **4.2 සැපුපු වියදම** | | |
|---|---|---|
| මිශ්‍රණ වියදම් | 11,743,015 | 2,043,731 |
| නිශ්චල තොග සඳහා වෙන් කිරීම | (31,606) | 1,400,455 |
| මෙහෙයුම වියදම් | 132,712,261 | 145,526,802 |
| සේවක කුලී වියදම් | 27,120,902 | 24,934,854 |
| දි.පො.ග වලට ප්‍රවාහනවියදම් | 374,143,309 | 447,193,066 |
| වෙළඳ තොග අතිරික්ත හිගය | (194,186) | (1,185,473) |
| තොගය මාරු කිරීම ගැළපීම | (131,218,504) | (6,512,439) |
| | **414,275,191** | **613,400,996** |

වරහන් තුල අගයන් වලින් අඩු කිරීම් පෙන්නුම් කෙරේ
මූල්‍ය ප්‍රකාශණවලට අදාල සටහන් ඉදිරි පිටුව හා සම්බන්ධිතයි

සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි

| 5 | අනෙකුත් මෙහෙයුම් ආදායම් | 2014 මාර්තු | 2013 |
|---|---|---|---|
| | පමා කුලී ආදායම් | - | 3,761,371 |
| | දඩ මුදල් ආදායම් | 1,559,996 | 2,217,531 |
| | දඩ මුදල් ආදායම් ආනයන | 173,280 | 523,217 |
| | සංචාරක බංගලාව ආදායම් (පොළොන්නරුව) | 1,210,601 | 311,250 |
| | උද්‍යානයෙන් ඉපයීම | 14,480 | 32,770 |
| | කඩිනම් නිශ්කාෂණ කිරීමේ ආදායම | 57,857,011 | 84,837,552 |
| | පොලිතින් හි පොහොර මලු විකිණීමේ ආදායම | 7,662,198 | 8,155,080 |
| | ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු ආදායම | 1,148,725 | 708,400 |
